සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* (2009.10.30) VI කොටසේ 2008.07.01 දින සිට 2009.06.30 දින දක්වා කොළඹ මහාධිකරණයේ ජූරි සභිකයන්ගේ නාමාවලිය පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,626 - 2009 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා - 2009.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1694 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1694 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1695 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1695 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- (i) ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2009 මැයි 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) රෝහිත අබේගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පත 2009 ජූනි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 නොවැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ඔක්තෝබර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 323

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරිය පත් කිරීම සහ ශාඛාවට ඇතුළත් කිරීම

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ශ්‍රී ලංකා ස්වේච්චා ගුවන් හමුදාවේ තාවකාලික ස්කොඩ්‍රන් ලීඩර් නිලයට, ප්ලයිට් ලෙප්ටිනන්ට් නිළයට හා ප්ලියිට් ඔපිසර් නිළයට පත් කිරීම සහ එම දිනයේ සිට නමට ඉදිරියෙන් දක්වා ඇති ශාඛාවට ඇතුළත් කිරීම අනුමත කිරීමට ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත ඃ

| *නිළය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* | *දිනය* |
|---|---|---|---|
| තාවකාලික ස්කොඩ්‍රන් ලීඩර් | වලිමුණි කුමුදු මැන්දිස් වීරසේකර (වි/0509) | දන්ත වෛද්‍ය | 2007 ජූලි මස 19 |
| ප්ලයිට් ලෙප්ටිනන්ට් | නුවන් නිරංජය අබේසිංහ (වි/0506) | කාර්මික ඉංජිනේරු | 2007 ජනවාරි 19 |
| ප්ලයිට් ලෙප්ටිනන්ට් | චමින්ද සම්පත් දෙගම්බඩ (වි/0507) | කාර්මික ඉංජිනේරු | 2007 ජනවාරි මස 19 |
| ප්ලයිට් ලෙප්ටිනන්ට් | මනනගේ දර්ශන අතපත්තු (වි/0508) | ගුවන් තොටුපල නිර්මාණ ශිල්පී | 2007 ජනවාරි මස 19 |
| පයිලට් ඔෆිසර් | තුවාන් සමීර් සෙයිනෝ (වි/0510) | පරිපලාන අධ්‍යක්ෂ | 2007 ජූලි මස 19 |

අතිගරු ජනාධිපතිඋතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

10-966

# වෙනත් පත්කිරීම් ආදිය

2009 අංක 324

**නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1990 දෙසැම්බර් මස 07 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලද 1990 අංක 46 දරන කර්මාන්ත සංවර්ධන පනතේ 1 වැනි උපලේඛනයේ සඳහන් (1978 අංක 04 දරන ම. කො. ආ. කො. රීති යටතට ගැනෙන ප්‍රදේශීය ව්‍යාපාර හා බලයලත් ව්‍යාපාර හැර) ශ්‍රී ලංකා කර්මාන්ත ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු සඳහා එම පනතේ 27 වැනි වගන්තියේ I වැනි උප වගන්තිය ප්‍රකාරව කර්මාන්ත රෙජිස්ට්‍රාර් ලෙස කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සංවර්ධන තනතුරේ රාජකාරී ඉටු කරන අසිත කුමාර සෙනෙවිරත්න මහතා මෙයින් පත් කරමි.

ආර්. වී. ඩී. පියතිලක,
ලේකම්,
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.

2009 ඔක්තෝබර් මස 08 වැනි දින,
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

10-1027

# රජයේ නිවේදන

**ලංකා දුම්රිය සුහසාධක සංගම් ආඥාපනත**

(285 වැනි අධිකාරය වූ) ලංකා දුම්රිය සුහසාධක සංගම් ආඥාපනතේ 15 වැනි වගන්තිය යටතේ, දුම්රිය සුහසාධක සංගමය විසින් සාදනු ලැබ, ඒ වගන්තිය යටතේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ රීති.

ලේකම්,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

2009 ඔක්තෝබර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

රීති

1932 පෙබරවාරි මස 12 වැනි දින අංක 7906 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින් කල සංශෝධිත රීති පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

**ව්‍යවස්ථා සංශෝධන**

01. 07 වැනි රීතියේ (1) ඡේදය අනුව දැනට රු. 25 ක් වන සාමාජිකයින්ගේ මුදල 07 වැනි රීතියෙහි (1ඒ) ඡේදයට ඇතුළත් කිරීම.

02. 24 වැනි රීතියෙහි, 03 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් 2008.03.18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඡන්ද බලයෙන් පත් වන සභාපතිතුමාට රු. 6000 ක දීමනාවක් ලැබිය යුතු වන අතර, එය එක් එක් වර්ෂයේ පවත්වනු ලබන වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමැතියට භාජනය විය යුතු යි. නිළ බලයෙන් පත්වන කාරක සභිකයින් ද, ලේකම් හා භාණ්ඩාගාරික ඇතුළු පාලන කමිටුවේ සාමාජිකයින්ට තමන් පැමිණි සෑම කාරක සභා රැස්වීමක් සඳහාම එක් අයෙකුට රු. 300 බැගින් වූ දීමානාවක් ද ගෙවනු ලැබිය යුතු ය.

03. 33 වැනි රීතිය පහත දැක්වෙන පරිදි සංශෝධනය විය යුතුය :

(*අ1*) අවුරුදු 10 ට වැඩි අඛණ්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ රු. 50,000 ක ණය මුදලක් ලබා දිය යුතු යි. මෙම ණය මුදල වාරික 60 කින් ආපසු අයකර ගනු ලැබිය යුතු ය. ඇපකරුවන් වශයෙන් එක් අයෙකු අවම වශයෙන් අවුරුදු 10 ක අඛණ්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකු ද ඇතුළුව ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කළ යුතුය. එක් ඇපකරුවෙකුට ඇපකරු වශයෙන් ක්‍රියා කළ හැක්කේ, ණය ලබා ගන්නා දෙදෙනෙකු සඳහා පමණි.

(*ආ2*) අවුරුදු 10ට අඩු අඛන්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ රු. 25,000 ක ණය මුදලක් ලබා දිය යුතුයි. මෙම ණය මුදල වාරික 60 කින් ආපසු අයකර ගනු ලැබිය යුතු ය. ඇපකරුවන් වශයෙන් එක් අයෙකු අවම වශයෙන් අවුරුදු 10 ක අඛණ්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකු ද ඇතුළුව ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කළ යුතු ය. එක් ඇපකරුවෙකුට ඇපකරු වශයෙන් ක්‍රියා කළ හැක්කේ, ණය ලබා ගන්නා දෙදෙනෙකු සඳහා පමණි.

10-963

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - කළුබෝවිල ශාඛාව**
(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0420-04904670-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 ජුනි මස 19 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමුව අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් සහතික කරන ලද 1999 මැයි මස 20 දිනැති අංක 192 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙහිවල පදිංචි මඩුගල්ල මැදගෙදර අනුර විජේරත්න යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන්ලක්ෂ තිස්දහස් දෙසිය අසූවයි ශත අනූනවයක් (රු. 13,30,280.99) මුදලක් 2007 ජුනි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 13,30,280.99 මුදල ද, 2007 ජූලි මස 01 වැනි දින සිට

විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 192 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රම විසින් සාදන ලද 1995 ජනවාරි 16 දිනැති අංක 313 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 7 (අඩි 12ක් පළල පාර) ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 7 (අඩි 12ක් පළල පාර) සහ ලොට් 4 සහ බස්නාහිරට : ලොට් 25බී යන මායිම් තුළ එකී අංක 313 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 133/250 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රම විසින් සාදන ලද 1995 ජනවාරි මස 16 දිනැති අංක 313 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ 7 (අඩි 12ක් පළල පාර) ද, නැගෙනහිරට : ලොට් 7 (අඩි 12ක් පළල පාර) ද, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් සාදන ලද 1994.02.11 දිනැති එකී අංක 2656 දරන සැලැස්මේ සඳහන් ලොට් 26සී සහ බස්නාහිරට : ලොට් 25 යන මායිම් තුළ එකී අංක 313 දරන සැලැස්ම අනුව පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 133/251 යටතේ ලියාපදිංචි කර ඇත.

3. පෙර කී වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රම විසින් සාදන ලද 1995 ජනවාරි මස 16 දිනැති අංක 313 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 5 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ 7 (අඩි 12ක් පළල පාර) ද, නැගෙනහිරට : ලොට් 6 ද, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් සාදන ලද 1994.02.11 දිනැති එකී අංක 2656 දරන සැලැස්මේ සඳහන් ලොට් 26සී සහ බස්නාහිරට : ලොට් 4 යන මායිම් තුළ එකී අංක 313 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 133/252 යටතේ ලියාපදිංචි කර ඇත.

4. පෙර කී වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රම විසින් සාදන ලද 1995 ජනවාරි මස 16 දිනැති අංක 313 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට සහ නැගෙනහිරට : ලොට් 7 (අඩි 12ක් පළල පාර) ද, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් සාදන ලද 1994.02.11 දිනැති එකී අංක 2656 දරන සැලැස්මේ සඳහන් ලොට් 26සී සහ බස්නාහිරට : ලොට් 5 යන මායිම් තුළ එකී අංක 313 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 133/253 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග :-

1. පෙර කී වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රම විසින් සාදන ලද 1995 ජනවාරි මස 16 දිනැති අංක 313 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 7 ලකුණු කළ (අඩි 12ක් පළල පාර) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1, 2 සහ 3 ද, නැගෙනහිරට : අළුත්ගහවත්ත හෙවත් කහටගහවත්ත ද, දකුණට : අංක 2656 දරන සැලැස්මෙ සඳහන් ලොට් 26ඩී සහ 26සී සහ ලොට්ස් 4, 5 සහ 6 සහ බස්නාහිරට : ලොට් 6 සහ 4 යන මායිම් තුළ එකී අංක 313 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 10.2) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 133/245 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් සාදන ලද 1994.02.11 දිනැති එකී අංක 2656 දරන සැලැස්මේ සඳහන් කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 26ඩී (මීටර් 03ක් පළල පාර) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 26ඒ ද, නැගෙනහිරට : අළුත්ගහවත්ත හෙවත් කහටගහවත්ත ද, දකුණට : ලොට් 28 (පාර) සහ බස්නාහිරට : ලොට් 26සී යන මායිම් තුළ එකී අංක 2656 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 6.1) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 133/147 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

10-970/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී - මීරිගම ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0780-09022910-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රණවීර විසින් දෙකම සහතික කරන ලද 1996 සැප්තැම්බර් මස 25 දිනැති අංක 2410 සහ 1997 දෙසැම්බර් මස 16 දිනැති අංක 3107 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මීරිගම පදිංචි මහමඩ් මුබාරක් මොහමඩ් ෆාහීම් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්ලක්ෂ අනූපන්දහස් අටසිය හැටහයයි ශත හැත්තෑපහක (රු. 5,95,866.75) මුදලක් 2008 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2410 සහ 3107 බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභාවේ අංක 3 පල්ලේවෙල උප කාර්යාල සීමාව තුළ කල්එළිය පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1996.08.18 දිනැති අංක 6830 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත, කෝන්ගහවත්ත නමැති ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මස්ජිඩ් මාවත ද, නැගෙනහිට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : දෙවට පාර යන මායිම් තුළ එකී අංක 6830 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0 රූ. 0, පර්. 20) විශාල ඉඩම.

එකී අංක 6830 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඉහත කී ඉඩම් කොටස පහත විස්තර කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසකි.

පෙර කී කල්එළිය පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1980 මාර්තු මස 14 වැනි දිනැති අංක 1239 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මස්ජිඩ් මාවත ද, නැගෙනහිරට : නිලාම් තහීර්ට අයිති අංක 1239 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, දකුණට : ඒ. සී. අබ්දුල් රසාක් සහ එස්. සී. එම්. ජලීල් නච්ජාර්ට අයිති ඉඩම් සහ බස්නාහිරට : ඒ. සී. අබ්දුල් රසාක්ට අයිති ඉඩම සහ මජිඩ් මාවත සිට අඩි පාර ද යන මායිම් තුළ එකී අංක 1239 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් විසිපහක් (අ. 0, රූ. 2, පර්. 25) විශාල ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඩී 206/118 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-969/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හොරණ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.06.24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.09.25 දින සහ අංක 1717 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හිදැල්ල ආරච්චිගේ සීතා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පහළොස් ලක්ෂ පනස් දෙදහස් හයසිය හැත්තෑ තුනයි ශත හැටපහ (රු. 15,52,673.65) ක මුදලක් 2008.10.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 15,52,673.65ක මුදලට 2008.11.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1717 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ සුළු නගර සභා සීමාව තුළ හොරණ පිහිටි "හේගල්ලකන්ද" නමැති ඉඩමට බයලත් මානක සී. වික්‍රමගේ විසින් මැන සාදන ලද අංක 896 සහ 1991 මාර්තු මස 16 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 896ට අයත් ලොට් 2ඒ වලින් ද, නැගෙනහිරට : පිඹුරු අංක 60133ට අයත් ඉඩමෙන් ද, දකුණට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම ද සහ බස්නාහිරට : සීලාරත්න පාරෙන් ද මායිම් වූ එකී අංක 896 දරන පිඹුර ප්‍රකාරව රූඩ් තුනයි පර්චස් දාසයයි දශම අටක් (අ. 0, රූ. 3, පර්. 16.8) විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 149/50 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/1

**සෙලාන් බැංකුව පීඑල්සී - මීරිගම ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0780-00727370-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ටී, කේ. කළුආරච්චි විසින් සහතික කරන ලද 2006 නොවැම්බර් මස 09 දිනැති අංක 181 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම මිනුවන්ගොඩ පදිංචි අහමඩ් මුසීන් මොහමඩ් ෆයිස් සහ මොහමඩ් යූසුප් පරිසා බීබී හෙවත් මොහමඩ් යූසුෆ් පරීසා බීබී ෆයිස් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන්ලක්ෂ අනූහත්දහස් හාරසිය හතලිස් දෙකයි ශත හතලිස් අටක් (රු. 13,97,442.48) මුදලක් 2008 මාර්තු මස 12 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 13,97,442.48 මුදල ද, 2008 මාර්තු මස 13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අටක (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 181 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ මිනුවන්ගොඩ උප කාර්යාල ප්‍රදේශීය ගල්ලොලුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 2002.07.07 දිනැති අංක 1854 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම, උතුරට : ඒ. එම්. එම්. ෆයිස්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : ටක්කියා පාර ද, දකුණට : ඊ. එල්. රාහිලා උම්මා සහ තවත් අයට අයිති ඉඩම ද සහ බස්නාහිරට : එම්. වයි. පාරීසාට අයිති ඉඩම ද යන මායිම් තුළ පර්චස් විස්සයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 20.5) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 867/45හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

10-969/3

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

වර්ණකුලසූරිය පටබැඳිගේ නලින් තරංග.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජෙනිව්වි පියුමුනි රණසිංහ විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන) අංක 375 සහ 2005 දෙසැම්බර් මස 14 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) දූනගහ පුෂ්පාරාම මාවතේ, පදිංචි වර්ණකුලසූරිය පටබැඳිගේ නලින් තරංග යන අය විසින් ලබාගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකරන ලදුව එකී බැඳුම්කරය මත 2009.05.22 වැනි දිනට රුපියල් දාහතර ලක්ෂ තිස්අටදහස් එකසිය හතලිස්එකකුත් ශත පනස්හතක (රු. 14,38,141.57) මුදලක් වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ල් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් දහහතරලක්ෂ තිස්අටදහස් එකසිය හතලිස් එකකුත් ශත පනස්හතක (රු. 14,38,141.57) මුදල සහ 2009.05.22 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් දහතුන්ලක්ෂ විසිහත්දහස් දෙසීය හතලිස්හතරකුත් ශත හතලිස් එකක (රු. 13,27,244.41) මුදල මත 2009.05.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 31.75% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු ඉහළගේ ක්‍රිස්ටි ඇලෙස්ටර් පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ වාද්දුව කෙසෙල්වත්ත උප කාර්යාල සීමාවේ තල්පිටිය ගමේ පිහිටි දිබ්බැද්ද පාරේ වරිපනම් අංක 18/13 දරන දෙල්ගහකුරුඳුවත්තේ ලොට් 8C දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 4716 සහ 2005.09.17 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් A නමැති බිම් කොටසට මායිම්, උතුරට : අංක 2015 දරන පිඹුරේ ලොට් 8A

සහ 8B ද, නැගෙනහිරට : (පෞද්ගලික) පාර සහ එම ඉඩමේ ලොට් 9 ඉතිරි කොටස ද, දකුණට : අංක 2015 දරන පිඹුරේ ලොට් 8D ද, බස්නාහිරට : (පවත්නා) පාර ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4716 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල බිම් කැබැල්ල ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග ය.

තවද ඉහත කී බිම් කොටසට ඉහත සඳහන් අංක 375 දරන උකස් බැඳුම්කරයේ සවිස්තරව දක්වා ඇති පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

10-1062/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මෝදර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ෆාතිමා මුහාර්රිසා ජාල්ඩීන් (විවාහයට පෙර බාවා) සහ මොහමඩ් සේනඩීන් ඉක්බාල් ජාල්ඩීන්.

2009.05.28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.10.11 දින සහ අංක 1265 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෆාතිමා මුහාර්රිසා ජාල්ඩීන් (විවාහයට පෙර බාවා) සහ මොහමඩ් සේනඩීන් ඉක්බාල් ජාල්ඩීන් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිලක්ෂ පනස්තුන්දහස් එකසිය දාහයයි ශත හැට (රු. 20,53,110.60) ක මුදලක් 2009.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 20,53,110.60ක මුදලට 2009.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1265 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවට අයත් බත්තරමුල්ල ඒකකය තුළ අකුරේගොඩ පිහිටි හෝකන්දර පාර, වරිපනම් අංක 253/23බී දරන "මිල්ලගහවත්තඕවිට හෙවත් අළුබෝගහලන්ද" නමැති ඉඩමට බලයලත් මානක මානක ඩී. ඩී. හෙට්ටිගේ විසින් මැන සාදන ලද අංක 3963 සහ 2003 ජුනි මස 25 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන, උතුරට : ලොකුකැටගොඩගේ මාර්ටින් පෙරේරාගේ උරුමකරුවන්ගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 2279ට අයත් ලොට් 4න් ද, දකුණට : අඩි 30ක් පළලැති පාරක් සඳහා වෙන් කළ පිඹුරු අංක 2279ට අයත් ලොට් 14න් ද සහ බස්නාහිරට : ලොට් බී වලින් ද මායිම් වූ එකී අංක 3963 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15)ක විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියළුම දේත් සමග වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 1474/45 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1265 දරන උකස් බැඳුම්කරයෙහි දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - තංගල්ල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හේවා ගජමන් කංකානම්ගේ කුෂාන් ගංගන සහ හේවා ගජමන් කංකානම්ගේ සුනිල් ප්‍රේමසිරි.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.06.21 දින සහ අංක 8487 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේවා ගජමන් කංකානම්ගේ කුෂාන් ගංගන සහ හේවා ගජමන් කංකානම්ගේ සුනිල් ප්‍රේමසිරි ණයකරුවන් සහ හේවා ගජමන් කංකානම්ගේ කුෂාන් ගංගන උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කර යටතේ රුපියල් දාහත් ලක්ෂ තිස්හත් දහස් හයසිය අසූ හතරයි ශත පනස් අට (රු. 17,37,684.58) ක මුදලක් 2009.07.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 17,37,684.58ක මුදලට 2009.08.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර

පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 8487 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, කහවත්තහි පිහිටි "ඇලහේන්පිට්ටනිය ලියනාච්චිගේ වත්ත" නමැති ඉඩමට බලයලත් මානක ටී. එච්. ජීවානන්ද විසින් මැන සාදන ලද අංක 92/59ඊ සහ 1992 මැයි මස 22 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩමේ කොටස වන උතුරට : විතාරනගේහේන, නැගෙනහිරට : වලස්මුල්ල-බෙලිඅත්ත ප්‍රධාන පාරෙන්ද සහ පිඹුරු අංක 92/59ඊ ට අයත් ලොට් 2න් ද, දකුණට : පිඹුරු අංක 92/59ඊ ට අයත් ලොට් 2න් ද සහ බලයලත් මානක එන්. විජේවීර විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක 1210ට අයත් ලොට් 1න් ද, බස්නාහිරට : බලයලත් මානක එන්. විජේවීර විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක 1210ට අයත් ලොට් 1න් ද සහ කරගහමුලානෙන් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි දෙකයි නවයයි නවය (හෙක්. 0.4299) හෙවත් අක්කර එකයි පර්චස් දහය (අ. 1, රූ. 0, පර්. 10)ක විශාල ඉඩමට අයත් ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 175/290 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ගම්පොල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ප්‍රසන්න නාගිත බණ්ඩාර ධර්මකීර්ති, රුවන් බණ්ඩාර ධර්මකීර්ති සහ එරන්දනී ඉලංගතිලක බණ්ඩාර.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.09.12 දින සහ අංක 1256 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රසන්න නාගිත බණ්ඩාර ධර්මකීර්ති, රුවන් බණ්ඩාර ධර්මකීර්ති සහ එරන්දනී ඉලංගතිලක බණ්ඩාර යන අය ණයරුවන් හැටියට පැහැර හෙයින් එකී බැදුම්කර යටතේ රුපියල් අනූහයලක්ෂ දහනවදහස් තුන්සිය දාහතයි ශත හැට (රු. 96,19,317.60) ක මුදලක් 2009.05.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 96,19,317.60ක මුදලට 2009.06.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1256 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයෙහි උඩ පළාත ගඟ ඉහළ කෝරළේ, දොළොස්බාගේ, තෙලිහුනහි පිහිටි ගෙදර වත්තහි පිහිටි ඉඩමට බලයලත් මානක එස්. එම්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 2173 සහ 1969 පෙබරවාරි මස 16 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කර ඇති ඉඩම් කොටස වන උතුරට : බලයලත් මානක එච්. ඩී. ජී. කේ. ජී. රොඩ්රිගු විසින් මැන සාදන ලද අංක 47 සහ 1968 අගෝස්තු මස 22 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ඉඩමෙන් ද, නැගෙනහිරට : පී. ඩබ්. ඩී. පාර සහ පිඹුරු අංක 47හි දක්වා ඇති ඉඩම වෙන් කරන කාණුවෙන් ද සහ මායිමෙන් ද, දකුණට : දොලොස්බාගේ සිට ගම්පොල දක්වා ද යන පී. ඩබ්. ඩී. පාරෙන් සහ ගල්පාය එස්ටේට් වලින් ද, බස්නාහිරට : නැදවෙල එස්ටේට වෙන් කරන ලද මාල ඇලෙන් ද මායිම් වූ අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් හත (අ. 2, රූ. 3, පර්. 7) ක් විශාල ඉඩම ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු සී163/245 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/4

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නිට්ටඹුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විජේසිංහ දිසානායකගේ දොන් අජිත් ලෙස්ලි දිසානායක.

2009.09.17 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.03.17 දින සහ අංක 5372 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේසිංහ දිසානායකගේ දොන් අජිත් ලෙස්ලි දිසානායක යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිඅටලක්ෂ පනස් දහස් නවසිය හතලිස් පහයි ශත හතලිස් අට (රු. 28,50,945.48) ක මුදලක් 2009.06.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 28,50,945.48ක මුදලට 2009.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5372 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, පල්ලේවෙල උප කාර්යාල සීමාව තුළ කළඑළිය-වේල්ලවැලමුල්ල හංසගිරිවත්ත දරන ඉඩමට බලයලත් මානක ආර්. යූ. විජේතුංග විසින් මැන සාදන ලද 2005.03.18 දින සහ අංක 6685/2005 දරන පිඹුරෙහි ලොට් අංක 107 දරන කොටසට වන උතුරට : පී. පී. 1619හි ලොට් අංක 81න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1619හි ලොට් අංක 108න් ද, දකුණට : අඩි 20ක් පළල පාරෙන් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 1619හි ලොට් අංක 106න් ද මායිම් වූ එකී අංක 6685/2005 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්හය (අ. 0, රූ. 0, පර්. 36) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 336/45 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-1048/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අළුත්කඩේ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ක්‍රිෂ්ණි ඉෆ්හාම් සහ සන්තිරලිංගම් ශ්‍රීකාගන්.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2003.06.27 දින සහ අංක 1956 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ක්‍රිෂ්ණි ඉෆ්හාම් සහ සන්තිරලිංගම් ශ්‍රීකාගන් යන අය ණයකරුවන් හැටියට පැහැර හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හත්ලක්ෂ දහදහස් පන්සිය විසිනවයයි ශත තිහ (රු. 7,10,529.30) ක මුදලක් 2009.05.21 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 7,10,529.30 ක මුදලට 2009.05.22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1956 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවට අයත් දළුගම උප කාර්යාලය තුළ හුණුපිටිය පිහිටි දළුපිටිය පාර, වරිපනම් අංක 52/1 දරන "මකුල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. ජේ. ද සිල්වා විසින් මැන සාදන ලද 2002.07.30 දිනැති අංක ජේ. වයි. 11/2002 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද "ලොට් ඒ2" ලෙස ලකුණු කර ඇති ඉඩමේ කොටස වන උතුරට : ලොට් ඒ1න් ද, නැගෙනහිරට : රාජසිංහ මාවතෙන් ද, දකුණට : ලොට් ඒ3න් ද සහ බස්නාහිරට : බලයලත් මානක ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සාදන ලද 1989.05.26 දිනැති අංක 6699 දරන පිඹුරට අයත් ලොට් ඩී1න් ද මායිම් වූ එකී අංක ජේ. වයි. 11/2002 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියළුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-1048/6

---

### හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී - ගම්පොළ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දිසානායක මුදියන්සේලාගේ දිසානායක.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් ටී. බී. අබේකෝන් විසින් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2002.08.28 දින සහ අංක 3822 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දිසානායක මුදියන්සේලාගේ දිසානායක යන අය ණයකරය හැටියට පැහැර හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් දහතුන් ලක්ෂ විසිතුන් දහස් හයසිය හැත්තෑ අටයි ශත හතලිස් නමය (රු. 13,23,678.49) ක මුදලක් 2009.07.31 වන දින වන විට හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,23,678.49 ක මුදලට 2009.08.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3822 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කදුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" හෙවත් "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7ඒ දරන කොටසට උතුරට : ඉහත කී පිඹුරු ප්‍රකාර එම ඉඩමේම කොටසක් වන ලොට් 5, 6 සහ 6ඒ ලෙස වෙන් කරන ලද කොටස් ද, දකුණට : බී සහ සී ලකුණු කරන ලද අඩි 10 පාරක් සඳහා වෙන් කරන ලද කොටසක් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 7බී දරන කොටසින් ද, බටහිරට : ලොට් ඒ සහ බී ලෙස ලකුණු කරන ලද අඩි 10ක් පළල පාරෙන් ද මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3, පර්. 29)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි වැවිලි ආදී සියළු දේත් සමග අංක 1439ඒ හා 1981.03.25 වැනි දිනැති පිඹුර ප්‍රකාර ලකුණු කරන ලද ලොට් ඊ මතින් පදිකයින් හා යාන වාහන ගමන් කිරීමේ අයිතිය සහ මාර්ග ප්‍රවේශය ද සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/05 යටතේ ලියාපදිංචි කර ඇත.

2. කදුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" හෙවත් "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7සී දරන කොටසට, උතුරට : ලොට් බී සිට සී වලින් දක්වා ඇති අඩි 10ක් පළල පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරු ප්‍රකාර ලොට් 7ඩී දරන කොටසින් ද, දකුණට : කකුල්දොල ඇලෙන් ද සහ බටහිරට : ඉහත පිඹුර ප්‍රකාර එම ඉඩමේම කොටසක් වන ලොට් 9 දරන කොටසින් ද මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3, පර්. 29)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි වැවිලි ආදී සියලු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/06 යටතේ ලියාපදිංචි කර ඇත.

3. කදුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" හෙවත් "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7බී දරන කොටසට, උතුරට : ඉනි වැටෙන් සහ එස්. පී. සමරකෝන්ගේ සහ තවත් අයට අයිති සිංහපිටිය තේ වත්තෙන් ද, නැගෙනහිරට : බැම්මෙන් සහ එස්. පී. සමරකෝන් සහ තවත් අයට අයිති සිංහපිටිය තේ වත්තෙන් ද, දකුණට : ඉහත කී පිඹුරෙන් වෙන් කරන ලද ලොට් 7ඩී කොටසින් ද සහ බටහිරට : ඉහත කී පිඹුරෙන් වෙන් කරන ලද ලොට් 7ඒ කොටසින් ද මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3. පර්. 29)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි වැවිලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/07 යටතේ ලියාපදිංචි කර ඇත.

4. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර, කදුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට් හෙවත් අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7ඩී දරන කොටසට, උතුරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 7බී වලින් ද, නැගෙනහිරට : කේ. වී. පෙරේරාගේ ඇන්තනි තේ වත්තේ ද, දකුණට : කකුල් දොල ඇලෙන් සහ සිංහපිටියට යන පාරෙන් ද සහ බටහිරට : ඉහත කී පිඹුරේ ලොට් 7සී වලින් මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3, පර්. 29)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි වැවිලි ආදී සියළු දේත් සමග අංක 1439ඒ සහ 1981.03.25 වැනි දිනැති පිඹුර ප්‍රකාර ලකුණු කරන ලද ලොට් ඊ මතින් පදිකයින් සහ යාන වාහන ගමන් කිරීමේ මාර්ග අයිතියද සහ මාර්ග ප්‍රවේශය ද සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/08 යටතේ ලියාපදිංචි කර ඇත.

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් ටී. බී. අබේකෝන් විසින් 2002 අගෝස්තු මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 3822 බැඳුම්කරයේ උපලේඛනයේ සඳහන් අංක 1439ඒ පිඹුර ප්‍රකාර ලොට් 7ඊ සහ ලොට් 8 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/8

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මීගමුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.09.14 දින සහ අංක 1671 දරන බැඳුම්කරය යටතේ (පහත පළවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු මුදල් ගෙවීම සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට ද, ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ නන්දසේන යන අය උකස්කරු හැටියට ද, සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.හි නමට ලියන ලද්දාවූ ද, 2006.09.29 වැනි දින හා අංක 1699 දරන බැඳුම්කරය යටතේ (පහත දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු මුදල ගෙවීම ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ සීතා බාලසූරිය නොහොත් සීතා හෙට්ටිආරච්චි උකස්කරු හැටියට ද, සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ඇපකරු ලෙස ද,

ඉහත සඳහන් ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ නන්දසේන සහ ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ සීතා බාලසූරිය නොහොත් සීතා හෙට්ටිආරච්චි යන අය, එකී සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් කොටස් සියල්ලම පාහේ දැරීම නිසා සහ සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණය දරන නිසාත් එකී සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අතථ්‍ය අයිතිකරුවන් සහ පාලනය දරන තැනැත්තන් වන එකී ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ නන්දසේන සහ ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ සීතා බාලසූරිය නොහොත් සීතා හෙට්ටිආරච්චි යන අය ඒ අනුව, එකී සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී බැංකුව ප්‍රදානය කළ මූල්‍ය පිළිසරණවල අතථ්‍ය ප්‍රතිලාභීන් වන හෙයින් ද,

ඉහත කී සේන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ නන්දසේන සහ ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ සීතා බාලසූරිය නොහොත් සීතා හෙට්ටිආරච්චි විසින් එකී බැඳුම්කර යටතේ රුපියල් දසලක්ෂ හත්සිය හැත්තෑ හය දහස් නවසිය දෙකයි ශත පනස් හතර (රු. 1,07,76,902.54)ක මුදලක් 2009.06.30 දින වන විට ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,07,76,902.54ක මුදලට 2009.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1671 සහ 1699 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත 1 වන හා 2 වන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ සීමාව තුළ) මීගමුව නගර සභා සීමාවේ, පෙරියාමුල්ලේ, 4 වැනි කොට්ඨාසයේ, හලාවත පාරේ, වරිපනම් අංක 299හි අඹගහවත්ත කොටස, අඹගහවත්ත බටහිර කොටසේ 1/3 දැනට එක ඉඩමක් ලෙස පවතින ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. ඒ. කොස්තා විසින් පිළියෙල කරන ලද 1986.11.12 වැනි දින අංක 3375 දරන පිඹුරේ මායිම්, උතුරට : මර්වින් ප්‍රනාන්දු සහ ෆැන්සිස් ප්‍රනාන්දුට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : ෆැන්සිස් ප්‍රනාන්දුට අයිති ඉඩම, ඒ. සී. ජේ. ආබ්ඩීන්ගේ උරුමකරුවන්ට අයත් සහ දැන් හසන් නෙලුෆාට අයිති ඉඩමෙන් ද, දකුණට : හලාවත පාරෙන් සහ දැන් මාරි ඉන්ද්‍රා නිමාලි පීරිස්ට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : දැනට මාරි නිමාලි පීරිස්ට අයිති ඉඩමෙන් සහ පේද්රූ අප්පුහාමිට අයිති ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 3375 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් තුන (අ. 0, රූ. 1, පර්. 3) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළු දේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 293/65 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ සීමාව තුළ) මීගමුව නගර සභා සීමාවේ, හුණුපිටිය, 2 වැනි කොට්ඨාසයේ, කෙලින් වීදියේ වරිපනම් අංක 363හි "මහගෙදරවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ආර්. අයි. ප්‍රනාන්දු විසින් පිළියෙල කරන ලද 1984.12.29 වැනි දින අංක 1782 දරන පිඹුරේ උතුරට : රෙක්ස් මැතියස් සහ කේ. පී. එල්. ප්‍රනාන්දු අයිති ඉඩම් වලින් ද, නැගෙනහිරට : මෙම ඉඩමේම කොටස් වන ලිනෙට් මැතියස් සහ ඩබ්. එල්. රොඩ්රිගුට අයිති ඉඩමෙන්, දකුණට : කෙලින් වීදියෙන් ද, සහ බස්නාහිරට : රෙක්ස් මැතියස්ට අයිති ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 1782 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්අට (අ. 0, රූ. 0, පර්. 38)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළුදේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 276/272 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/10

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කෘෂිකාර්මික බැංකු කටයුතු අංශ ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0860-30325212-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් මධුක විමලසේන විසින් තුනම සහතික කරන ලද 2007 නොවැම්බර් මස 14 සහ 15 දිනැති අංක 157 සහ 2008 අප්‍රේල් මස 8 දිනැති අංක 171 සහ 172 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම කොළඹ 04 පදිංචි රජින්ද්‍ර ප්‍රසන්න ඒකනායක

අමරසේකර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑඅට ලක්ෂ විසිහයදහස් එකසිය අනූ එකයි ශත හැත්තෑ අටක (රු. 78,26,191.78) මුදලක් 2009 පෙබරවාරි මස 16 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 78,26,191.78 මුදල ද, 2009 පෙබරවාරි මස 17 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 157, 171 සහ 172 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි සහ දෙවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## පළමුවැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගං දහය කෝරළේ, කටුවාපිටිය සහ වේරවැල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්තනායක විසින් සාදන ලද 2007.03.22 දිනැති අංක 3221 දරන සැලැස්මේ සඳහන් කටුපිටිය එස්ටේට් නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : මෙහි සඳහන් ලොට් 1 ද, දකුණට : මෙහි සඳහන් ලොට් 1 සහ බස්නාහිරට : මෙහි සඳහන් ලොට් 1 සහ 3 ද යන මායිම් තුළ පර්චස් විසි දෙකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 22.50) විශාල ඉඩම.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගං දහය කෝරළේ, කටුවාපිටිය සහ වේරවැල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්තනායක විසින් සාදන ලද 2007.03.22 දිනැති අංක 3221 දරන සැලැස්මේ සඳහන් කටුපිටිය එස්ටේට් නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : මෙහි සඳහන් ලොට් 2 ද, දකුණට : මෙහි සඳහන් ලොට් 2 සහ 1 ද, සහ බස්නාහිරට : එස්ටේට් පාර ද යන මායිම් තුළ පර්චස් තුනයි දශම අටයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 3.80) විශාල ඉඩම.

එකී අංක 3221 දරන සැලැස්මේ සඳහන් එකී 2 සහ 3 ලකුණු කළ ලොට්ස් පහත විස්තර කරනු ලබන අංක 2833 දරන සැලැස්මේ සඳහන් ලොට් 1හි බෙදා වෙන් කරන ලද කොටස් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගං දහය කෝරළේ, කටුවාපිටිය සහ වේරවැල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එච් බී. ජෝසප් විසින් සාදන ලද 1972.09.30 දිනැති අංක සී/1/74 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඩී සහ ඊ දරන එකතුකළ කොටස් වල බෙදූ කොටසක් වන බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්තනායක විසින් සාදන ලද 2005.02.15 දිනැති අංක 2833 දරන සැලැස්මේ සඳහන් කටුපිටිය එස්ටේට් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ එස්ටේට් පාර ද, නැගෙනහිරට : අංක 2833 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, දකුණට : ප්‍රධාන පාර ද සහ බස්නාහිරට : එස්ටේට් පාර සහ පාර යන මායිම් තුළ අක්කර නවයයි රූඩ් එකක් (අ. 9, රූ. 1, පර්. 0) නොහොත් හෙක්ටයාර් තුනයි දශම හතයි හතරයි තුනයි තුනක් (හෙක්ටයාර් 3.7433) විශාල ඉඩම. මෙය කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1548/206 යටතේ ලියාපදිංචි කර ඇත.

එස්ටේට් පාර උඩින් මාර්ග අයිතිය සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

## දෙවැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගං දහය කෝරළේ, කටුවාපිටිය සහ වේරවැල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්නායක විසින් සාදන ලද 2007.03.22 දිනැති අංක 3221 දරන සැලැස්මේ සඳහන් කටුපිටිය එස්ටේට් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2852 දරන සැලැස්මේ සඳහන් ලොට් 1ඒ ද, නැගෙනහිරට : අංක 2833 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, දකුණට : ප්‍රධාන පාර සහ බස්නාහිරට : එස්ටේට් පාර සහ මෙහි සඳහන් ලොට් 2 සහ 3 ද, යන මායිම් තුළ අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දහතුනයි දශම හතයි බිංදුවක් (අ. 2, රූ. 3, පර්. 13.70) විශාල ඉඩම.

එකී අංක 3221 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 පහත විස්තර කරනු ලබන අංක 2833 දරන සැලැස්මේ සඳහන් ලොට් 1හි බෙදා වෙන් කරන ලද කොටසක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිරගං දහය කෝරළේ, කටුවාපිටිය සහ වේරවැල්ල ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එච්. බී. ජෝසප් විසින් සාදන ලද 1972.09.30 දිනැති අංක සී/1/74 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඩී සහ ඊ දරන එකතුකළ කොටස් වල බෙදූ කොටසක් වන බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්තනායක විසින් සාදන ලද 2005.05.15 දිනැති අංක 2833 දරන සැලැස්මේ සඳහන් කටුපිටිය එස්ටේට් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ එස්ටේට් පාර 1 ද, නැගෙනහිරට : අංක 2833 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, දකුණට : ප්‍රධාන පාර ද සහ බස්නාහිරට : එස්ටේට් පාර සහ පාර යන මායිම් තුළ අක්කර නවයයි රූඩ් එකක් (අ. 9, රූ. 1, පර්. 0) නොහොත් හෙක්ටයාර් තුනයි දශම හතයි හතරයි තුනයි තුනක් (හෙක්ටයාර් 3.7433) විශාල ඉඩම. මෙය කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1548/206 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

10-969/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නුවරඑළිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දොරෙයිසාමි කනගරාජ්.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.11.05 දින සහ අංක 1299 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොරෙයිසාමි කනගරාජ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හයලක්ෂ විසිදහස් එකසිය හැටයි ශත හැත්තෑපහ (රු. 6,20,160.75) ක මුදලක් 2009.05.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,20,160.75ක මුදලට 2009.06.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1299 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපන කොට්ඨාසයේ, උඩපළාත කෝරළේ, හල්ග්‍රාන් ඔය රාගල බසාර් හි පිහිටි වරිපනම් අංක 17 දැනට අංක 94 දරන ඉඩමට බලයලත් මානක එච්. ඩී. සුමිත් විසින් මැන සාදන ලද අංක 137 සහ 1948 මාර්තු මස 29 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 36ජී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 33එච් වලින් ද, දකුණට : ලොට් 33යූ සහ එල් 33 ආර් වලින් ද සහ බස්නාහිරට : ලොට් 33එෆ් වලින් ද මායිම් වූ පර්චස් දෙකයි දශම හයයි හතර (අ. 0, රූ. 0, පර්. 2.64) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුවේ ඕ 176/177 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුර නැවත මැනීමකට ලක් කිරීමෙන් අනතුරුව මෙසේ විස්තර වේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපන කොට්ඨාසයේ, උඩපළාත කෝරළේ, හාල්ග්‍රාන්ඔය රාගල බසාර් හි පිහිටි වරිපනම් අංක 94 දරන ඉඩමට බලයලත් මානක අයි. කොටඹගේ විසින් මැන සාදන ලද අංක 693/1 සහ 2007 සැප්තැම්බර් මස 04 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 01 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : රාගල බසාර් පාරෙන් ද, නැගෙනහිරට : රාගල බසාර් පාරෙහි වරිපනම් අංක 96 දරන දේපලෙන් ද, (අංක 137 සහ 1948 මාර්තු මස 29 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 33එච්), දකුණට : රාගල හරස් පාරෙහි වරිපනම් අංක 14 දරන දේපලෙන් ද සහ බස්නාහිරට : රාගල බසාර් පාරෙහි වරිපනම් අංක 92 දරන දේපලෙන් ද (අංක 137 සහ 1948 මාර්තු මස 29 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 33එෆ්) මායිම් වූ පර්චස් දෙකයි දශම හයයි හතර (අ. 0, රූ. 0, පර්. 2.64)ක විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/9

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අළුත්කඩේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වෙලප්පු නයිදෙලාගේ ලීලාන් සම්පත්.

2009.09.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.10.07 දින සහ අංක 2225 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙලප්පු නයිදෙලාගේ ලීලාන් සම්පත් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිඅට ලක්ෂ විසිහත් දහස් එකසිය හැත්තෑ හයයි ශත නවයක (රු. 28,27,176.09) ක මුදලක් 2009.07.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 28,27,176.09ක මුදලට 2009.08.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2225 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල ඒකකයේ, මාලඹේ පිහිටි පොල්ගස්මෙලේන්ද නමැති ඉඩටම බලයලත් මානක ජී. එෆ්. ඩයස් විසින් මැන සාදන ලද 2002 අගෝස්තු මස 04 දිනැති අංක 1552සී දරන පිඹුරේ බෙදා වෙන් කර විස්තර කරන ලද ලොට් සී දරන ඉඩම උතුරට : ඩේවිඩ් මායාදුන්නට අයිති රබර් වත්තෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 579 හි ලොට් 2න් ද, දකුණට : ලොට් ඩී වලින් ද සහ බස්නාහිරට : ලොට් ඊ (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටස) සහ ලොට් බී වලින් ද මායිම් වූ පර්චස් දහයයි දශම අටයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 10.80)ක් විශාල ඇති ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඊ 1316/245 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් 2004 ඔක්තෝබර් මස 07 දිනැති සහ අංක 2225 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-1048/7

**සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බැන්කිං (හිඟුරක්ගොඩ) ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0510-06401070-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 සැප්තැම්බර් මස 08 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද 2000 නොවැම්බර් මස 10 දිනැති අංක 50 ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. රාවුෆ් විසින් දෙකම සහතික කරන ලද 2005 පෙබරවාරි මස 28 දිනැති අංක 828 සහ 2005 නොවැම්බර් මස 23 දිනැති අංක 1048 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම හිඟුරක්ගොඩ පදිංචි චන්ද්‍රකාන්ති රාජපක්ෂ සහ කුරුප්පු ආරච්චිගේ බන්දුල බණ්ඩාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දොළොස්ලක්ෂ නවදහස් හයසිය දහසයයි ශත හැට එකක (රු. 12,09,616.61) මුදලක් 2009 පෙබරවාරි මස 15 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 12,09,616.61 මුදල ද, 2009 පෙබරවාරි මස 16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 50, 828 සහ 1048 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හිඟරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සිංහල පත්තුවේ, හිඟුරක්කොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඉරංදතිස්ස කොටඹගේ විසින් සාදන ලද 2000.10.29 දිනැති අංක 105 දරන සැලැස්මේ සඳහන් හිඟුරක්දමන නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ (මිනුම්පති විසින් සාදන ලද අවසාන ජනපද සැලසුම් අංක 132 හි ලොට් 243 ලෙස නිරූපිත) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එෆ්සීපී පො 132 හි සඳහන් ලොට් 231 ද, නැගෙනහිරට : එෆ්සීපී පො 132 හි සඳහන් ලොට් 221 ද, දකුණට : නිවසේ සිට ගුවන් තොටුපලට යන පාර ද, සහ බස්නාහිරට : එෆ්සීපී පො 132 හි සඳහන් ලොට් 242 ද මායිම් තුළ පර්චස් විස්සයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 20.6) විශාල පදිංචි නිවස, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අංක එෆ්සීපී පො 132 අතිරේක අංක 05 හි මාර්ග අයිතිය ලෙස පෙන්නුම් කරනු ලබන ලොට් 226 තුළ සහ උඩින් මාර්ග අයිතිය ලෙස පාවිච්චි කිරීමේ අයිතිය සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

10-1083

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බැන්කිං ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0830-ඒඑන්3811-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ප්‍රොක්ටර් විසින් තුනම සහතික කරන ලද 2008 මාර්තු මස 19 දිනැති අංක 268, 269 සහ 270 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම මාලබේ පදිංචි ජයරාජ් ටෙනිසන් වීරසූරිය සහ හීනටිගල බඩල්ගේ දර්ශනී මෙත්තානන්ද යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි තිස්එක්ලක්ෂ තිස්තුන්දහස් පන්සිය තිස් පහයි ශත පනස් එකක (රු. 1,31,33,535.51) මුදලක් 2009 අප්‍රේල් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,31,33,535.51 මුදල ද, 2009 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 268, 269 සහ 270 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි සහ දෙවැනි සහ තුන්වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත සඳහන් පළමුවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොහුවල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලබේ පිහිටි

බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 28 වැනි දිනැති අංක 2602 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ටික්කගහවත්ත නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 1බී1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1බී2 ද, නැගෙනහිරට : අංක 682 දරන සැලැස්මේ සඳහන් ලොට් 9 ද, දකුණට : ලොට් 1බී7 සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ එකී අංක 2602 දරන සැලැස්ම අනුව පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්. 9) විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම් උඩින් මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොහුවල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලබේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 28 වැනි දිනැති අංක 2602 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මිරිස්හේන හෙවත් ටික්කගහවත්ත නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 1බී7 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1බී1 ද, නැගෙනහිරට : අංක 682 දරන සැලැස්මේ සඳහන් ලොට් 9 ද, දකුණට : පාර ද, සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ එකී අංක 2602 දරන සැලැස්ම අනුව පර්චස් බිංදුවයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 0.25) විශාල ඉඩම.

**ඉහත සඳහන් දෙවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 22 දිනැති අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 68 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 112 ද, නැගෙනහිරට : ලොට් 69 ද, දකුණට : මිල්ලගහවත්ත සහ බස්නාහිරට : ලොට් 67 ද, යන මායිම් තුළ එකී අංක 1897 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 10.08) විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම් උඩින් මාර්ග අයිතිය සහ වෙනත් අයතීන් සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 22 දිනැති අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 100 (මීටර් 6.6ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 117 ද, නැගෙනහිරට : ලොට් 95, 98, 94 සිට 88, 99, 87 සිට 81, 101, 80, 79 ද, දකුණට : ලොට් 111 ද සහ බස්නාහිරට : ලොට් 63, 102, 61 සිට 54, 104, 53 සිට 48, 106 සහ 47 ද, යන මායිම් තුළ එකී අංක 1897 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් පහළොවයි දශම තුනයි හතක් (අ. 0, රූ. 1, පර්. 15.37) විශාල ඉඩම. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 325/207හි ලියාපදිංචි කර ඇත).

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 22 දිනැති අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 107 (මීටර් 9ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 117 ද, නැගෙනහිරට : ලොට් 44, 106, 43 සිට 39, 104, 38 සිට 30, 102, 29, 28 සහ 111 ද, දකුණට : ලොට් 26 සහ 25 ද සහ බස්නාහිරට : ලොට් 110, 24 සිට 22, 109, 21 සිට 14, 108, 12 සිට 1 ද, යන මායිම් තුළ එකී අංක 1897 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් හතරයි දශම එකයි නවයක් (අ. 0, රූ. 2, පර්. 4.19) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 22 දිනැති අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 111 (මීටර් 9ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 28, 62, 63 සහ 100 ද, නැගෙනහිරට : ලොට් 79 සහ 112 ද, දකුණට : ලොට් 66, 65, 64, 27 සහ 26 ද සහ බස්නාහිරට : ලොට් 107 ද යන මායිම් තුල එකී අංක 1897 දරන සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම එකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 22.14) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 22 දිනැති අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 112 (මීටර් 6.0-6.6ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 75 සිට 79 ද, නැගෙනහිරට : ලොට් 113 ද, දකුණට : ලොට් 70 සිට 66 ද සහ බස්නාහිරට : ලොට් 111 ද යන මායිම් තුළ එකී අංක 1897 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම එකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 16.13) විශාල ඉඩම. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 305/230හි ලියාපදිංචි කර ඇත).

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 22 දිනැති අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 117 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් 97 ද, දකුණට : ලොට් 97, 96, 95, 100, 47 සිට 44, 107, 1 සහ 13 ද සහ බස්නාහිරට : අංක 2032 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සහ පලාකෙත කුඹුර ද යන මායිම් තුළ එකී අංක 1897 දරන සැලැස්ම අනුව පර්චස් දහනවයයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 19.85) විශාල ඉඩම.

ඉහත සවිස්තරව විස්තර කරන ලද එකී ලොට් 68 සහ ලොට් 100, 107, 111 සහ 112 දරන මාර්ග සඳහා වෙන් කිරීම් පහත සවිස්තරව විස්තර කරනු ලබන ලොට් 2බීහි කොටසකින් බෙදා වෙන් කරන ලද කොටස් වන අතර ඉහත සවිස්තරව විස්තර කරන ලද එකී අංක 1897 දරන සැලැස්මේ සඳහන් එකී ලොට් 117 පහත සවිස්තරව විස්තර කරනු ලබන ලොට් 2බී හි කොටසක් සහ ලොට් 2ඒ හි එකතුවකි.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2000 සැප්තැම්බර් මස 14 දිනැති අංක 1848 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 2බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2ඒ පාර සහ අංක 99/04/2006 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : අංක 99/04/2006 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සහ අංක 185 දරන සැලැස්මේ සඳහන් ලොට් ඊ ද, දකුණට : මිල්ලගහවත්ත ද සහ බස්නාහිරට : පලාකෙත කුඹුර ද යන මායිම් තුළ එකී අංක 1848 දරන සැලැස්ම අනුව අක්කර අටයි පර්චස් විස්සයි දශම හතයි දෙකක් (අ. 8, රූ. 0, පර්. 20.72) විශාල ඉඩම. (මෙය

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එත් 305/137හි ලියාපදිංචි කර ඇත).

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම (වැතර උප කාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2000 සැප්තැම්බර් මස 14 දිනැති අංක 1848 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩැල්ලලන්ද නමැති එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ ලොට් 2ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 2බී සහ බස්නාහිරට : දෙපා ඇල ද, යන මායිම් තුළ එකී අංක 1848 දරන සැලැස්ම අනුව පර්චස් පහයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 5.10) විශාල ඉඩම. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එත් 305/135හි ලියාපදිංචි කර ඇත)

පහත ලකුණු කල මාර්ග සඳහා වෙන් කිරීම් තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

1. අංක 1897 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 168 සහ 174.

2. බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2000 ඔක්තෝබර් මස 18 දිනැති අංක 2032 දරන සැලැස්මේ සඳහන් ලොට් 1,

3. අංක 1848 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දියගම සිට හෝමාගමට යන මහා මාර්ගයට යන පාර.

**ඉහත සඳහන් තුන්වෙනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ විසින් සාදන ලද 2004 මැයි මස 20 දිනැති අංක 1800 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පත්තිනිගොඩැල්ල නමැති එහි පිහිටි සියළු දේ සමග ඉඩමේ (පහත සවිස්තරව විස්තර කරනු ලබන ලොට් 1-75, ආර්1-ආර්5, ඩී1-ඩී5 ලකුණු කල යාබද සියලු ඉඩම් කැබලිවලින් ලොට් 60 වන) ලොට් 60 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 59 ද, නැගෙනහිරට : ලොට් 58 ද, දකුණට : ලොට් ආර් 5 සහ බස්නාහිරට : එල් ද යන මායිම් තුළ එකී අංක 1800 දරන සැලැස්ම අනුව පර්චස් එකොළහක් (අ. 0, රූ, 0, පර්. 11) විශාල ඉඩම.

පහත සඳහන් මාර්ග සඳහා වෙන් කිරීම් උඩින් මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමග ය.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ විසින් සාදන ලද 2004 මැයි මස 20 දිනැති අංක 1800 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පත්තිනිගොඩැල්ල නමැති ඉඩමේ (පහත සවිස්තරව විස්තර කරනු ලබන ලොට් 1-75, ආර්1-ආර්5, ඩී1-ඩී5 ලකුණු කල යාබද සියලු ඉඩම් කැබලිවලින් ලොට් ආර් 1 වන) ලොට් ආර්1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 30ක් පළල පාර ද, නැගෙනහිරට : ලොට්ස් 1-4, 31, 32, ආර්4, 33, 34, 59, 60 සහ ආර් 5 ද, දකුණට : ලොට් 61 සහ බස්නාහිරට : අංක 792 දරන සැලැස්මේ සඳහන් ලොට් 2බී යන මායිම් තුළ එකී අංක 1800 දරන සැලැස්ම අනුව පර්චස් තිස් එකයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 31.90) විශාල ඉඩම.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ විසින් සාදන ලද 2004 මැයි මස 20 දිනැති අංක 1800 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පත්තිනිගොඩැල්ල නමැති ඉඩමේ ලොට් ආර් 5 (මීටර් 6.0ක් පළල මාර්ගය සඳහා වෙන් කිරීම) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 60 සහ 48-58 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 61-74 සහ බස්නාහිරට : අංක 792 දරන සැලැස්මේ සඳහන් ලොට් 2බී යන මායිම් තුළ එකී අංක 1800 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් හතරයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 4.70) විශාල ඉඩම. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්‍රිකාව පී 1633/279හි ලියාපදිංචි කර ඇත.)

බලයලත් මිනින්දෝරු බී. එස්. නානායක්කාර විසින් සාදන ලද 1993 මාර්තු මස 23 වැනි දිනැති අංක 792 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 12 ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

එකී ලොට් 60 සහ ආර් 1 ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම පහත සවිස්තරව විස්තර කරනු ලබන එකී අංක 1800 දරන සැලැස්මේ සඳහන් ලොට් 1-75, ආර් 1, ආර් 5, ඩී1-ඩී5 ලකුණු කල යාබද ඉඩම් කැබලිවල පිළිවෙලින් ලොට් 60 සහ ආර් 1 වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ විසින් සාදන ලද 2004 මැයි මස 20 දිනැති අංක 1800 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පත්තිනිගොඩැල්ල නමැති ඉඩමේ ලොට් 1-75, ආර්1-ආර්5, ඩී1-ඩී5 ලකුණු කළ යාබද ඉඩම් කැබලිවලට මායිම්, උතුරට : අංක 792 දරන සැලැස්මේ සඳහන් ලොට් 12 ද, නැගෙනහිරට : කොරතොට සිට අතුරුගිරියට යන පාර ද, දකුණට : අංක 1287 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ3 සහ බස්නාහිරට : අංක 792 දරන සැලැස්මේ සඳහන් ලොට් 2බී (පොදු කටයුතු සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ එකී අංක 1800 දරන සැලැස්ම අනුව අක්කර පහයි රූඩ් තුනයි පර්චස් විස්සයි දශම බිංදුවක් (අ. 5, රූ. 3, පර්. 20.30) විශාල ඉඩම. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්‍රිකාව පී 1633/167හි ලියාපදිංචි කර ඇත).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

10-969/4

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කළුබෝවිල ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0420-04905810-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.19 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි

වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ආර්. ද ලිවේරා විසින් සහතික කරන ලද 1998 අගොස්තු මස 31 දිනැති අංක 3570 සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1999 මාර්තු මස 25 දිනැති අංක 1624 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නුගේගොඩ පදිංචි කංකානිගේ නිහාල් ගුණරත්න අල්විස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්එක්ලක්ෂ තිස්හත්දහස් හාරසිය අසූදෙකයි ශත හයක් (රු. 31,37,482.06) මුදලක් 2008 අප්‍රේල් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සීට ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 31,37,482.06 මුදල ද, 2008 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3570 සහ 1624 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මිරිහාන මහවත්ත පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එම්. දිසානායක විසින් සාදන ලද 1996 ජනවාරි මස 10 වැනි දිනැති අංක 767 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඇපලගහවත්ත නමැති ගස්, වගා, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ, ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මහවත්ත පාර වරිපනම් අංක 27/2 සහ 27/1ඒ දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට : මහවත්ත පාර ද, දකුණට : ලොට් 2 සහ මහවත්ත පාර වරිපනම් අංක 25/1 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : මහවත්ත පාර වරිපනම් අංක 25/1 දරන පරිශ්‍රය යන මායිම් තුළ එකී අංක 767 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 8.7) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2220/160 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-970/1

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මැයි මස 29 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී, මීන් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. රත්නසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2007.01.26 දින අංක 53 යන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, බොරලැස්ගමුව යන ස්ථානයේ පදිංචි නිරෝෂණ අමරසිංහ (ණට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තව ද වර්ෂ 2009 ක් වූ අප්‍රේල් මස 30 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හාරලක්ෂ අනූ නම දහස් අටසිය හැට හයයි ශත හතලිස් හත (රු. 499,866.47) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හාරලක්ෂ අනූ නම දහස් අටසිය හැට හයයි ශත හතලිස් හත (රු. 499,866.47) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2009 ක් වූ මැයි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූ පන්දහස් අටසිය තිහයි ශත හතලිස් හත (රු. 495,830.47) ක මුදලක් මත වසරකට සියයට පහළොවයි දශම පහ (15.5%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව සහ එහි නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලෙ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ දිවිලපිටිය ගමෙහි ශ්‍රී මහා බෝධිරාජාරාම පාරේ පිහිටි කෝන්ගහවත්ත යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද 1994.10.21 වැනි දින අංක 2887 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කල ලොට් සී1බී දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : ලොට් සී1ඒ ද, නැගෙනහිරට : පියසේන විජේතුංගගේ ඉඩමේ කොටසකින්, දකුණට : පාරෙන් සහ බටහිරට : ශ්‍රී මහා බෝධිරාජාරාම පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හය (අ. 0, රූ. 0, පර්. 7.6) ක ඉඩම වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10-931/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී - අත්තිඩිය ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0410-01995646-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු

මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් මධුක විමලසේන විසින් සහතික කරන ලද 2007 සැප්තැම්බර් මස 10 දිනැති අංක 146 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගල්කිස්ස පදිංචි මදසාමි ජීවරත්නම් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හයලක්ෂ හැත්තෑපන්දහස් එකසිය අනූතුනයි ශත හැටදෙකක් (රු. 6,75,193.62) මුදලක්, 2008 දෙසැම්බර් 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 6,75,193.62 මුදල ද, 2009 ජනවාරි 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 146 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෙසෙල්වත්ත පිහිටි කළුතර කොට්ඨාසයේ මිනුම්පති වෙනුවට මිනුම් අධිකාරී ජේ. පී. එන්. එම් ද සිල්වා විසින් සාදන ලද 1989.10.20 දිනැති අංක 2434 දරන බෙදුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 85 ලකුණු කල (මුලික සැලසුම් අංක 1387 හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 66 ද, නැගෙනහිරට : ලොට් අංක 66, 83 සහ 84 ද, දකුණට : ලොට්ස් 83, 84 පුහුහෙරලියගහවත්ත දෙල්ගහවත්ත සහ ලොට් 86 සහ බස්නාහිරටː දෙල්ගහවත්ත සහ ලොට් 86 යන මායිම් තුළ පර්චස් තිස් හයයි දශම හතයි හයක් (අ. 0, රූ. 0, පර්. 36.76) නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි නවයයි තුනක් (හෙක්ටයාර 0.093) ක් විශාල, ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

10-967/1

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ අගොස්තු මස 13 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී, මීන් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. ප්‍රභා සෙනෙවිරත්න (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2005.04.06 වැනි දින අංක 104 දරන බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. වීරක්කොඩි (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2006.08.31 වැනි දින අංක 294 දරන පවරාදීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, නුවර දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ සෙනෙවිරත්න බණ්ඩාර (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තව ද වර්ෂ 2009 ක් වූ ජූලි මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හත්ලක්ෂ එකොලොස් දහස් හයසිය හතලිස් හය (රු. 7,11,646.00) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හත්ලක්ෂ එකොලොස් දහස් හයසිය හතලිස් හය (රු. 7,11,646.00) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2009 ක් වූ අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ හත් දහස් හයසිය අසූ එක (රු. 7,07,681.00) ක මුදලක් මත වසරකට සියයට දොලහයි දශම පහ (12.5%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද, මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව සහ එහි නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පල්ලේගම්පහ කෝරළයේ පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාව තුළ බොල්ලේගොඩ අඹතැන්න (මීන්පෙර පරණගම) හි පිහිටි බොල්ලේගොඩ යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් සාදන ලද 1996.09.20 වැනි දින අංක 896 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 01 දන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : එකී පිඹුරේ ලොට් 02න් ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 02න් ද, දකුණට : පීපී මහ අංක 1944 හි ලොට් 50 න් ද සහ බටහිරට : අඹතැන්නේ සිට කොලණිය දක්වා දිවෙන පාරෙන් ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතර (අ. 0, රූ. 0, පර්. 20.4) ක ඉඩම වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී.

10-932/1

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 1119000853.

ලාලින්ද්‍ර සිල්වා (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 මැයි මස 29 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. එච්. ඉසෙඩ් ප්‍රනාන්දු විසින් 2006 මාර්තු මස 24 වැනි දින සහතික කරන ලද අංක 8327 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලාලින්ද්‍ර සිල්වා (ප්‍රයිවට්) ණයකරු හැටියට ද, සහ කොළඹගේ චිරාන් ලාලින්ද්‍ර ද සිල්වා උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ අනූඅට දහස් නවසිය අසූ නවයක (රු.9,98,989) මුදලක් 2009 මාර්තු මස 24 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට අයවිය යුතු සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රුපියල් නවලක්ෂ අනූඅට දහස් නවසිය අනූ නවයක (රු.9,98,989) මුදලට 2009 මාර්තු මස 25 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 998,989 ක මුදල මත 36% ක වැඩිපුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 8327 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැනක් ඔෆ් සිලෝන් පී.එල්.සී වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සමමත කර ගනී.

**උපලේඛනය**

බලයලත් මානක ඩබ්ලිව්. ඒ. යූ. සෙනරත් විසින් 2002.06.15 වැනි දින සාදන ලද අංක 1824 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාව තුළ කුරණ තුන්වන කොට්ඨාසයේ, පිහිටි බක්මීගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන කොටසට මායිම්, උතුරට : (අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) එම ඉඩමේ ලොට් 4 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 1 ද, දකුණට : එම්. ටයිටස් ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිර : එල්. රූබන් ප්‍රනාන්දුගෙ ඉඩම සහ එකී පිඹුරේ ලොට් 3 ද, යන මායිම් තුළ පර්චස් විසි තුනයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 23.2) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වන අතර, එකී පිඹුරේ ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටස ඔස්සේ ගමන් කිරීමේ අයිතිය ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ 290/207 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

10-1044

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 309317.
පහලගේ පියල් ජයන්ත අබේගුණවර්ධන
පහලගේ දුෂන්ති ගීතිකා අබේගුණවර්ධන
පී. ඩී. එස්. ඔටෝ ට්‍රේඩර්ස්හි කොටස්කරුවන්

2009 ජුනි මස 19 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. පියසේන විසින් 2006 මැයි මස 29 වැනි දින සහතික කරන ලද අංක 2984 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "පී. ඩී. එස්. ඔටෝ ට්‍රේඩර්ස්" යන නාමය හා විලාශයෙන් හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පහලගේ පියල් ජයන්ත අබේගුණවර්ධන සහ පහලගේ දුෂන්ති ගීතිකා අබේගුණවර්ධන ණයකරුවන් හැටියට ද, සහ පහලගේ දුෂන්ති ගීතිකා අබේගුණවර්ධන උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහසය ලක්ෂ හයදහස් එකසිය හතලිස් එකයි ශත අනූවක (රු.16,06,141.90) මුදලක් 2009 මැයි මස 4 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහසය ලක්ෂ හයදහස් එකසිය හතලිස් එකයි ශත අනූවක (රු.16,06,141.90) මුදලක් 2009 මැයි මස 4 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහසය ලක්ෂ හයදහස් එකසිය හතලිස් එකයි ශත අනූවක (රු.16,06,141.90) මුදලට 2009 මැයි මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 14,98,000 ක මුදල මත 22% ක වැඩිපුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලක් අඩුකොට එකී අංක 2489 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උක්සකොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය, කොළඹ 12, හල්ෆ්ස්ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බලයලත් මානක එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1970 අගෝස්තු මස 2 වැනි දින සාදන ලද අංක 999 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, කළුතර බද්ද නාගොඩ (බලයලත් මානක සී. එච්. බී. වික්‍රමසේකර විසින් 1958 ජුනි මස 29 වැනි දින සාදන ලද අංක 1217 දරන පිඹුරේ පෙන්වා ඇති නැවත බෙදීමක් වන ලොට් 2ඒ, 2ඩී, 2ඊ, 2එච්, 21, සහ 2 එල් සහ 2 එම් දරන) පිටගොන්එළිය කියන ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන කොටසට මායිම්, ඊසාන දිගට : එම ඉඩමේ ලොට් 2 ද, ගිනිකොන දිගට : පාරක් සඳහා වෙන් කරන ලද (එකී

අංක 1217 දරන පිඹුරේ ලොට් 2) ද, නිරිති දිගට : කළුතර සිට නාගොඩ දක්වා ඇති ප්‍රධාන පාර ද, වයඹ දිගට : එකී අංක 1217 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි එම ඉඩමේම ලොට් 1 ද, යන මායිම් තුළ අංක 999 දරන පිඹුර පරිදි පර්චස් විස්සයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 20.8) විශාල ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 622/147 යටතේ ලියාපදිංචිව ඇත.

බලයලත් මානක එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1970 අගෝස්තු මස 2 වැනි දින සාදන ලද අංක 999 දරන පිඹුර පරිදි එකී නාගොඩ පිහිටි (නැවත බෙදීමක් ලෙස පෙන්වා ඇති එකී ලොට් වලට අයත්) පිටගොන්එළිය කියන ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලු දේත් සමග බෙදා වෙන්කරන ලද ලොට් 2 දරන කොටසට මායිම්, ඊසාන දිගට : එම ඉඩමේ ලොට් 3 ද, ගිණිකොන දිගට : (එකී අංක 1217 දරන පිඹුරේ ලොට් 20 දරන) පාරක් සඳහා වෙන් කරන ලද කොටස ද, නිරිත දිගට : එම ඉඩමේ ලොට් 1 ද, වයඹ දිගට : එම ඉඩමේ ලොට් 1 ද, යන මායිම් තුළ අංක 999 දරන පිඹුර පරිදි පර්චස් දහනවයයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 19.7) විශාල ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 622/148 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

10-1045

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ජා ඇල**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 නැකි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0270-746574-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අප්‍රේල් මස 29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.එම්. ගුණසිංහ විසින් සහතික කරන ලද 1999 ජූලි 1 දිනැති 124, 2000 ජූලි 14 දිනැති අංක 383, 2000 ඔක්තෝම්බර් මස 23 දිනැති අංක 469 සහ 2001 මාර්තු 19 දිනැති අංක 568 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම ජාඇල පදිංචි මහපටබැඳිගේ ඇන්ටන් මොරන්ස් පෙරේරා සහ වර්ණකුලසූරිය පරණ පටබැඳිගේ ඇනෙක්ස්ටා මේරි කමලා ප්‍රනාන්දු යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හැත්තෑ ලක්ෂ දහහතර දහස් හයසිය අසූදෙකයි ශත විසි හතක (රු.70,14,682.27) මුදලක්, 2005 ජුනි 17 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 70,14,682.27 මුදල ද, 2005 ජුනි 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 124, 383, 469, සහ 568 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**1 වැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ, ඒකල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1980.07.17 දිනැති අංක 5573 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඇලෙක්සැන්ඩ්‍රා එස්ටේට් ලොට් 1ඒ දරන ඉඩමේ ලොට් ඒ ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ලොට් බී ද, දකුණට : ලොට් ඩී සහ බස්නාහිරට : අංක : 3567 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, යන මායිම් තුළ පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 0, පර්. 22) විශාල, ඉඩම, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/62/287 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ඒකල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1980.07.17 දිනැති අංක 5573 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඇලෙක්සැන්ඩ්‍රා එස්ටේට් ලොට් 1 ඒ දරන ඉඩමේ ලොට් ඩී ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : ලොට් බී සහ සී ද, දකුණට : ලොට් ඊ සහ බස්නාහිරට : ලොට් බී ද, යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/62/292 හි ලියාපදිංචි කර ඇත.

අංක 5575 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගම්සභා පාර සහ ලොට් එස් සහ බී උඩින් මාර්ග අයිතිය සමග සහ එහි පිහිටි ගස්, වගා සහ සියලු දේ සමග.

**2 වැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ ජාඇල නගර සභා සීමාව තුළ තුඩැල්ල පිහිටි විජය පටුමග වරිපනම් අංක 10 දරන බක්මීගහවත්ත නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජේ. පෙරේරා විසින් සාදන ලද 2001.02.07 දිනැති අංක 1229 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : එස්. ආර්. පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : කේ. පාවුලු පෙරේරා සහ තවත් අයගේ සහ ජුසේ පෙරේරා සහ තවත් අයගේ ඉඩම් ද, දකුණට : ගම මැද පාර පටුමග සහ බස්නාහිරට : ඇන්ටනී පෙරේරා, එස්. අයි. නානායක්කාර, එම්. ඒ. සී. ස්ටෙම්බු, එස්. රුද්‍රිගු, ජේ. රුද්‍රිගු ඒ. එම්. කේ. පෙරේරා සහ එස්. ආර්. පෙරේරා යන අයගේ ඉඩම් ද, යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසි හයක් (අ. 0, රූ. 3, පර්. 26) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය - සාමාන්‍යාධිකාරී - නීති

10-968

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංක : HPL/KWA/11/13 (600140000300) 11%.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.25 වැනි දින පවත්වන ලද මාණ්ඩලික රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත වූ පරිදි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. කොස්වත්ත විසින් ලියා සහතික කරන ලද අංක 5043 සහ 2005.02.07 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් උකස්කරු වන කැකිරාව, උසාවිය පාරේ, පදිංචි අකුරුස්ස හේවගේ විමලසිරි මහතා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2009.10.21 වැනි දිනට රුපියල් හයලක්ෂ පනස් අටදහස් එකසිය හැත්තෑ අටයි ශත හැත්තෑ එකක් (රු. 6,58,178.71) මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හයලක්ෂ පනස් අට දහස් එකසිය හැත්තෑ අටයි ශත හැත්තෑඑකක (රු. 6,58,178.71) මුදල සහ 2009.10.21 දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට එකොළහේ (11%) පොළිය ද, ප්‍රචාරක වියදම් ද දරන ලද ගාස්තු හා සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව අයකර ගත හැකි මුදල ද ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල් ද අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5043 උකස් බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ සහ පරිශ්‍රය බලයලත් ප්‍රසිද්ධ වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන පනත මගින් පැවරී ඇති බලතල යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ඇත.

#### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, දකුණු කලාගම් කෝරළේ, කලාගම් පළාතේ වැව්තුලානේ කැකිරාව ප්‍රාදේශීය සභා බල සීමා තුළ සෙක්කුපිටිය පාරේ පිහිටි "පස්ඉස්සර" නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් මැන සාදන ලද 2001.05.26 දිනැති අංක 5730 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කළ බිම් කට්ටිය වන පර්චස් 15ක (අ. 0, රූ. 0, පර්. 15) විශාලත්වයක් ඇති ලොට් 17 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 14 ද, නැගෙනහිරට : එම් තිලකරත්න මහතාගේ ඉඩම ද, දකුණට : ලොට් අංක 18 ද, බටහිරට : ලොට් අංක 03 ලෙස දක්වා ඇති මාර්ගය ද, යන මායිම් තුළ පිහිටි අක්. 0, රූ. 0, පර්. 15 හෝ හෙකටයාර් 0.3793 ක වපසරියකින් යුතු ඉඩම සමග ඇති ගොඩනැගිලි, ගහකොළ ඇතුලු සියලු දේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/64/339 යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරුපත් අංක 5730 හි ලොට් අංක 03 ලෙස දක්වා ඇති මාර්ග රක්ෂිතයේ මාර්ග අයිතිය ද සහිතව ය.

සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා ණය),
ජාතික ඉතිරි කිරීමේ බැංකුව.

2009 අගෝස්තු මස 20 වැනි දින,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

10-971

### මහජන බැංකුව - අහංගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.12.17 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. මුදිතා පීරිස් විසින් 1997.06.12 දින ලියා සහතික කරන ලද අංක 916, 1998.07.06 දින ලියා සහතික කරන ලද අංක 1484 හා 1999.11.12 දින ලියා සහතික කරන ලද අංක 2540 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සමරකෝන් විදාන මුහන්දිරම්ගේ චන්ද්‍රදාස අල්විස් විජේවික්‍රම නොහොත් චන්ද්‍රදාස අල්විස් විජේවික්‍රම යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් පනස් පන් දහස (රු. 55,000), රුපියල් හැත්තෑ දහස (රු. 70,000) ක සහ රුපියල් එක්ලක්ෂ හැටදහස් දෙසිය (රු. 1,60,200) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.06.05 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් පනස්පන් දහසක (රු. 55,000) 2007.06.7 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් හැත්තෑ දහස (රු. 70,000) ක සහ 2007.02.15 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් එක්ලක්ෂ හැටදහස් දෙසියක (රු. 1,60,200) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස් පන්දහස (රු. 55,000), රුපියල් හැත්තෑ දහසක (රු. 70,000) සහ රුපියල් එක්ලක්ෂ හැටදහස් දෙසීයක (රු. 1,60,200) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 916, 1484 සහ 2540 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, පියදිගම හතුව පිහිටි තල්ගහවත්ත නමැති ඉඩමේ බටහිර කොටස බෙදූ කැබලි අංක 1 සඳහා බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන මහතා විසින් 1985.04.24 දින මැන සකස් කරන ලද අංක 123 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ගලගාව වත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම නැගෙනහිර කැබැල්ල වෙන් වන පාර (වඩාත් නිවැරදිව පාර සහ තල්ගහවත්ත) ද, දකුණට : මූදිල්ලා ගහ වත්ත ද, බස්නාහිරට : විදානගෙයි වත්ත ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් එකොලහයි දශම හතයි දෙකක් (අ. 0, රූ. 1, පර්. 11.72) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, වැවිලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩමේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 711/238 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

10-1104

## මහජන බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2006.07.31 දිනැති අංක 7631 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ඩික්සන් ජයවීර මහතා, සහ වීරක්කොඩි ආරච්චිගේ වජිරා මහත්මිය යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී අංක 7631 දරන උකස්කරය යටතේ දැනට රුපියල් දහඅටලක්ෂ හැත්තෑ හත්දහස් හයසිය හැත්තෑ පහයි ශත පනස් එකක (රු. 18,77,675.51) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින් ද, එම මුදල සහ එකී දහඅටලක්ෂ හැත්තෑහත් දහස් හයසිය හැත්තෑ පහයි ශත පනස් එකක (රු. 18,77,675.51) මුදල සඳහා 2008.05.01 දින සිට වර්ෂකයට 20.5% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් 2006.07.31 දින සහතික කළ අංක 7631 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභා සීමාවේ නුගේගොඩ ස්ටැන්ලි තිලකරත්න මාවතේ පිහිටි දෙල්ගහවත්ත නම් ඉඩමේ කොටසකට බලයලත් මානක සී. එච්. ඩයස් අබේගුණවර්ධන මහතා විසින් මැන සම්පාදිත අංක 791 සහ 1989.09.30 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 වශයෙන් දක්වා ඇති මායිම්, උතුරට : ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 182/2 සහ 182/2ඒ දරන දේපළ ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 02 ද, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 05 ද, බස්නාහිරට : ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 182/1 දරන දේපළ ද යන මායිම් තුළ පිහිටි පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 07) විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමග බිම සහ එහි තුළ තිබෙන නිවස ඇතුළු සියළුම දේ ද වේ.

මෙය ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ එම් 2862/37 හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාවේ නුගේගොඩ ස්ටැන්ලි තිලකරත්න මාවතේ පිහිටි දෙල්ගහවත්ත නම් ඉඩම සම්බන්ධයෙන් වූ අංක 38 පිඹුරේ "2ඒ " සහ "2බී" දරන කැබලි සම්බන්ධයෙන් බලයලත් මානක සී. එච්. ඩයස් අබේගුණවර්ධන මහතා විසින් මැන සම්පාදිත අංක 791 සහ 1989.09.30 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 04 වශයෙන් දක්වා ඇති කොටසට මායිම්, උතුරට : කැබලි අංක 02 ද, නැගෙනහිරට : කැබලි අංක 03 ද, දකුණට : ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 182/3 ද. බස්නාහිරට : කැබලි අංක 05 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දශම හයයි හයක් (අ. 0, රූ. 0, පර්. 0.66) විශාල බිම් තීරයේ පොදු මාර්ග අයිතිය සහ ජලනළ, දුරකථන සහ වෙනත් පහසුකම් ලබාගැනීමේ පොදු අයිතිය ද වේ, මෙය ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ එම්. 1750/113 හි ලියාපදිංචි කර ඇත.

3. යථෝක්ත ඉඩමේ යථෝක්ත අංක 791 දරන පිඹුරේ අංක 05 දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 1 සහ 2 දරන කැබලි ද, නැගෙනහිරට : අංක 04 සහ ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 182/3 දරන දේපළ ද, දකුණට : පාර ද, බස්නාහිරට : ස්ටැන්ලි තිලකරත්න මාවතේ අංක 182/1 දරන දේපළ ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම හතයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 2.72) විශාල බිම් තීරයේ පොදු මාර්ග අයිතිය සහ ජලනල විදුලි දුරකථන සහ වෙනත් පහසුකම් ලබා ගැනීමේ පොදු අයිතිය ද වේ, මෙය ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ එම්. 1750/269 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාපය - 01.

කලාපීය ප්‍රධාන කාර්යාලය, (බටහිර කළාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

10-1107

---

## මහජන බැංකුව - බුත්තල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න මහතා විසින් සහතික කරන ලද 2004.03.04 දිනැති අංක 5939, 2006.08.28 දිනැති අංක 7145 සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ඩබ්. ආර්. විමලගුණරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2008.04.21 දිනැති අංක 197 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් දිසානායක මුදයන්සේලාගේ අනුරසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද සහ එකී අංක 5939, 7145 සහ 197 දරන උකස්කර යටතේ රුපියල් දසලක්ෂ හතලිස් නවදහස් අටසිය පනස් හතයි ශත හැත්තෑ හතක් (රු. 10,49,857.77), රුපියල් දාහතර ලක්ෂ පනස් හත් දහස් හයසිය විසි අටයි ශත හතලිස් හතක් (රු. 14,57,628.47) සහ රුපියල් නවලක්ෂ හැත්තෑදහසක (රු. 9,70,000) ක් මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද එකී රුපියල් දසලක්ෂ හතලිස් නවදහස් අටසිය පනස් හතයි ශත හැත්තෑහතක් (රු. 10,49,857.77) සඳහා 2008.09.30 දින සිට සියයට පහළොවයි දශම පහක් (15.5%), රුපියල් දාහතර ලක්ෂ පනස් හත් දහස් හයසිය විසි අටයි ශත හතලිස් හතක් (රු. 14,57,628.47) සඳහා 2008.06.26 දින සියයට දහනවයයි දශම හතයි පහක් (19.75%) සහ රුපියල් නවලක්ෂ

හැත්තෑදහසක් (රු. 9,70,000) සඳහා 2008.09.19 වැනි දින සියයට විසිහය (26%) බැගින් පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, වෙන්දේසි ගාස්තුව ද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් එවා ද අඩු කරගෙන අදාල මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 5939, 7145 සහ 197 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද අංක 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ පහළගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පහළගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාලත්වය ඇති පහත පරිදි මායිම් වූ රජයේ ඉඩම, උතුරට : මාර්ග රක්ෂිතය ද, නැගෙනහිරට : කේ. එම්. රන්බණ්ඩාගේ ඉඩම ද, දකුණට : ඩී. ඒ. එම්. ජයසිංහගේ ඉඩම ද සහ බස්නාහිරට : නයනා කුමාරි දිසානායකගේ ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියලු දේත් වේ.

ඉහත ඉඩම බණ්ඩාරවෙල බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. නන්දසේන මහතාගේ 2001.01.06 දිනැති අංක 2556 දරන පිඹුරුපතේ ද පෙන්නුම් කෙරෙන අතර ලොට් 1 වශයෙන් සලකුණු කරනු ලැබ පහත පරිදි විස්තර කෙරේ.

ඉහත කී ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළගම නමැති ගමේ පිහිටි "පහළගම" නමැති රජයේ ඉඩම් කොටසට මායිම්, උතුරට : දෙල්ගහවත්ත - බෝගස්හන්දිය පාර දිගට රක්ෂිතය ද, නැගෙනහිරට : කේ. එම්. රන්බණ්ඩා හිමිකම් කියන ඉඩම ද, දකුණට : ඩී. ඒ. එම්. ජයසිංහ හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : නයනා කුමාරි දිසානායක හිමිකම් කියන ඉඩම ද, යන මායිම් තුළ පිහිටි අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියළු දේත් වේ.

ඉහත ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/M 75/226 දරන පත් ඉරුවේ ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

10-1106

---

### මහජන බැංකුව - මොණරාගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න මහතා විසින් සහතික කරන ලද 2005.04.07 දිනැති අංක 6390 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අරුමාදුර උපාලි සරත්චන්ද්‍ර සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 6390 දරන උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ හැටහතරදහස් හයසිය පහයි ශත හතලිස් හතරක් (රු. 4,64,605.44) මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, එකී රුපියල් හාරලක්ෂ හැටහතරදහස් හයසිය පහයි ශත හතලිස් හතරක් (රු. 4,64,605.44) සඳහා 2008.06.11 වැනි දින සිට සියයට පහළොවයි දශම හතයි පහ (15.75%) බැගින් පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, වෙන්දේසි ගාස්තුව ද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවා ද අඩු කරගෙන අදාල මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 6390 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළින් පහත දෙවන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද අංක 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

#### 1 වැනි උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට මොණරාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ විහාරමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෙරන්හාන නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාලත්වය ඇත්තා වූ ද, උතුරට : පී. ගුරුසිංහගේ සිරිල් අත්තනායක, කේ. එම්. ආරියවතී හා එච්. එම්. විජේරත්න හිමිකම් කියන ඉඩම් ද, නැගෙනහිරට : සෙනෙවිරත්නගේ ඉඩම ද, දකුණට : දුටුගැමුණු පළමු පටුමග රක්ෂිතය ද සහ බස්නාහිරට : කේ. එම්. හීන්බණ්ඩාගේ ඉඩම ද මායිම් වූ දුටුගැමුණු පාර, පළමු පටුමගේ වරිපනම් අංක 41 දරන රජයේ ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් වේ.

ඉහත ඉඩම මාතර බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටඹගේ මහතා විසින් මැන සකස් කරන ලද 2002.01.26 දිනැති අංක MO/1538 දරන පිඹුරුපතේ ද පෙන්නුම් කෙරෙන අතර ලොට් අංක 01 වශයෙන් සලකුණු කරනු ලැබ පහත අයුරින් ද විස්තර කෙරෙ :-

ඉහත කී ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුප්පනේ ගම පිහිටි "පොල්ලන්දේකනත්ත" නමැති F. V. P. 172හි ලොට් අංක 1090වූ, උතුරට : F. V. P. 172හි ලොට් අංක 1077 දරන පාර සහ ලොට් අංක 1083 ද, නැගෙනහිරට : F. V. P. 172හි ලොට් අංක 1083 සහ ලොට් අංක 1089 ද, දකුණට : F. V. P. 172හි ලොට් අංක 1094 සහ ලොට් අංක 1093 2/2 ද, බස්නාහිරට : F. V. P. 172හි ලොට් අංක 1093 2/2 සහ ලොට් අංක 1077 (පාර) ද මායිම් වූ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විස්සයි දශම අටයි හතක් (අ. 1, රූ. 3, පර්. 20.87) නොහොත් හෙක්ටයාර් බින්දුවයි දශම හතයි හයයි එකක් (හෙක්. 0.761) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියළු දේත් වේ.

ඉහත ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/39/209 දරන පත් ඉරුවේ ලියාපදිංචිව ඇත.

#### 2 වැනි උපලේඛනය

ඉහත සඳහන් ඉඩම මොණරාගල බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ මහතා විසින් 2006.05.20 වැනි දින මැන සකස් කරන ලද අංක

3217 දරන සැලැස්ම ප්‍රකාරව දැනට කැබලි අංක 2, 3. 4, 5, 6 සහ 7 දරන පාර කැබැල්ල ලෙස කොටස් කර ඇති අතර එකී කැබලි අතුරින් කැබලි අංක 2, 3, 4, 5, 6 සහ 7 කැබලි අත්හැර ඉතිරි කැබැල්ල වන ඉහත කී අංක 3217 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 ලෙස පහත විස්තර කර ඇති ඉඩම මෙම ණය මුදල ප්‍රකාරව වෙන්දේසි කරනු ලැබේ.

ඉහත කී ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළයේ මුප්පනේ ගම පිහිටි "පොල්ලන්දේකනත්ත" නමැති ඉඩමට මායිම්, උතුරට : දුටුගැමුණු පළමු පටුමග සහ ලොට් අංක 7 ද, නැගෙනහිරට : ලොට් අංක 7, 2 සහ සෙනෙවිරත්නගේ ඉඩම ද, දකුණට : සෙනෙවිරත්න සහ කේ එම්. හීන්බණ්ඩාගේ ඉඩම් ද, බස්නාහිරට : කේ. එම්. හීන්බණ්ඩාගේ ඉඩම සහ දුටුගැමුණු පළමු පටුමග ද මායිම් වූ අක්කර එකයි රූඩ් එකයි පර්චස් දාහත (අ. 1, රූ. 0, පර්. 17) නොහොත් හෙක්ටයාර් බින්දුවයි දශම පහයි හතරයි අටයි නවය (හෙක්. 0.5489) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

10-1105

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ මොරවක් කෝරළයේ, සියඹලාගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ. ග. පි. 12හි අංක 14 දරන පලුවත්තේහේන නම් වූ, උතුරට : අ. ග. පි. 12හි අංක 14ඩී, 15 සහ 17 දරන කැබලි ද, නැගෙනහිරට : අ. ග. පි. 12හි අංක 14අයි දරන කැබැල්ල සහ ගම ද, දකුණට : අ. ග. පි. 12හි අංක 14එෆ් දරන කැබැල්ල ද, බස්නාහිරට : අ. ග. පි. 12හි අංක 14-ඊ දරන කැබැල්ල ද, මායිම් වූ අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිස් හයක් (අ. 0, රූ .3, පර්. 36) පමණ විශාල ඉඩමේ මුලුබිම ඒ තුළ පිහිටි සියලු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය සමග වේ (මො. කො. බ. 3/40).

මෙම දේපළ මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අං. 13/61, 62 වං 08 - 128 යටතේ 2007.01.02 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අගෝස්තු මස 14 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

10-1032/2

---

### රුහුණ සංවර්ධන බැංකුව - පිටබැද්දර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශේෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2009.08.14 වැනි දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුවේ නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මොහොන් එල්. ජී. ගමාච්චිගේ මහතා විසින් සහතික කරන ලද 2006.12.29 දිනැති අංක 6223 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පිටබැද්දර, සියඹලාගොඩ (බටහිර) "සමන් සෙවණ" ලිපිනයේ පදිංචි අබේවික්‍රම පහුරුතොටගේ සමන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ පන්දහසක (රු. 2,05,000) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008.09.30 වැනි දින සිට වර්ෂයකට 24.5% බැගින් රුපියල් දෙලක්ෂ පන්දහසක (රු. 2,50,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 6223 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

---

### රුහුණ සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව

1990 අංක 04දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශේෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2009.08.14 වැනි දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2008.06.25 දිනැති අංක 5146 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "මහේෂ් " තුන්නවැල්ල, ගන්දර ලිපිනයේ පදිංචි අබේගුණරත්න වීරසේකර මහවිදානගේ අනුර ප්‍රසන්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දහහත්දහස් තුන්සීයයක මුදලක් (රු. 3,17,300) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008.09.15 වැනි දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් තුන්ලක්ෂ දහහත්දහස් තුන්සීයයක මුදලක් (රු. 3,17,300) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 5146 දරන උකස්කරය යටතේ

බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, ගන්දර ගමේ පිහිටි වරාකැටියදෙනිය නමැති ඉඩමට මාතර දිසා අධිකරණයේ පැවති අංක ඩී. සී. 5946 නඩුවෙන් බෙදා වෙන් කළ "ඒ " අක්ෂරය දරන කැබැල්ල බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාගේ අංක 1469ඒ 2006.09.01 දින දරන සැළැස්ම ප්‍රකාර බෙදා වෙන් කළ 1ඒ අක්ෂරය දරන කැබැල්ල උතුරට : මෙම සැළැස්මේ බෙදා වෙන් කළ 1බී අක්ෂරය දරන කැබැල්ල, නැගෙනහිරට : අත්මග ද, දකුණට : වරාකැටිදෙනිය බෙදා වෙන් කල "බී" අක්ෂරය දරන කැබැල්ල ද, බටහිරට : නුත්තවැල්ල පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 16.90) ක් විශාල ඉඩමක්, ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියලු දේ සම්පූර්ණයෙන්ද වේ.

මෙම ඉඩම බී 621/184 හි වං 42/49 හි 2008.06.25 දින මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 අගෝස්තු මස 14 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

10-1032/1

---

### සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. එන්. සී. ජයකොඩි විසින් ලියා සහතික කරන ලද අංක 497 හා 2008 ජනවාරි මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, කුලියාපිටියේ, හේරත් මුදියන්සේලාගේ අනුර වීරසිරි හේරත් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජූනි මස 30 වැනි දිනට ඉහත කී අංක 497 උකස් බැඳුම්කරය මත එකී හේරත් මුදියන්සේලාගේ අනුර වීරසිරි හේරත් යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් දහහතර ලක්ෂ අසූහතර දහස් හැත්තෑපහකුත් ශත අසූතුනක (රු. 14,84,075.83) මුදලක් සහ 2009 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, රුපියල් නවලක්ෂ විසිඅටදහස් තුන්සිය හතරකුත් ශත දහනවයක් (රු. 9,28,304.19) සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් සහ රුපියල් හාරලක්ෂ පනස් දහසක් (රු. 4,50,000) සඳහා වර්ෂයකට සියයට විසිඅට (28%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දාහතර ලක්ෂ අසූහතර දහස් හැත්තෑපහකුත් ශත අසූතුනක (රු. 14.84,075.83) මුදලක් සහ 2009 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, රුපියල් නවලක්ෂ විසිඅටදහස් තුන්සිය හතරකුත් ශත දහනවයක් (රු. 9,28,304.19) සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් සහ රුපියල් හාරලක්ෂ පනස් දහසක් (රු. 4,50,000.00) සඳහා වර්ෂයකට සියයට විසිඅට (28%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනය එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 497 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 497 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, දකුණු යටිකහ කෝරළේ, ඉහල හග්ගමුවේ පිහිටි බෝගහමුලවත්ත යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු ආර්. එච්. චන්ද්‍රරත්න විසින් මැන සකස් කරන ලද අංක 1934 හා 2000 පෙබරවාරි මස 02 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන ලොට් අංක 01 ලකුණු කළ බිම් කට්ටියට එකී අංක 1934 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : කලින් පුංචප්පුහාමිට සහ තවත් අයට අයිතිව තිබුණු දැනට එච්. එම්. වීරසිංහට අයිති ඉඩම සහ කලින් රන්හාමිට අයිතිව තිබුණු දැනට එච්. එම්. වීරසිංහට අයිති ඉඩම සහ කලින් රන්හාමි ආරච්චිට අයිතිව තිබුණු දැනට එම්. ඒ. රේමන්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : පාර සහ බස්නාහිරට : කලින් පුංචප්පුහාමිට සහ තවත් අයට අයිතිව තිබුණු දැනට එච්. එම්. වීරසිංහට අයිති ඉඩම සහ කලින් රන්හාමි ආරච්චිට අයිතිව තිබුණු දැනට එම්. ඒ. රේමන්ට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් විසිතුනයි දශම දෙකක් (අ. 0. රූ. 1, පර්. 23.2) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහ එයට ආබද්ධ සියලු දේ. මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව් ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-1073/8

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් ලියා සහතික කරන ලද අංක 7952 හා 2006 මාර්තු මස 23 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, "සුජීව ලී වෙළඳසැල" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන මොරටුවේ, මඩප්පුලි ආරච්චිගේ අජන්ත සුජීව ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද. 2009 අප්‍රේල් මස 30 වැනි දිනට, ඉහත කී අංක 7952 දරන උකස් බැඳුම්කරය මත ඉහත කී මඩප්පුලි ආරච්චිගේ අජන්ත සුජීව ප්‍රනාන්දු යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි හයලක්ෂ නව දහස් නවසිය අසූහතකුත් ශත හැත්තෑහයක (රු. 1,06,09,987.76) මුදලක් සහ 2009 මැයි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අනූපන්ලක්ෂ අනූතුන් දහස් හයසිය හතලිස් තුනකුත් ශත පනහක් (රු. 95,93,643.50) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි හයලක්ෂ නව දහස් නවසිය අසූහතකුත් ශත හැත්තෑහයක (රු. 1,06,09,987.76) මුදලක් සහ 2009 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් අනූපන්ලක්ෂ අනූතුන් දහස් හයසිය හතලිස් තුනකුත් ශත පනහක් (රු. 95,93,643.50) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මිට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි යන්ත්‍රසූත්‍ර විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 7952 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ යන්ත්‍රෝපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 7952 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව ඇතුළත, කටුකුරුන්දේ පිහිටි, කටුකුරුන්ද පාර වරිපනම් අංක 25/4 දරන ගොරකගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. සී. ආර්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2181 හා 1988 නොවැම්බර් මස 11 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 04 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 5 සහ අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කළ බිම් ද, නැගෙනහිරට : ලොට් අංක 5ඒ සහ පානදූරා ගඟ ද, දකුණට : කටුකුරුන්ද පාර වරිපනම් අංක 29 ද, බස්නාහිරට : කටුකුරුන්ද පාර වරිපනම් අංක 29 සහ 25ඒ ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 2181 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සකුත් දශම හතරයි පහක් (අ. 0, රූ. 0, පර්. 20.45) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙයට පහත විස්තර කරන ඉඩම මතින් මාර්ග අයිතියද ඇතුළත් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව ඇතුළත, කටුකුරුන්දේ පිහිටි, ගොරකගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. බී. කේ. සිල්වා විසින් මැන සාදන ලද අංක 1170 හා 1986 නොවැම්බර් මස 12 දින දරන පිඹුරේ (පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 02 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 01 ද, නැගෙනහිරට සහ දකුණට : පී. ආර්. සී. පීරිස්ට අයිති මෙම ඉඩමේ කොටසක් ද, බස්නාහිරට : ටී. එස්. පී. පීරිස්ට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත එකී අංක 1170 දරන පිඹුර ප්‍රකාර පර්චස් තුනකුත් දශම හතක් (අ. 0, රූ. 0, පර්. 3.07) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

තව ද අංක 342 දරන පිඹුරේ දැක්වෙන (අඩි 12ක් පළල) පාරක් සඳහා වෙන් කළ බිම තුළින් සහ මතින් මාර්ග අයිතිය ද මෙයට ඇතුළත් වේ.

ඩීඑෆ්සීසී බැංකුවට උකස් කළ යන්ත්‍රසූත්‍ර ලැයිස්තුව

| *කොටස* | *සංකේතය* |
|---|---|
| කාර්මික ලී මෝල | LT 300 |
| ලොග් ඉන්ෆීඩ් ඩෙක් | LD 20-1 |
| ලොග් ඩෙක් | LT 300 KIT |
| කන්වේයර් | IC2 - H |
| ට්‍රාන්ස්ෆර් ඩෙක් | TD -2 |
| ෂාප්නර් ඇසෙම්බ්ලි | LTAGA FCBN |
| එජර් | EE 15 |

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-1073/9

---

**රුහුණ සංවර්ධන බැංකුව - පිටබැද්දර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින

දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2009.08.14 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මොහාන් එල්. ජී. ගමාච්චිගේ විසින් සහතික කරන ලද 2008.08.28 දිනැති අංක 7117 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පිටබැද්දර, සියඹලාගොඩ (බටහිර), කණ්නාඩිමුල්ල ලිපිනයේ පදිංචි අහංගම විතානගේ ගුණදාස සහ අහංගම විතානගේ නිහාල් යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් අටසියයක (රු.245,800) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008.10.15 දින සිට වර්ෂයකට 30% බැගින් රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් අටසියයක (රු.245,800) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 7117 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලාගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සියඹලාගොඩ ගමේ පිහිටි අගපි 12 හි නිරූපිත රජයේ බිම් කැබැල්ලක් නම් වූ උතුරට : ඒ. බී. ජේම්ස්ගේ ඉඩම සහ එච්. එල්. ජිනදාසගේ ඉඩමද, නැගෙනහිරට : මැන වෙන් කරන ලද පාරද, දකුණට : මැන වෙන් කරන ලද පාරද, බස්නාහිරට : නිල්වලා ගඟ රක්ෂිතයද, මායිම්වූ අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් විස්සක් (අක් 01, රූඩ්.03, පර්. 20) ක් පමණ විශාල ඉඩමේ මුළු බිම, ඒතුල පිහිටි සියලු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය සමග වේ. (මාර/05/ප්‍ර/42343 සහ 2000.11.06)

ඉහත කී ඉඩම අ.ග.පි. 12 හි පත්‍ර අංක 07 හි පහත පරිදි නිරූපනය වේ. ඉහතකී සියඹලාගොඩ ගමේ පිහිටි අ.ග.පි. 12 දරන පිඹුරට අනුව බෙදූ අංක : 20 - ඕ දරන කැබැල්ල නම් වූ උතුරට : අංක : 20 ජී දරන කැබැල්ලද, නැගෙනහිරට සහ දකුණට : අංක 20 එන් දරන පාරද, නිරිතට අංක : 20 පී දරන කැබැල්ලද, වයඹට අංක : 20 එෆ් දරන කැබැල්ලද, මායිම්වූ අක්කර එකයි, රූඩ් 03 යි, පර්චස් විස්සක් (අක්කර 01, රූඩ් 3, පර්. 20) විශාල ඉඩමේ මුළු බිම, ඒතුල පිහිටි සියලු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය සමග වේ.

මෙම දේපල මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බ/7/67/වං 09/109 යටතේ 2008.08.29 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ.
සාමාන්‍යාධිකාරී,

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන, මාතර.
2009 අගෝස්තු 14 වැනි දින.

10-1032/4

---

### මහජන බැංකුව - පානදුර නගර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකුව පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ද සිල්වා විසින් සහතික කරන ලද 2008.03.26 දිනැති අංක 2372 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර ගෙවීම් ගෝනියමාලිමගේ නෙල්සන් පියසේන අපොන්සු මහතා, අරුමාදුවගේ යෝලින් මිය, ගෝනියමාලිමගේ අරුණ ශාන්ත අපොන්සු මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද එකී උකස් බැඳුම්කරයන් යටතේ දැනට රුපියල් නව ලක්ෂ හැට හයදහස් දෙසීය හැට හතයි ශත දොළහක (රු.966,267.12) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද 2008.10.02 දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට 27% බැගින් රුපියල් නව ලක්ෂ හැට හයදහස් දෙසීය හැට හතයි ශත දොළහක (රු. 966,267.12) මුදලක් සඳහා තවදුරටත් පොලියද ගාස්තු සමග අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29D) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු ගාස්තු හා මුදල්ද අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් නව ලකෂ හැට හයදහස් දෙසීය හැට හතයි ශත දොළහක (රු.966,267.12) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 2372 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ (29D) වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 499/41 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ සල්පිටි දෙබැද්දේ පානදුර නගර සභා සීමාව තුළ වළානහි පිහිටි මාරගහවත්ත නම්වූ ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කරුණාරත්න විසින් මැන සාදන ලද 1985.03.23 දින අංක 377 දරන පිඹුරේ ලොට් අංක 1 වශයෙන් නිරූපනය කර ඇති කොටසේ ලොට් 1බී යනුවෙන් ලකුණ කර ඇති ඉඩමට මායිම් උතුරට : ලොට් 1 ඒ නැගෙනහිරට : එස්. කේ. ගුණවර්ධනගේ වැලිපිට වත්ත සහ ශ්‍රී චන්ද්‍රසේකරගේ එම ඉඩමේම කොටසක් දකුණට : ශ්‍රී චන්ද්‍රසේකරගේ එම ඉඩමේම කොටසක් සහ අංක 975 දරන බෙදුම් පිඹුරේ ලොට් අංක 2 සහ බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා වූ මහා මාර්ගය සහ මායිම්තුළ පිහිටියා වූද ප්‍රමාණයෙන් පර්චස් 11.75 ක්වූද (අක්. 0, රූඩ්. 0, පර්. 11.75) ක් විශාල ඉඩමේ සම්පූර්ණ බිම් සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි ආදී සියළු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

නිර්දේශ කිරීම
සහකාර ප්‍රාදේශීය කළමනාකරු

ප්‍රාදේශීය කළමනාකරු,
(කළුතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341 ගාලු පාර,
පානදුර.

10-1103

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.09 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් එඩ්මන්ඩ් කුලරත්න විසින් සහතික කරන ලද 2007.10.24 දිනැති අංක. 11996 දරන උකස් බැඳුම්කරය මත ණය ගිණුම මත මුල් මුදල හා 2009.04.21 වෙනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් පන්ලක්ෂ විසිහයදහස් හාරසිය පහයි ශත අනූපහක (රු.5,26,405.95) මුදලක් සහ අයිරා ගිණුම මත රුපියල් හාරලක්ෂ හතලිස් හතර දහස් එකසිය හැත්තෑ නවයයි ශත හැට එකක (රු.4,44,179.61) මුදලක් සමග ණය ගිණුම මත රුපියල් තුන්ලක්ෂ අනූ එක් දහස් තුන්සිය අනූවක (රු. 3,91,390) මුදලක් සහ අයිරා ගිණුම මත රුපියල් තුන්ලක්ෂ තිස්අට දහසක (රු.3,38,000) මුදලක් මත වසරකට පිළිවෙලින් සියයට විසිඅටයි දශම පහයි බිංදුවක (28.50%) සහ සියයට විසිපහයි දශම පහයි බිංදුවක (25.50%) පොලියක්ද 2009.04.22 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් උහුමීය, වේවැල්පොල, ගුණසෙවන, අංක 268 හි පදිංචි වික්‍රමසුන්දර වනිගසූරිය මුහන්දිරම්රාලලාගේ නිරංජන සසංක බණ්ඩාර කුඹුරාදෙණිය මහතාගෙන් සහ අතපත්තු මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකේ මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී අංක 11996 දරන බැඳුම්කරය මත අයවිය යුතු ඉහත සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාර, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණියහත්පත්තුවේ, රැකෝපත්තු කෝරළේ, වේවැල්පොල ග්‍රාමයේ පිහිටි අලුදෙනිය වත්ත, කෝන්ගහමුල වත්ත සහ නුගගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සාදන ලද 1998.10.31 දිනැති අංක. 113/98 දරන පිඹුරෙහි ලොට් 09 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 09 උතුරට: එකී පිඹුරෙහි ලොට් 02, 04, 05, 06 සහ 07 ද, නැගෙනහිරට : ඒ. එම්. ගුණතිලක සහ වෙනත් අය උරුමකම් කියන වේවැන්දරිගේ වත්ත සහ ඒ. එම්. බණ්ඩාර මැණිකේ උරුමකම් කියන ගලගාව හිටින වත්ත ද, දකුණට: ආර්. එම්. ගුණතිලක උරුමකම් කියන ගනේලන්ද හා ආර්. එම්. ටිකිරිබණ්ඩා උරුමකම් කියන ඉඩම ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 01 ද, මායිම්ව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් එකයි දශම පහයි බිංදුවක (අ. 1, රූ. 2, පර්. 1.50) වපසරියකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, නිවෙස සහ ගොඩනැගිල්ලද වේ. (මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F1131/83A ශීර්ෂය යටතේ ලියාපදිංචි කරන ලදුව පසුව එය F1131/249 වෙත ගෙනගොස් ඇත.)

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, රැකෝපත්තු කෝරළේ, වේවැල්පොල පිහිටි අලුදෙණිය වත්ත, කෝන්ගහමුල වත්ත සහ නුගගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සාදන ලද 1998.10.31 දරන අංක. 113/98 දරන පිඹුරෙහි අඩි 12 ක් පළල පාරක් වූ ලොට් 03 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : නන්දා කුමාරි විජේරත්න උරුමකම් කියන වීකොටුව, එච්. එම්. විජේතුංග උරුමකම් කියන ඉඩම, එච්. එම්. ටිකිරි බණ්ඩා සහ එච්. එම්. සුධර්මා හේරත් සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, ප්‍රාදේශීය සභා පාරද, එච්. එම්. කරුණාවතී සහ අනෙක් අය උරුමකම් කියන ඉඩම ද, නැගෙනහිරට: එච්. එම්. කරුණාවතී සහ වෙනත් අය උරුමකම් කියන ඉඩමද, දකුණට: එකී පිඹුරෙහි ලොට් අංක 08, 07,06, 05. 04 සහ 02 ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 1 ද, මායිම්ව පර්චස් විසිහතරක් (අ. 0, රූ. 0, පර්. 24) වපසරියකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, නිවෙස සහ ගොඩනැගිල්ල ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, F1131/82B ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

03. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, රැකෝපත්තු කෝරළේ, වේවැල්පොල පිහිටි අලුදෙණියවත්ත, කෝන්ගහමුලවත්ත, සහ නුගගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සාදන ලද 1998.10.31 දිනැති අංක. 113/98 දරන පිඹුරෙහි පාරක්වූ ලොට් 5 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම කැබැල්ල, එනම් එකී ලොට් 5 උතුරට : එකී පිඹුරෙහි ලොට් 03 ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් 06 ද, දකුණට : එකී පිඹුරෙහි ලොට් 09ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 04 ද, මායිම්ව පර්චස් දාසයක (අ. 0, රූ. 0, පර්. 16) වපසරයකින් යුක්තවන අතර එහි ඇති සියළු දේද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F1131/83B ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

04. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, රැකෝපත්තු කෝරළේ, වේවැල්පොල පිහිටි අලුදෙණිය වත්ත, කෝන්ගහමුල වත්ත සහ නුගගහමුල වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සාදන ලද 1998.10.31 දිනැති අංක. 113/98 දරන පිඹුරෙහි පාරක්වූ ලොට් 08 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 08 උතුරට : එකී පිඹුරෙහි ලොට් 3 ද, නැගෙනහිරට : එච්. එම්. කරුණාවතී සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, එච්. එම්. බණ්ඩාර මැණිකේ සහ එච්. එම්. විජේරත්න උරුමකම් කියන ඉඩම ද, දකුණට : ඒ. එම්. ගුණතිලක සහ වෙනත් අය උරුමකම් කියන වැදිරිගේ වත්ත ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 7 ද, මායිම්ව පර්චස් දහයක (අ 0, රූ. 0, පර්. 10) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති සියලු දේද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F1131/84B ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. එම්. එල්. කරුණාතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
කුලියාපිටිය ශාඛාව.

10-1077

**සීමාසහිත සම්පත් බැංකුවේ**

1990 අංක 04 දරන ණය මගින් අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එන්. ඒ. එස්. පුෂ්පකුමාර සහ ඊ. ඒ. ජී. මල්කාන්ති
ගිණුම් අංක : 1033 5300 7805.

2007 අගෝස්තු මස 30 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නපුර, ජලාශය පාරේ අංක 42 හි පදිංචි නල්ලපෙරුම ආරච්චිලාගේ සරත් පුෂ්පකුමාර සහ එපිටවල ආරච්චිලාගේ ගීතා මල්කාන්ති යන දෙදෙනා බන්ධනදායීන් වශයෙන් සහ ඉහත කී රත්නපුර, ජලාශය පාරේ අංක 42 හි නල්ලපෙරුම ආරච්චිලාගේ සරත් පුෂ්පකුමාර යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රම්‍යා අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 ජූලි 13 දාතම හා අංක 920 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස්කර කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදාන කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින් 2007 මාර්තු මස 09 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් ලක්ෂ දාහත් දහස් තුන්සිය හැටහයකුත් ශත අසූහයක් (රු.4,017,366.86 ක් පමණයි) එකී බැඳුම්කරය සහ සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු හිඟව ඇති හෙයින් එකී රුපියල් හතලිස් ලක්ෂ දාහත් දහස් තුන්සිය හැටහයකුත් ශත අසූ හයක (රු.4,017,366.86 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් තිස්හත් ලක්ෂ අසූනවදහස් පන්සිය අනූහතරකුත් ශත දොළහක (රු.3,789,594.12 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2007 මාර්තු මස 10 වන දින සිට වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 920 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ දකුණු උඩුපත්තුවේ මලන්ගම ග්‍රාමයේ පිහිටි TP91215 හි කොටසක් ලෙස හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු නන්දසේන කලුපහන විසින් සාදන ලද 2003 ඔක්තෝබර් 16 දාතම හා අංක 2147 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත රත්නපුර ඉඩම් කාර්යාලයේ A762/214 හි ලියාපදිංචි කර ඇති එකී අංක 2147 පිඹුර ප්‍රකාර උතුරට : කොළඹ සිට රත්නපුර දක්වා ප්‍රධාන මාර්ගය සඳහා වෙන් කළ මාර්ග රක්ෂිතය (අංක 2147 පිඹුරේ ලොට් 1) ද, නැගෙනහිරට : වනසුන්දර අයිතිය කියන පොල්වත්ත වෙන් කරන කාණුව ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසද සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අක්. 0, රූඩ්. 0, පර්. 10) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාල සියලු අයිතීන් මාර්ග වරප්‍රසාද, සහන, දාසත්ව හා සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

10-1074/3

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.08.14 වැනි දින පවත්වනලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් කේ. කේ. පී. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 1995.11.29 දිනැති අංක 189 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 1998.02.19 දිනැති අංක 259, දරන උකස් බැඳුම්කරය, 2003.08.26 දිනැති අංක 734 දරන බැඳුම්කරය හා 2007.10.31 දිනැති අංක. 1307 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.06.14 දින තෙක් පොලිය වශයෙන් රුපියල් එක්කෝටි දොලොස්ලක්ෂ විසිඅට දහස් පන්සියදෙකයි ශත පහක (රු.1,12,28,502.05) මුදලක් සමග රුපියල් එක්කෝටියක (රු.1,00,00,000) මුදලක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් පොලියක්ද, 2009.06.15 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හෙට්ටිපොල, ගිරාතලාන හි පදිංචි සෙනරත් බණ්ඩාර හේරත් ජයසිංහ මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 189,259,734 හා 1307 දරන උකස් බැඳුම්කර මත ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතුව පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාර, අංක. 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරය හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, ගිරාතලාන කෝරලේ, කැලියාව ගිරාතලාන සහ මුනිතිගම පිහිටි "අන්දරලන්දෙවත්ත, කෝන්ගහමුලහේන කහටගහමුලහේන මුලවත්ත සහ කෝන්ගහහේන්යාය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ගුණසේකර විසින් සාදන ලද 1989.06.30 දිනැති අංක. 31/89 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්නය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට: වලහපිටියවත්ත සුසාන භූමිය ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 2 ද, දකුණට : හලාවත කුරුණෑගල, ප්‍ර. වැ. දෙ. පාර ද, බස්නාහිරට : සුසාන භූමිය දක්වා දිවෙන පාරද, මායිම්ව ඉහත කී 31/89 පිඹුර ප්‍රකාර අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් දහසයක (අ. 2, රූ. 1, පර්. 16) වපසරියකින් යුක්ත වන අතර, මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D986/38 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී කැලියාවෙහි පිහිටි අන්දරලන්දෙවත්ත නමැති ඉඩමෙහි එකී අංක 31/89 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : වලහපිටියවත්ත ද, නැගෙනහිරට: පිඹුරු අංක 674 හි ලොට් 3 පිඹුරු අංක. 31/89 හි ලොට් 3 ද, දකුණට : හලාවත කුරුණෑගල ප්‍ර.වැ.දෙ. පාර ද, බස්නාහිරට : පිඹුරු අංක. 31/89 හි ලොට් 1ද, මායිම්ව අංක. 31/89 දරන එකී පිඹුර ප්‍රකාර අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහසයක (අ. 1, රූ. 3, පර්. 16) වපසරියකින් යුක්ත වන අතර,මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D986/39 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ජේ. ප්‍රනාන්දු,
කළමනාකරු.

ලංකා බැංකුව,
හෙට්ටිපොල.

10-1076

---

### මහජන බැංකුව - හොරණ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ද සිල්වා විසින් සහතික කරන ලද 1996.04.25 දිනැති අංක 696 දරන උකස් බැඳුම්කරය ප්‍රකාරවද, සහ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. එන්. කේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2009.05.28 දින අංක 2930 දරන ප්‍රකාශන ඔප්පුව සමග කියවිය යුතු 2004.09.27 වන දින අංක 1108 දරන බැඳුම්කරය ප්‍රකාරවද කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ද සිල්වා විසින් සහතික කරන ලද 2007.11.16 දින අංක 2149 දරන බැඳුම්කරය ප්‍රකාරවද වූ ගෙවීම් විජයමාන්න රබර් මිල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගම විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්බැඳුම්කර යටතේ දැනට අංක 696 දරන බැඳුම්කරය මත රුපියල් හය ලක්ෂ තිස්හයදහස් තුන්සිය තිහයි ශත විසිපහක (රු. 636,330.25) මුදලක් ද, අංක 1108 දරන බැඳුම්කරය මත රුපියල් අට ලක්ෂ තිස්තුන් දහස් අටසිය අසූ එකයි ශත අසූ හතරක (රු. 833,881.84) අංක 2149 දරන බැඳුම්කරය මත රුපියල් තිස් එක් ලක්ෂ හැටතුන්දහස් හත්සිය පනස් තුනයි ශත විසි හයක් (රු. 3,163,753.26) මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, ඉහත කී රුපියල් හය ලක්ෂ තිස්හයදහස් තුන්සිය තිහයි ශත විසිපහක් (රු. 636,330.25) ක මුදල මත වර්ෂයකට 22.5% බැගින් 2008.12.01 දින සිට විකිණීමේ දිනය දක්වා පොලිය ද ඉහත කී අට ලක්ෂ තිස්තුන් දහස් අටසිය අසූ එකයි ශත අසූ හතරක්ද (රු. 833,881.84) ක මුදල මත වර්ෂයකට 19% බැගින් 2008.12.20 දින සිට විකිණීමේ දිනය දක්වා ඒ මත පොලියද ඉහත කී රුපියල් තිස් එක් ලක්ෂ හැටතුන්දහස් හත්සිය පනස් තුනයි ශත විසි හයක (රු.3,163,753.26) මුදල මත වර්ෂයකට 27% බැගින් 2008.11.01 දින සිට විකිණීමේ දිනය දක්වා පොලියද මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු ගාස්තු සහ මුදල්ද අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හය ලක්ෂ තිස්හයදහස් තුන්සිය තිහයි ශත විසිපහක් (රු. 6,36,330.25) ක මුදලද රුපියල් අට ලක්ෂ තිස්තුන් දහස් අටසිය අසූ එකයි ශත අසූ හතරක්ද (රු. 8,33,881.84) සහ රුපියල් තිස් එක් ලක්ෂ හැටතුන්දහස් හත්සිය පනස් තුනයි ශත විසි හයක (රු.31,63,753.26) මුදලද අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 696 සහ අංක 1108 සහ 2149 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ (29D) වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තර

හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 215/80 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ලියාපදිංචි කොට්ඨාස ඇතුළත රයිගම කෝරළේ මුන්වත්ත බාගේ පත්තුවේ වැලිකල පිහිටි වැලිකල ඕවිට නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් මැන සාදන ලද 1987 අගෝස්තු මස 04 වන දින අංක 4095 දරන පිඹුරේ ලොට් අංක 02 වශයෙන් නිරූපනය කර ලකුණු කර ඇති ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 3 ද, නැගෙනහිරට : වැලිකල පාර ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : අංක 4095 දරන පිඹුරේ ලොට් 01 සහ දංකෝල කුර සහ ඕවිටද යන මායිම් තුළ පිහිටියා වූද ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් 27.25 (අක්. 01, රූඩ්. 0, පර්. 27.25) ක් වූද විශාල ඉඩමේ සම්පූර්ණ බිම සහ එහි මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර ප්‍රාදේශීය කළමනාකරු,

ප්‍රාදේශීය කළමනාකරු,
(කළුතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාළු පාර,
පානදුර.

10-1102

---

### සෙලාන් බැංකුව පීඑල්සී - පානදුර ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු පීකිවූ 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0050-131676-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 සැප්තැම්බර් 08 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පිකිවු 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් සියල්ලම සහතික කරන ලද 1992 මාර්තු 11 දිනැති අංක 2139, 1993 අප්‍රේල් 5 දිනැති අංක 2250, 1995 පෙබරවාරි 13 දිනැති අංක 2442 සහ 1996 අප්‍රේල් 22 දිනැති අංක 2647 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම අළුබෝමුල්ල ව්‍යාපාරය පවත්වා ගෙන යන සහ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මෙසර්ස් සදන් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ අළුබෝමුල්ල පදිංචි නහීර් නන්දසිරි හපුආරච්චි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූලක්ෂ අසූහත්දහස් නවසිය හැටපහයි ශත විසිඑකක (රු.80,87,965.21) මුදලක්, 2008 ජුනි 17 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 80,87,965.21 මුදලද, 2008 ජුනි 18 වෙනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක : 2139, 2250, 2442 සහ 2647 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන පානදුර තල්පිටි දෙබැද්ද මාලමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ජේම්ස් ඕ ඕර් විසින් සාදන ලද 1937 පෙබරවාරි 12 සහ 13 දිනැති අංක :2859 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොඩපොරගහවත්ත සහ වැවගොඩහේන නමැති, ඉඩමේ ලොට් 1 ලකුණු කළ ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : හිරණ සිට කිරිබේරියට යන කරත්ත පාර ද, නැගෙනහිරට : මියගිය දොන් ඔඩානිස් ගුණතිලකගේ දේපල සහ අටුකේදෙනියවත්ත ද, දකුණට : අඩුකේදෙනියවත්ත, කන්නින්ගේ වෙල සහ මියගිය සී. ඊ. ගුණතිලකගේ උරුමක්කරුවන්ගෙන් මෙම ඉඩම් ලොට් 2 සහ බස්නාහිරට : දෙල්ගහවත්ත ද යන මායිම් තුළ අක්කර එකොලහයි පර්චස් විසිඑකක් (අ. 11, රූ. 0, පර්. 21) විශාල ඉඩම, මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව එෆ් 74/189 හි ලියා පදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1992 පෙබරවාරි 2 දිනැති අංක : 9435 දරන සැලැස්මක් පරිදි මැතක මැනීමක් අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

පෙරකී මාලමුල්ල පිහිටි ගොඩපොරගහවත්ත සහ වැවගොඩහේන නමැති, ඉඩමේ ලොට් 1 ට මායිම් : උතුරට : හිරණ සිට කිරිබේරියට යන පාර ද, නැගෙනහිරට : ඔඩානිස් ගුණතිලකගේ උරුමක්කරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ අටුකේදෙනියවත්ත ද, දකුණට : අටුකේදෙනියවත්ත, කන්නින්ගේ වෙල සහ සී. ඊ. ගුණතිලකගේ උරුමක්කරුවන්ගේ මෙම ඉඩමෙ ලොට් 2 සහ බස්නාහිරට : ගම්මුන් විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත ද යන මායිම් තුල එකී අංක : 9435 දරන සැලැස්ම අනුව අක්කර දහයයි රූඩ් තුනයි පර්චස් විසිහයක් (අ. 10, රූ. 3, පර්. 26) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති

10-967/2

### සීමාසහිත සම්පත් බැංකුව පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුව පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සන් එක්ස්පෝර්ට්ස් ඇන්ඩ් ඉම්පෝර්ට්ස්
ගිණුම් අංක : 0042 1000 2346.

2007 දෙසැම්බර් 27 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 12, ඩයස් පෙදෙසේ M- 1/7 යන ස්ථානයේ සන් එක්ස්පෝර්ට්ස් ඇන්ඩ් ඉම්පෝට්ස් නමින් හවුල් ව්‍යාපාරික කටයුතු කර ගෙන යන බණ්ඩාරවෙල, ලීන්ගහවැල්ල, බ්‍රෝටොන් කොට්ඨාසයේ පුශ්පම් ශන්මුගරත්නම් යන අය සහ වේයන්ගොඩ කටුවස්ගොඩ අංක 229A හි මාරසිංහ පතිරණගේ ශාන්තප්‍රිය කීර්ති කුමාර සහ මාරසිංහ පතිරණගේ ප්‍රියංගනී දීපශිකා කීර්ති කුමාරි යන දෙදෙන බන්ධනදායීන් සහ/හෝ උකස් කරුවන් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් පිළිවෙලින් 2003 දෙසැම්බර් 05 දාතම හා අංක 2423, 2006 ජනවාරි මස 06 දාතම හා අංක 1259 හා 2006 දෙසැම්බර් මස 13 දාතම හා අංක 3355 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ මෙහි පහත උපලේඛනයේ පළමුව වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ පරිශ්‍රය ඇපයට ගෙන ඔවුන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම/පියවීම පැහැර හැර ඇති හෙයින්ද, එකී ජනරජයේ කොළඹ 12, ඩයස් පෙදෙසේ අංක M1/7 යන ස්ථානයේ "සන් එක්ස්පෝට්ස් ඇන්ඩ් ඉම්පෝර්ට්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුල් ව්‍යාපාරික කටයුතු කරගෙන යන බණ්ඩාරවෙල, ලීන්ගහවැල්ල, බ්‍රෝටොන් කොට්ඨාසයේ පුශ්පම් ශන්මුගරත්නම් යන අය සහ ඉහත කී වේයන්ගොඩ, කටුවස්ගොඩ, අංක 229A හි මාරසිංහ පතිරනගේ ශාන්ත ප්‍රිය කීර්ති කුමාරි සහ මාරසිංහ පතිරණගේ ප්‍රියංගනී දීපශිකා කීර්ති කුමාරි යන දෙදෙන බන්ධනදායීන් වශයෙන්සහ ඉහත කී වේයන්ගොඩ, කටුවස්ගොඩ, අංක 229A හි එකී මාරසිංහ පතිරණගේ ප්‍රියංගනී දීපශිකා කීර්ති කුමාරි යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් මෙහි පහත උපලේඛනයේ දෙවනුව වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය සම්බන්ධයෙන් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 මාර්තු 01 දාතම හා අංක 2009 සහ 2006 දෙසැම්බර් 13 දාතම හා අංක 3353 දරන උකස් බැඳුම්කර මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම/පියවීම පැහැර හැර ඇති හෙයින් ද, 2007 අප්‍රේල් 23 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු- මුදලින් රුපියල් හැත්තෑ දෙලක්ෂ තිස් හතර දහස් හයසිය හැටහයකුත් හත හතලිස් තුනක් (රු.7,234,666.43 ක් පමණයි) එකී බැඳුම්කර මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හැත්තෑ දෙලක්ෂ තිස් හතර දහස් හයසිය හැටහයකුත් ශත හතලිස් තුනක් (රු.7,234,666.43 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දොලොස් ලක්ෂ අසූපන්දහස් හත්සියයක (රු.1,285,700 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට නවයයි දශම නවය (9.9%) බැගින් සහ තවත් රුපියල් පන් ලක්ෂ පනස්පන් දහසක (රු.5,550,000

ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් 2007 අප්‍රේල් 24 වන දින සිට එකී අංක 2423, 1259, 3355, 2009 සහ 3353 බැඳුම්කර මත අයවිය යුතු සම්පූර්ණ ණය මුදල් ගෙවා පියවා නිම කරන දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2432, 1259, 3355, 2009 සහ 3353 බැඳුම්කර මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුව නමට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

පළමුව, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ මහ නගර සභා සීමාව තුළ අලුත්ගම බෝගමුව ගමේ පිහිටි කොළඹ මහනුවර පාරේ වරිපනම් අංක 541, 541 A දරන "කැකුණගහලන්ද නොහොත් දවටගහලන්ද නොහොත් නකතියවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ විසින් සාදන ලද 2002 නොවැම්බර් 25 දාතම හා අංක 3256 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G34/269 හි ලියාපදිංචි කොට ඇති උතුරට එම්. එච්. පියතිස්ස අයිතිය කියන එම ඉඩමේම කොටසක්ද නැගෙනහිරට ඩබ්ලිව්. පී. ගුණරත්නගේ ලොට් 4 ද, දකුණට කොළඹ මහනුවර මහා මාර්ගයද, සහ බටහිරට නිවාස දක්වා යන 2.5 (අඩි 8) පළල පාරද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි හතක් (අක්. 0, රූඩ්. 0, පර්. 8.77) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාල සියලුම අයිතීන් මාර්ග වරප්‍රසාද සහන හා දාසත්ව ද සමගය.

දෙවනුව, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරලේ මැද පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුල හල්ගම්පිටියේ පිහිටි "හල්ගම්පිටිය එස්ටේට්" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පිතරාජ විසින් සාදන ලද 1993 දෙසැම්බර් 31 දාතම හා අංක 1220 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත, ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E-749/215 හි ලියාපදිංචි කොට ඇති උතුරට : එම්. ආර්. වයි. ශ්‍රියානි මහත්මියට අයත් ඇටහෙරලියගහවත්ත සහ එම්. පී. සුනිල් අමරසිංහ සහ තවත් අයට අයත් කෝන්ගහවත්ත ද, නැගෙනහිරට : එම්. පී. සුනිල් අමරසිංහ සහ තවත් අයට අයත් කෝන්ගහවත්ත සහ එම්. පී. කීර්ති සහ තවත් අයට අයත් (1993 අගෝස්තු 19 දාතම හා අංක 1117 දරන පිඹුරේ දක්වා ඇති) ගොඩපරගහවත්ත ඉඩම ද සහ බටහිරට : නිවෙස් වලට යන පාරද මායිම් වන එකී අංක 1220 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතක් (අක්. 0, රූඩ්. 0, පර්. 16.7) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාල සියලුම අයතීන් මාර්ග වරප්‍රසාද සහන හා දාසත්ව ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

10-1074/2

## පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මොරටුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුගේ නම : එම්. පී. සරත් සිසිල් පෙරේරා

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.14 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, මහමරක්කල පටබැඳිගේ සරත් සිසිල් පෙරේරා විසින් කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 3573 සහ 2007 අගෝස්තු 24 සහ අංක 3602 සහ 2008 අප්‍රේල් 21 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක්

(අ) 2009.08.03 වන දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හාරලක්ෂ හැට අට දහස් අට සිය එකයි ශත අසූ නමය (රු.468,801.89) ක මුදල සහ රුපියල් හාර ලක්ෂ හතළිස් නම දහස් දෙසිය විසි නමයයි ශත පනස් අට (රු.449,229.58) ක මුදල මත වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පොලිය ද සහ

(ආ) 2009.08.03 වන දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් එකොළොස් ලක්ෂ තිස් නම දහස් තිස් පහයි ශත එකොළහ (රු.1,139,035.11) ක මුදල සහ 2009.07.30 වන දින සිට රුපියල් දස ලක්ෂ අට දහස් තුන් සියය දාහතරයි ශත පනස් හතර (රු.1,008,314.54) ක මුදල මත වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පොලිය ද,

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් එකී අංක 3573 සහ 3602 උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් දහසය ලක්ෂ හත් දහස් අට සියය තිස් හත (රු.1,607,837) ක මුදල ඉහතකී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටෙ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ, මොරටුව මහා නගර සභා සීමාව තුළ මොරටුමුල්ල 5 වන පටුමගේ පිහිටා ඇති මිස්සෙගෙවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. පී. මෙන්ඩිස් විසින් මැන සාදන ලද අංක 921බී සහ 1990.08.04 දිනැති සැලැස්මේ ලොට් 3 දරන කැබැල්ල නැවත

මැන බෙදා වෙන්කොට සීමා නිර්ණය ඇති උතුරට : ලොට් 2, නැගෙනහිරට : 5 වැනි පටුමග, දකුණට : නිමල් රෝයි පෙරේරාගේ දේපළ සහ බස්නාහිරට : ලොට් 4 සහ 2 යන මායිම් තුළ පිහිටි එකී අංක 921බී සැලැස්ම අනුව පර්චස් නමයයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 9.20) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහ දැනට දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරු එම් 1748/300 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 921බී සැලැස්මේ ලොට් 2 මත මාර්ග අයිතිය ද සමඟින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝජිත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්

10-1099

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 378272.
වැවලගේ නිරෝෂන් අයිවන් පෙරේරා.

2009 ජූනි මස 19 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පෙරේරා විසින් 2007 ජූලි මස 16 වැනි දින සහතික කරන ලද අංක 9498 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වැවලගේ නිරෝෂන් අයිවන් පෙරේරා ණයකරු හැටියටද, පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහඅට ලක්ෂ විසි දෙදහස් හත්සිය අනූපහයි ශත අසූඅටක (රු.1,822,795.88) මුදලක් 2009 මාර්තු මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් දහ අටලක්ෂ විසි දෙදහස් හත්සිය අනූපහයි ශත අසූඅටක (රු.1,822,795.88) මුදලට 2009 මාර්තු මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,350,000 ක මුදල මත 28% ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 9498 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කර ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩොර්ප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක එම්. ජේ. ගෝමස් විසින් 2004 සැප්තැම්බර් මස 1 වැනි දින සිට සාදන ලද අංක 6748 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගහපත්තු හාපිටිගම් කෝරලේ, නාල්ල ග්‍රාමයේ පිහිටි දැනට රොශාල් ගාඩ්න් කියන මුදගහලන්ද, කටුවාගේන සහ බේරුවලහොරගහ කුඹුර කැබැල්ල කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද ලොට් 7 දරන ඉඩමට මායිම්, උතුරට : (මීටර් 9 ක් පළල පාරක් සඳහා) වෙන් කරන ලද එකී අංක 6748 දරන පිඹුරේ ලොට් 6 සහ 13 ද, නැගෙනහිරට : (මීටර් 9 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) එකී අංක 6748 දරන පිඹුරේ ලොට් 13 සහ එකී අංක 6748 දරන පිඹුරේ ලොට් 8 ද, දකුණට : එකී අංක 6748 දරන පිඹුරේ ලොට් 8 සහ ලලිත් එම්. කනගරත්නට හිමි ඉඩමද, බස්නාහිරට : බලයලත් මානක කේ. කනගරත්න විසින් 1020/1998 දරන පිඹුරේ 1 සහ ලලිත් එම් කනගරත්නට හිමි ඉඩමද, සහ අංක 6748 දරන පිඹුරේ ලොට් 6 ද, යන මායිම් තුළ පර්චස් දහසයක් (අ. 0, රූ 0, පර්. 16) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියලු දේත් සමග සහ එකී අංක 6748 දරන පිඹුරේ පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13 දරන කොටසේ වර්ධනය කිරීම සහ නඩත්තු කිරීමේ අයිතියද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 297/29 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

10-1041

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය.

කමරාදිවල ආරච්චිගේ නිහාල් හේමන්ත හෙවත් හේමන්ත කමරාදිවල සෝල් ප්‍රොප්‍රයිටර් ඔෆ් එච්. කේ. එන්ටර්ප්‍රයිසස්

2009 මැයි මස 29 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන ලද රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවර්ධන විසින් 2003 ජූනි මස 22 වැනි දින සහතික කරන ලද අංක 2323 දරන බැඳුම්කරයද, 2007 ජනවාරි මස 31 වැනි දින හා අංක 3144 ද, සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් 2005 දෙසැම්බර් මස 22 වැනි දින සහතික කරන ලද අංක 1501 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කමරාදිවල ආරච්චිගේ නිහාල් හේමන්ත හෙවත් හේමන්ත කමරාදිවල ණයකරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල්

පනස්හය ලක්ෂ හැත්තෑහතර දහස් තුන්සිය හැත්තෑ අටයි ශත හතලිස් හතක (රු. 5,674,378.47) මුදලක් 2009 අප්‍රේල් මස 06 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස්හය ලක්ෂ හැත්තෑහතර දහස් තුන්සිය හැත්තෑ අටයි ශත හතලිස් හතක (රු. 5,674,378.47) මුදලට 2009 අප්‍රේල් මස 7 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට 36% ක වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 2323, 3144, සහ 1501 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක එච්. එම්. ප්‍රනාන්දු විසින් 1968 පෙබරවාරි මස 3 වැනි දින සාදන ලද අංක 4344 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගඟබඩපත්තු සියනෑ කෝරලේ (පෙර වැරදි ලෙස සඳහන්ව ඇත්තේ පහල මාපිටිගම පිහිටි බවටය) මල්වාන පිහිටි වැවලගෙවත්ත හෙවත් ස්කෝලවත්ත කියන ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන්, සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද යාබද ලොට් 24 සහ 25 දරන ඉඩම් කොටස් වලට මායිම්, උතුරට : අංක 4344 දරන පිඹුරේ (අඩි 20 ක් පළල පාරක් සඳහා වූ) ලොට් 19 ද, නැගෙනහිරට : ලොට් 23 ද, දකුණට : මල්වාන මහා විද්‍යාලයේ ඉඩම ද, බස්නාහිරට : මල්වාන - සමන්බැද්ද ප්‍රසිද්ධ පාර ද, යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම පහක් (අ. 0, රූ. 1, පර් 0.5) විශාල ඉඩම. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 424/78 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

මෑතකදී සිදුකරන ලද මිනුම අනුව අංක 4344 දරන පිඹුරේ යාබද ලොට් 24 සහ 25 මෙසේ විස්තර කර ඇත.

බලයලත් මානක ඩී. වී. කොතලාවල විසින් 1990 පෙබරවාරි මස 5 වැනි දින සාදන ලද අංක 20/90 දරන පිඹුර පරිදි එකී මල්වාන පිහිටි වැවලගවත්ත හෙවත් ස්කෝලවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොල, වගාවන්, සහ සියලු දේත් සමග වෙන් කරන ලද ඉඩමට මායිම් උතුරට : අංක 4344 දරන පිඹුරේ (අඩි 15 ක් පළල පාරක් සඳහා වූ) ලොට් 19 ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් 23 ද, දකුණට : රජය සතු මල්වාන මහා විද්‍යාලය භූමියද, බස්නාහිරට : සමනබැද්ද මහා මාර්ගයද, යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 0.5) හෝ හෙක්ටයාර් 0.1025 විශාල ඉඩම.

පහත සඳහන් පාරවල් සඳහා වෙන්කරන ලද කොටස් ඔස්සේ ගමන් කිරීමේ සහ වෙනත් අයිතිවාසිකම් සමග වේ.

බලයලත් මානක එච්. එම්. ප්‍රනාන්දු විසින් 1968 පෙබරවාරි මස 3 වැනි දින සාදන ලද අංක 4344 දරන පිඹුර පරිදි වැවලගහවත්ත හෙවත් ස්කෝලවත්ත කියන ඉඩමේ (පාරක් සඳහා වෙන්කරන ලද) යාබද ලොට් 19 ට මායිම් : උතුරට : එම ඉඩමේ එකී පිඹුරේ ලොට් 13, 14, 15, 16, 17, සහ 18 ද, නැගෙනහිරට : මත්බෝනුවන කුඹුරද, දකුණට : ලොට් 20, 21, 22, 23, 24,සහ 25 ද, බස්නාහිරට : මල්වාන - සමනබැද්ද ප්‍රසිද්ධ පාරද, යන මායිම් තුළ පර්චස් තිස්තුනක් විශාල ඉඩම. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 401/23 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

10-1040

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 1970000646.
ණය ගිණුම් අංකය : 265629
බිංදුහේවා ඉංජිනියරිංග් සර්විසස්.

2008 ජනවාරි මස 25 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. ඒ ද සිල්වා විසින් 2005 නොවැම්බර් මස 16 වැනි දින සහතික කරන ලද අංක 1501 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "බිංදුහේවා ඉංජිනියරිංග් සර්විසස්" යන නාමය හා අභිධානය යටතේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන බිංදුහේවා ඇවන් උපුල් ද සිල්වා මාරසිංහ ආරච්චිලාගේ චමිලා තුෂාරි සහ දැගිරි නිෂාන්ත මෙන්ඩිස් ණයකරුවන්/උකස්කරු හැටියටද, පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්නව ලක්ෂ තිස්හය දහස් හාරසිය දොලහයි ශත හතලිස් පහක (රු.5,936,412.45) මුදලක් 2007 නොවැම්බර් මස 20 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස්නව ලක්ෂ තිස්හය දහස් හාරසිය දොලහයි ශත හතලිස් පහක (රු.5,936,412.45) මුදලට 2007 නොවැම්බර් මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,230,750 ක මුදල මත 20% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1501 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්.සී. වෙත උකස්කොට ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක : 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. බලයලත් මානක එස්. එච්. දහනායක විසින් 1916 පෙබරවාරි මස 14 වැනි දින සාදන ලද අංක 202 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව, කරන්දෙනිය පිහිටි පෙර සඳහන් කරන පරිදි අම්බලන්ගොඩ, පොල්වත්ත පිහිටි තෙලිගලකන්ද කියන ඉඩමේ බෙදා

වෙන් කරන ලද බස්නාහිර කොටස හෙවත් තෙල්ගහකන්ද හෙවත් තෙල්ගලකන්ද හෙවත් ගොන්බහිනතොට හෙවත් කල්ගස්ගොඩකන්ද ඉඩමේ ගොඩනැගිලි වගාවන් සහ සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද බස්නාහිර කොටසට මායිම් : උතුරට : වෙල ද, නැගෙනහිරට : අක්කර 4 ක ප්‍රමාණයෙන් යුතු මෙම ඉඩමේ බෙදන ලද කොටසද, වෙලද, මුළු ඉඩමේ කොටසක්ද සහ වෙල ද, දකුණට : ඇල සහ වරුසවිතාන අර්නෝලිස්ට අයිති ඉඩම සහ බස්නාහිරට : ඇල ද යන මායිම් තුළ අංක 202 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි අක්කර එකොලහයි රූඩ් දෙකයි පර්චස් හතක් (අ. 11, රූ. 2, පර්. 7) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 133/275 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව කරන්දෙනිය පිහිටි පෙර සඳහන් කරන ලද පරිදි අම්බලන්ගොඩ පොල්වත්ත පිහිටි තෙලිගලකන්දෙ අද්දරවෙල කියන ඉඩමේ සියලු දේත් සමග බෙදා වෙන්කරන ලද කොටසට මායිම් : උතුරට : වෙල ද, නැගෙනහිරට : ලොට් 2927 ද, දකුණට : තෙලිගල කන්ද කොටසක්ද, බස්නාහිරට : ගොන්බහිනතොටද, යන මායිම් තුළ පර්චස් තිස් දෙකක් (අ. 0, රූ. 0,පර්. 32) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ249/149 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

10-1039

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 308024.
කොලොම්බ ආරච්චිගේ ලෙස්ලි ග්ලැන්සන් පෙරේරා.
අබේධීර ලියනගේ චිත්‍රා චාන්දනී.

පහත සඳහන් පාරවල් සඳහා වෙන් කරන ලද කොටස් ඔස්සේ ගමන්කිරීමේ අයිතියද සමග වේ.

බලයලත් මානක වයි. බී. කේ. කොස්තා විසින් 1988 මාර්තු මස 21 වැනි දින සාදන ලද අංක 2197 දරන පිඹුර පරදි එකී මාලමුල්ල පිහිටි දෙල්ගහවත්ත හෙවත් කිරිබේරියගහවත්ත කියන ඉඩමේ (අඩි 15 ක් පළල පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් 'එච්1' දරන කොටසට මායිම්, උතුරට එකී අංක 2197 දරන පිඹුරේ ලොට් 'ඒ' ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අයි, එච්, පී, එස් සහ ඊ ද, දකුණට : තන්තිරිමුල්ල සිට කිරිබේරිය දක්වා වූ පාර සඳහා අතහරින ලද ලොට් 7 ද, බස්නාහිරට : ලොට් ඩී, සී, සහ බී ද, යන මායිම් තුළ පර්චස් දාහතරයි දශම හතරක් (අ. 0, රූ. 0, පර් 14.4) විශාල ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 172/351 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

10-1043

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : ජීඑල්/10/00857/ජීඒ1/517.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.20 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. දෙබරවැව තිස්සමහාරාම ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. එච්. පියසේන විසින් සහතික කරන ලද 2005.04.13 දින හා අංක 1868 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම තිස්සමහාරාම පදිංචි දික්වැල්ල විතාරනගේ දයාසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, 2009.05.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළිය වශයෙන් රුපියල් එක් ලක්ෂ අනූ පන්දහස් තිස් පහයි ශත අනූපහ (රු.195,035.95) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1868 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූවයි ශත පහළොව (රු. 80.15) ක් බැගින් වැඩිපුර පොළිය ද අය විය යුතුව ඇති බැවින්ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සීමාවේ මාගම්පත්තුව ජුල්පල්ලම ග්‍රාමසේවක කොට්ඨාසයේ වම් ඉවුර කුඩාගම් අට පිහිටි 2004.02.04 සහ 2004.02.08 දින බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද අංක එච් 228 දරන මිනුම් පිඹුරට අනුව කැබලි අංක 01 නමින් හැඳින්වෙන ප්‍රමාණයෙන් අක් 01, රූඩ් 01, පර්. 35 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච්/303/3979/98 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/9

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේ/13/5523/කේඑන්1/373.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.26 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. නාවලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් පී. ජේ. රත්නායක විසින් සහතික කරන ලද 2003.03.17 දින හා අංක 1963 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම නාවලපිටිය පදිංචි මාදුන්නාවේ ගෙදර විජයබණ්ඩා යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, 2009.01.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අනූ හතර දහස් අටසිය දහයයි ශත අනූ තුන(රු.94,810.93) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1963 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලද දිනය වනතුරු දිනකට රුපියල් හතළිස් එකයි ශත පනස් හය (රු.41.56) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ කෝරලයේ කොත්මලේ පිහිටි උනුගලවත්ත නොහොත් උනුගල්ඔයවත්ත නමැති ඉඩම සඳහා 2002.06.19 දින බලයලත් මිනින්දෝරු ජේ. සී. ගමගේ විසින් බෙදා වෙන් කරන සකසන ලද අංක 290 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 39.9 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි මාර්ග අයිතිය ද ඇතුළුව සියලු දේත් වේ.

මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. කොත් 6/183/2002 යටතේ ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/8

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 5/65185/ඩී5/653.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.20 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. වයි. එම්. තව්ෆීක් විසින් සහතික කරන ලද 1998.07.22 දින හා අංක 3249 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම මාතලේ පදිංචි රණසිංහ ආරච්චිගේ දොන් ජයරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.10.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ තුන්දහස් පන්සිය දෙකයි ශත හතළිස් එක (රු.3,03,502.41) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3249 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතළිස් නවයයි ශත හැටහත (රු.149.67) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලය ලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරීය යුතු වන්නේ ය.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ නගර සභා සීමාව තුල අලුවිහාරේ පිහිටි දාච්චියාවත්ත නැමති ඉඩමට 1997.10.24 වෙනි දින බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි විසින් බෙදා වෙන් කර සකසන ලද 10548 දරන පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 11.46 ක් වූ බිම් කොටස වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 80/107 යටතේ ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/7

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/23945/සීබී7/296.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.11 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ටී. පියදාස විසින් සහතික කරන ලද 1994.08.24 දින හා අංක 414 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම මහරගම පදිංචි එදිරිවීර ආරච්චිගේ නිව්ටන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.01.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හතලිස් අටදහස් හත්සිය අනූ තුනයි ශත පනස් හත (රු.1,48,793.57) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 414 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ එකයි ශත පනස් තුන (රු.81.53) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයේජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, කටුවාවල, තුන්වන පටුමග, අංක 21/10 ඒ හි බලයලත් වෙන්දේසිකාර එෆ්. ආර්. ගල්හේන මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙපත්තු සල්පිටි කෝරළේ මහරගම ප්‍රාදේශීය සභා සීමාවේ බොරලැස්ගමුව කුමුදු මාවතේ පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. එච්. ජී. ප්‍රනාන්දු විසින් 1991.11.10 දින බෙදා වෙන් කර මැන සකසන ලද අංක 3897 දරන පිඹුරේ (මෙය බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. එස්. යාපා විසින් 1976.11.22 දින අංක 489 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස දැක්වෙන ගල්කිස්ස දිසා අධිකරණයේ 12560/පී නඩුවට අනුකූලව කරන ලද අනු බෙදීමකි.) කැබලි අංක 3 බී/1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0 පර්. 12 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 1789/209 හි ලියාපදිංචි වී ඇත.

(ඒ) අංක 3897 දරන පිඹුරේ කැබලි අංක 3බී/2 ලෙස දැක්වෙන (අඩි 10 ක් පළල මාර්ගය සඳහා වෙන් කර ඇති) බොරලැස්ගමුව දෙල්ගහවත්ත නමැති ඉඩමේ ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 1.68 ක් වූ බිම් කොටස ; සහ

(බී) අංක 3897 දරන කැබලි අංක 3බී/1 ට උතුරු දෙසින් පිහිටා ඇති මාර්ගය සඳහා වෙන් කර ඇති බිම් කොටස වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,

10-1002/6

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එම්ජී/06/00328/එම්ජී1/213.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.05.15 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. හොරණ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. ඩබ්. ජයන්ත විසින් සහතික කරන ලද 2005.09.01 දින හා අංක 7254 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම ගල්පාත පදිංචි හතුරුසිංහ රසික සමන්ත සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.04.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටහත්දහස් අටසිය අනූපහයි ශත හැටතුන (රු.1,67,895.63) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 7254 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හැටනවය (රු. 69.00) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල හා 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලයේ මුංවත්තබාගෙ පත්තුවේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවේ පාතකඩ පිහිටි කපුහේනවත්ත නමැති ඉඩමට 1997 සැප්තැම්බර් මස බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් බෙදා වෙන් කර සකසන ලද අංක 239 දරන පිඹුරේ කැබලි අංක 84 දරන බිම් කොටස.

මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඩී 163/41 යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද අංක 239 දරන පිඹුරේ මාර්ග අයිතීන් සඳහා වෙන් වී ඇති කොටස් මතින් ඇති මාර්ග අයිතිය ද වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/08/00690/ජීජී1/540.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.11 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්. සෙනෙවිරත්න විසින් සහතික කරන ලද 2005.06.27 දින හා අංක 3814 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම බද්දේගම පදිංචි හපුගොඩ ආරච්චි කම්කානම්ගේ ඥානවතී සහ රිල්ලගොඩගේ පියදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.02.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ දහනවදහස් හත්සිය තිස් නවයයි ශත හැත්තෑපහ (රු.3,19,739.75) ක මුදලක්ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3814 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනක රුපියල් එකසිය තිස්එකයි ශත හතලිහ (රු.131.40) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ දකුණ ගඟබොඩ පත්තු බද්දේගම ප්‍රාදේශීය සභා සීමාව තුල නැගෙනහිර බද්දේගම පිහිටි අන්හිදුවලදූව නොහොත් අන්කුටුවලදූව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 1998.02.05 දින මැන සකසන ලද අංක 2994 දරන මිණුම් කැබලි අංක 16 බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 33.565 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස වේ.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එච් 119/272 ලෙස ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 3/72447/ඩී3/966.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.04.29 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජී. දයාරත්න විසින් සහතික කරන ලද 2001.12.10 දින හා අංක 2698 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම කෑගල්ල පදිංචි ඒකනායක මුදියන්සේලාගේ අබේරත්න සහ හපුආරච්චිලාගේ අනුලාවතී මැණිකේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටදහස් අටසිය අටයි ශත පනහ (රු.1,60,808.50) ක මුදලක්ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2698 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හැටතුනයි ශත හැටතුන (රු.63.63) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගතයුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර කුරුණෑගල, මල්කඩුවාව වට රවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලය ලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතා ට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ අටාලගමේ පිහිටි පිච්චිගෙකොටුව නමැති ඉඩමට 2001.08.08 සහ 2001.08.14 දින බලයලත් මිනින්දෝරු ආර්. කේ. නිශ්ශංක විසින් මැන සකසන ලද 2001/57 දරන පිඹුරේ කැබලි අංක 1 සහ 2 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 13.92 සහ අක්. 0, රූඩ්. 0, පර්. 12.53 ක් වූ බිම් කොටස් සහ ඒ මත පිහිටි සියළු දේත් වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/47943/සීඩී9/035.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.08 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. අවිස්සාවේල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. එස්. පින්නවල විසින් සහතික කරන ලද 2005.06.02 වැනි දින හා අංක 4352 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම හංවැල්ල පදිංචි කමණි හර්ෂලා ලිහිණිකඩුව යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.08.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස් දෙදහස් දෙසීය නවයයි ශත හය (රු.3,52,209.06) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 4352 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පනස් එකයි ශත අනූ අට (රු.151.98) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගතයුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර කැස්බෑව, වලව්වත්ත, ධම්මික, අංක 228/ඒ හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා ට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගහපත්තු හේවාගම් කෝරළයේ සීතාවක ප්‍රාදේශීය සභා සීමාව තුළ දිද්දෙනිය පිහිටි බණ්ඩාරවත්ත නමැති ඉඩමට 1993.06.09 වෙනි දින බලයලත් මිනින්දෝරු එන්. පී. ඇල්විටිගල විසින් මැන සකසන ලද 276 දරන පිඹුරේ කැබලි අංක 18 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 11.50 ක් වූ බිම් කොටස.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 71/224 ලෙස ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/37928/සීඩී5/357.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. වීරසේකර විසින් සහතික කරන ලද 1999.11.23 වැනි දින හා අංක 1319 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම කෝට්ටේ පදිංචි කට්ටඩියලාගේ ජයන්ත ගුණසේකර නොහොත් කට්ඩියගේ ජයන්ත ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.07.10 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අනූ එක්දහස් එකසිය දෙකයි ශත හැත්තෑ අට (රු.91.102.78) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1319 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලද දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් හතරයි ශත අනූදෙක (රු.44.92) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, කටුවාවල, තුන්වන පටුමග, අංක 21/10 ඒ හි බලයලත් වෙන්දේසිකාර එෆ්. ආර්. ගල්හේන මහතා ට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හේවාගම් කෝරළයේ පල්ලේපත්තුවේ තලංගම දකුණ පිහිටි අඹගහලන්ද නමැති ඉඩමට 1997.11.18 වැනි දින බලයලත් මිනින්දෝරු එල්. ආර්. ජයසුන්දර විසින් බෙදා වෙන් කර සකසන ලද අංක 9734 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 6 ක් වූ බිම් කොටස.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ජී 1178/196 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-1002/1

**සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බැන්කිං ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0860-041549-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.23 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුවේ පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ප්‍රොක්ටර් විසින් සියල්ලම සහතික කරන ලද 2007 මැයි මස 22 දිනැති අංක 207, 2007 ජුනි මස 19 දිනැති අංක 214, 2007 අගෝස්තු මස 13 දිනැති අංක 230, 2007 අගෝස්තු මස 13 දිනැති අංක 229 සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. එන් ද සිල්වා විසින් සහතික කරන ලද 2008 දෙසැම්බර් මස 23 දිනැති අංක 62 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 07, සංස්ථාගත කිරීමේ සහතික අංක එන් (පීබීඑස්) 1042 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සෙලින්කෝ සසෙක්ස් එඩියුකේෂනල් සර්විසස් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් නව කෝටි හැත්තෑදෙලක්ෂ විසිදෙදහස් හාරසිය තිස් නවයයි ශත අසූහතක (රු. 9,72,22,439.87) මුදලක්, 2009 ජුනි 16 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 9,72,22,439.87 මුදලද, 2009 ජුනි මස 17 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තවර ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 207, 214, 230, 229 සහ 62 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි, දෙවැනි, තුන්වැනි සහ හතරවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු උපලේඛනය**

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පිටිගල් කෝරළේ දකුණ කම්මල් පත්තුවේ කොළින්ජාඩිය පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ලක්ෂමන් එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1997 අගෝස්තු මස 29 දිනැති අංක 2098 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාදංගහවත්ත, අඹගහවත්ත, මාදංගහගොඩබිමවාසිය, දමින්නගහවත්ත, අඹගහවත්ත සහ තවත් ඉඩම්, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 සහ 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කැබැලිවලට මායිම්, උතුරට : ඩබ්ලිව්. එම්. සුනිල් පෙරේරාගේ ඉඩම සහ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1164 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : අංක 1164 දරන එකී සැලැස්මේ සඳහන් ලොට් 1, 10 සහ 9, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1519 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, දකුණට : පාර සහ බලයලත් මිනින්දෝරු එම්. පී. එස්. සමරතුංග විසින් සාදන ලද අංක 3523ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 7 සහ 6, බස්නාහිරට : එකී අංක 3523ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 5 සහ ඩබ්ලිව්. එම්. සුනිල් පෙරේරාගේ ඉඩම ද යන මායිම් තුළ අංක 2098 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි, පර්චස් තිස්හතක් (අ. 0, රූ. 2, පර්. 37) විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී අංක 1164 දරන සැලැස්මේ සඳහන් ලොට් 10 උඩින් මාර්ග අයිතිය සමග.

**දෙවැනි උපලේඛනය**

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත් පත්තුවේ කටුගම්පල දකුණු කෝරළේ මාදම්පේ පාර කුලියාපිටිය නගර සභා සීමාව තුළ අංක 695 සහ 695/1 දරන කොට්ඨාසයෙහි කනදුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන ලද 2007.06.08 දිනැති අංක 5417 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොඩැල්ලහේන නැමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු ජේ. එල්. වීරවර්ධන විසින් සාදන ලද 1984 ජනවාරි මස 17 වැනි දිනැති අංක 3379ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඉඩම් කොටසේ නැවත මැනීමක් වන) මායිම්, උතුරට : මාදම්පේ සිට කුරුණෑගලට යන මහා මාර්ගය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. ආර්. ජයමාන්න විසින් සාදන ලද අංක 2737 දරන සැලැස්මේ සඳහන් ලොට් බී ලෙස පෙන්නුම් කරනු ලබන කරුණාරත්න මහතාගේ ඉඩම ද, දකුණට : බලයලත් මිනින්දෝරු එල්. ආර්. ජයමාන්න විසින් සාදන ලද අංක 2737 දරන සැලැස්මේ සඳහන් ලොට් එප් ලෙස පෙන්නුම් කරනු ලබන එච්. එච්. සිරිමෙවන් හේරත්ගේ සහ ඕ. එම්. හිරන්ති ප්‍රියංකා ගේ ඉඩම සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන ලද 2007.06.08 දිනැති අංක 5417 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් සෙලින්කෝ සසෙක්ස් එඩියුකේෂනල් සර්විසස් ලිමිටඩ් යන අයට හිමි කලින් අංක 333905 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ජේ. එල්. වීරවර්ධන ගේ ඉඩම ද, යන මායිම් තුළ එකී අංක 5417 දරන සැලැස්ම අනුව රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) නොහොත් හෙක්ටයාර 0.3035 ක් විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

2. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත් පත්තුවේ කටුගම්පල දකුණු කෝරළේ මාදම්පේ පාර කුලියාපිටිය නගර සභා සීමාව තුළ අංක 699 දරන කොට්ඨාසයෙහි කනදුල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන ලද 2007.06.08 දිනැති අංක 5416 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්කුඹුරේපිල්ලෑව සහ මහකුඹුරේවත්ත නමැති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු ජේ. එල්. වීරවර්ධන විසින් සාදන ලද 1976 ජනවාරි 30 දිනැති අංක 2271 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඉඩම් කොටසේ නැවත මැනීමක් වන) මායිම්, උතුරට : මාදම්පේ සිට කුරුණෑගලට යන මහා මාර්ගය සහ ඩී. ඩබ්ලිව්. ඒබ්‍රහම් අප්පුහාමිගේ කුඹුර ද, නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන 2006.06.08 දිනැති අංක 5417 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් සෙලින්කෝ සසෙක්ස් එඩියුකේෂනල් සර්විසස් ලිමිටඩ් ට අයිති කලින් මහේෂ් ප්‍රියා ඒකනායක සහ එච්. එම්. පොඩිමැණිකේ ඒකනායකට අයිති ඉඩම, සිරිමෙවන් හේරත්ගේ ඉඩම සහ ඕ. එම්. හිරන්ති ප්‍රියංකාගේ ඉඩම වෛද්‍ය පින්තුගේ උරුමක්කරුවන්ගේ ඉඩමද, දකුණට : එමලින්ගේ ඉඩම සහ බස්නාහිරට : රාමලිංගමගේ කුඹුර, පී. එම්. ජොසපිනා හාමිනේගේ කුඹුර සහ ඩී. ඩබ්ලිව්. ඒබ්‍රහම් අප්පුහාමිගේ කුඹුර සහ එන්. ඒ. සිරිසේන සහ තවත් අයගේ ඉඩම ද, යන මායිම් තුළ එකී අංක 5416 දරන සැලැස්ම අනුව අක්කර එකයි, රූඩ් දෙකයි පර්චස් දහතුනක් (අ. 1, රූ. 2, පර්. 13) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

### තුන්වැනි උපලේඛනය

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල නගර සභා සීමාව තුළ බදුලුපිටියගම පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. එස්. අමරසේකර විසින් සාදන ලද 2007.07.18 දිනැති අංක 2247 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අඹගහකුඹුර නමැති, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බදුලුපිටිය පාර වරිපනම් අංක 17 දරන ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. ඩබ්ලිව් වෙල්ගොල්ල විසින් සාදන ලද 1959 මැයි මස 25 දිනැති අංක 1706ඒ දරන සැලැස්මේ සඳහන් ඉඩමේ නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. ආර්. ලිස්ක් සහ තවත් අයගේ වත්ත ද, නැගෙනහිරට : පාර ද, දකුණට : බදුලුපිටිය පාර සහ බස්නාහිරට : කුමාරනායගම්ගේ වත්ත යන මායිම් තුළ එකී අංක 2247 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් දහනවයක් (අ. 0, රූ. 01, පර්. 19) ක් විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

### හතරවැනි උපලේඛනය

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පිටිගල් කෝරළේ දකුණ, මැද පළාත මුදකටුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. සුමිත් ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 2007.09.10 දිනැති අංක 520බී දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෝවත්ත එස්ටේට් හෙවත් මුදුකටුයාය එස්ටේට් නමැති, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් 01 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. ඒ. ඩී. පී. රෙජිනෝල්ඩ් අප්පුහාමි විසින් හිමිකම් කියනු ලබන ඉඩම, පන්සල් වත්ත සහ පී. ඒ. ඩී. ජොහාන් අප්පුහාමි විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. පී. ෂෙල්ටන් සමරතුංග විසින් සාදන ලද අංක 4108බී දරන සැලැස්මේ සඳහන් ලොට් 01 සහ 16, එකී අංක 520බී දරන සැලැස්මේ සඳහන් ලොට් 02 සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : එකී අංක 520බී දරන සැලැස්මේ සඳහන් ලොට් 02 සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද, යන මායිම් තුළ එකී අංක 520බී දරන සැලැස්ම අනුව අක්කර පහක් (අ. 5, රූ. 0, පර්. 0) නොහොත් හෙක්ටයාර 2.06993 විශාල, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. සුමිත් ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 2007.09.10 දිනැති අංක 520බී දරන එකී සැලැස්මේ ලොට් 02 ලකුණු කළ මීටර් 6ක් පළල එකී ඉඩමට යන ප්‍රවේශ මාර්ගය සමග, ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නිති.

10-1084/2

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0080-102496-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.23 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1997 ඔක්තෝබර් මස 10 දිනැති අංක 226 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 03 හි ව්‍යාපාර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 4397 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන වී. අයි. පී. ටුවර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ ජර්මනිය පරුන්ක්පරට් 60329, මංචිනර් ස්ට්‍රේස් 35 හි ක්‍රිස්ටියැන්ස් ග්‍රීශ්බර් (මියගිය ඇන්ටන් එරල් හේරත් වික්‍රමරත්න යන අයගේ බූදලයේ ප්‍රොබේට් බලපත්‍රලාභී) යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඅටලක්ෂ පනස්හතරදහස් හැත්තෑ පහයි ශත අනූහතරක (රු. 28,54,075.94) මුදලක්. 2002 අප්‍රේල් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 28,54,075.94 මුදලද, 2002 මැයි මස 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 226 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහනගර සභා සීමාව තුළ කිරුළපන පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරකෝන් විසින් සාදන ලද 1997 මාර්තු මස 24 දිනැති අංක 582 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ස්ට්‍රැට්ෆර්ඩ් ඇවනියු, දැන් වරිපනම් අංක 78 දරන බුළුගහවත්ත නමැති ඉඩමේ ලොට් 6319 ලකුණු කළ (කිරුළපන කාණ්ඩ 64/289/79/269 හි ලියාපදිංචි කරන ලද අංක 4 දරන ලියාපදිංචි සැලැස්මෙහි ලොට් 83ඒ1හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරටඃ ස්ට්‍රැට්ෆර්ඩ් ඇවනියු, වරිපනම් අංක 76 දරන ලොට් 83 කියු 1ද, නැගෙනහිරටඃ ලොට් 6322 ද, දකුණට : ලොට් 6320 සහ බස්නාහිරටඃ ස්ට්‍රැට්ෆර්ඩ් ඇවනියු, වරිපනම් අංක 76 දරන ලොට් 83 කියු 1 ද යන මායිම් තුළ එකී අංක 582 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්.7.40) නොහොත් (හෙක්ටයාර 0.01872) විශාල, ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සහ එකී පරිශ්‍රයට අදාළ වෙනත් සියලු අයිතීන්, පරවශතා සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

10-1084/1

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් ලියා සහතික කරන ලද අංක 8085 හා 2006 ජුනි 27 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, "ෆොන්සේකා ලී බඩු" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ "අයිතිකරු" ලෙස ව්‍යාපාරය කරගෙන යන (මෙහි මින් ඉදිරියට "අයිතිකරු" යනුවෙන් සඳහන් කරන) කළුතර වෙදගේ අජිත් ලීනස් ෆොන්සේකා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජුනි 30 වැනි දිනට ඉහත කී අංක 8085 දරන උකස් බැඳුම්කරය මත එකී කළුතර වෙදගේ අජිත් ලීනස් ෆොන්සේකා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පන්ලක්ෂ හැටදහස් පන්සිය විසිහතකුත් ශත හැත්තෑඑකක (රු. 5,60,527.71) මුදලක් සහ 2009 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් හාරලක්ෂ අනූහයදහස් හයසිය තිහකුත් ශත නවයක් (රු. 4,96,630.09) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පන්ලක්ෂ හැටදහස් පන්සිය විසිහතකුත් ශත හැත්තෑඑකක (රු. 5,60,527.71) මුදල සහ 2009 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් හාරලක්ෂ අනූහයදහස් හයසිය තිහකුත් ශත නවයක් (රු. 4,96,630.09) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 8085 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 8085 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටුව නගරසභා බලප්‍රදේශය ඇතුළත මොරටුමුල්ලේ පිහිටි, බලයලත් මිනින්දෝරු ආර්. පී. පෙරේරා විසින් මැන සකස් කරන ලද අංක 604 හා 1970.01.10 දින දරන පිඹුරේ දැක්වෙන "කෝන්ගහවත්ත ලොට් ඒ 2" නැමැති ඉඩම වන උතුරට : ඩබ්ලිව්. එස්. වී. ප්‍රනාන්දුට අයිති ඉඩම ද, නැගෙනහිරට 9 සුසාන භූමියේ කාණුව ද, දකුණට : සුසාන භූමියේ කාණුව සහ මහමැන්ඩිගේ ඩේවිඩ් මෙන්ඩිස් ට අයිති ඉඩම ද, බස්නාහිරට: ඩබ්ලිව්. ජේ. බෙනටික් ප්‍රනාන්දුට අයිති ඉඩමද යන මායිම් ඇතුලත ඉහත කී අංක 604 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහසයක් (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම, බලයලත් මිනින්දෝරු එස්. ජේ. පීරිස් විසින් නැවත මනින ලදුව අංක 5932ඩී හා 2003.11.04 දරන පිඹුර ප්‍රකාර පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඉහත කී මොරටුමුල්ලේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. ජේ. පීරිස් විසින් මැන සකස් කරන ලද අංක 5932ඩී හා 2003.11.04 දින දරන පිඹුරේ දැක්වෙන "කෝන්ගහවත්ත ලොට් ඒ 2" දරන ඉඩමෙන් ලොට් අංක 01 දරන ඉඩම වන උතුරට ඊ. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට: නගර සභා කාණුව ද, දකුණට : ලොට් අංක 03 හා 04 සහ නගර සභා කාණුව සහ අංක 997 දරන පිඹුරේ ලොට් අංක 01 ද, බස්නාහිරට : ඩබ්ලිව්. ජේ. බී. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුලත ඉහත කී අංක 5932ඩී දරන පිඹුර ප්‍රකාර පර්චස් දහසයක් (අ. 0, රූ. 0, ප. 16) නොහොත් වර්ග මීටර 404.686 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

10-1073/10

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් යූ. විජේරත්න විසින් ලියා සහතික කරන ලද අංක දැනට බලාත්මකව පවතින 2006 සැප්තැම්බර් මස 04 වැනි දින අංක 180 දරන මුල් උකස් බැඳුම්කරය සහ අංක 181 දරන ද්විතීයික උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම්, "වසීම් හොටෙල් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි "අයිතිකරු" ලෙස රඹෑවේ ව්‍යාපාරය කරගෙන යන (මෙහි මින් ඉදිරියට "උකස්කරු" යනුවෙන් සඳහන් කරන) අහමදු ලෙබ්බෙ නිසාරා උම්මා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 මැයි 31 වැනි දිනට, එකී අංක 180 හා 181

දරන උකස් බැඳුම්කර මත, එකී අහමදු ලෙබ්බෙ නිසාරා උම්මා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දොලොස්ලක්ෂ හැටනවදහස් තුන්සිය විසිතුනකුත් ශත අසූ එකක (රු. 12,69,323.81) මුදලක් සහ 2009 ජුනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එකොලොස්ලක්ෂ විසිතුන්දහස් දෙසිය හතකුත් ශත හැත්තෑහතක (රු. 11,23,207.77) මුදලක් සඳහා (එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන) පහත සඳහන් පාදක පොලී අනුපාතික අතරින්, එනම් (අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය, (ආ) රඳවාගැනීමේ බදු අඩුකිරීමෙන් පසු, දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන පොලී අනුපාතිකය යන මෙයින්, ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පවතින වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහයි බිංදුවක (10.50%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දොලොස්ලක්ෂ හැටනවදහස් තුන්සිය විසිතුනකුත් ශත අසූ එකක (රු. 12,69,323.81) මුදලක් සහ 2009 ජුනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එකොලොස්ලක්ෂ විසිතුන්දහස් දෙසිය හතකුත් ශත හැත්තෑහතක (රු. 11,23,207.77) මුදලක් සඳහා (එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන) පහත සඳහන් පාදක පොලී අනුපාතික අතරින්, එනම් (අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය (ආ) රඳවාගැනීමේ බදු අඩුකිරීමෙන් පසු, දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන පොලී අනුපාතිකය යන මෙයින්, ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පවතින වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට දහයකුත් දශම පහයි බිංදුවක (10.50%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 180 සහ 181 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 180 සහ 181 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 102 ග්‍රාම නිලධාරි වසමේ ඉකිරිගොල්ලෑවේ, බෝගස්වැව ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයා විසින් මැන සාදවන ලද අංක 138 දරන අවසාන ගම් පිඹුරේ ලොට් අංක 157 දරන බිම් කට්ටියේ අනු බෙදීමක් වන, බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් මැන සකස් කළ අංක 2005/අනු/113 හා 2005 ඔක්තෝබර් මස 24 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 04 ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 03 ද, නැගෙනහිරට : ලොට් අංක 06 ද, දකුණට: ලොට් අංක 05 ද, බස්නාහිරට : අංක 138 අවසාන ගම් පිඹුරේ ලොට් අංක 155 (පාර සඳහා වෙන්කළ බිම) ද යන මායිම් ඇතුලත රූඩ් එකක් (අ. 0, රූ. 1, ප. 0) නොහොත් හෙක්ටෙයාර් දශම එකයි බිංදුවයි එකයි දෙකක් (හෙ. 0.1012) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර කරන ඉඩමේ අනු බෙදීමක් වේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 102 ග්‍රාම නිලධාරි වසමේ ඉකිරිගොල්ලෑවේ, බෝගස්වැව ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක 138 දරන අවසාන ගම් පිඹුරේ ලොට් අංක 157 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 156 ද, නැගෙනහිරට : අංක 536 දරන අවසාන ගම් පිඹුරේ දැක්වෙන ඉඩම ද දකුණට : ලොට් අංක 159 ද, බස්නාහිරට : ලොට් අංක 155 ද යන මායිම් ඇතුළත හෙක්ටෙයාර බිංදුවයි දශම හතයි තුනයි හතරක් (හෙ. 0.734) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

10-1073/11

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් ලියා සහතික කරන ලද අංක 12291 හා 2007 ජූලි 19 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම (මෙහි මින් ඉදිරියට "උකස්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) "එක්සෙල් මෝටර්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන පස්සර කොග්ගල ගන්හේවගේ කමනි රංජනී යන අය විසින් සහ (මෙහි මින් ඉදිරියට "ජීවිත බුක්තිය හිමිකරු" යනුවෙන් සඳහන් කරන) කොග්ගල ගන්හේවගේ නන්දියෙස් සිල්වා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි 31 වැනි දිනට ඉහත කී අංක 12291 දරන උකස් බැඳුම්කරය මත එකී කොග්ගල ගන්හේවගේ කමනි රංජනී සහ කොග්ගල ගන්හේවගේ නන්දියෙස් සිල්වා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දහතුන් ලක්ෂ හතළිස් හත් දහස් අටසිය තිස් එකකුත් ශත අසූ නවයක (රු. 13,47,831.89) මුදලක් සහ 2009 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දොළොස් ලක්ෂයක් (රු. 12,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දින වලදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මාධ්‍යක මූලික ණය පොළී

අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහතුන් ලක්‍ෂ හතළිස් හත් දහස් අටසිය තිස් එකකුත් ශත අසූ නවයක (රු. 13,47,831.89) මුදලක් සහ 2009 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දොළොස් ලක්‍ෂයක් (රු. 12,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දින වලදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 12291 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 12291 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර කෝරළේ, පස්සර කොට්ඨාසයේ, පස්සර නගරයේ පස්සර පිහිටි "දම්මේරිය එස්ටේට්" කොටසක් යනුවෙන් හැඳින්වෙන ඉඩම වන උතුරට : "දම්මේරිය එස්ටේට්" වත්තේ කොටසක් ද නැගෙනහිරට : වරිපනම් අංක 279 දරන කඩ ගොඩනැගිල්ල වෙන් වන බිත්තිය ද, දකුණට : "දම්මේරිය එස්ටේට්" වත්තේ කොටසක් ද, බස්නාහිරට : පස්සර-මඩකලපුව මහ පාරද යන මායිම් ඇතුළත පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 275 දරන ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ.

ඉහත සඳහන් දේපළ, බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් මැන සාදන ලද අංක 2458 හා 2006 මාර්තු 18 දින දරන පිඹුර ප්‍රකාර පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඉහත සඳහන් පස්සර නගරයේ පිහිටි "දම්මේරිය එස්ටේට්" නමැති ඉඩමේ කොටසක් ලෙස හැඳින්වෙන හා ප්‍රකට බෙදා වෙන් කළ බිම් කට්ටිය වන ඉහත සඳහන් අංක 2458 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන ඉඩමට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ක්‍රීඩා පිටිය සහ කනකසුන්දරම් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : කනකසුන්දර හිමිකම් කියන ඉඩම සහ මහවීදිය (මේන් ස්ට්‍රීට්) ද, දකුණට : මහ වීදිය (මේන් ස්ට්‍රීට්) ද, බස්නාහිරට : කුසුම් යසලාල් හිමිකම් කියන ඉඩමද යන මායිම් ඇතුළත පර්චස් හතරකුත් දශම තුනයි පහක් (අ. 0, රූ. 0, ප. 4.35) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 275 දරන ගොඩනැගිල්ල හා වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්‍ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලුපාර,
කොළඹ 03.

10-1073/2

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන පිළිවෙලින් එච්. එම්. සී. සී. එච්. මැණිකේ, එස්. වලතර සහ එන්. අයි. කරුණානන්ද විසින් ලියා සහතික කරන ලද අංක 2292/1561/513 හා 2007 දෙසැම්බර් මස 04, 2007 දෙසැම්බර් 14 සහ 2008 ජනවාරි මස 07 දින දරන සමගාමී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙමෝදර තජුඩීන් මොහොමඩ් අන්වර් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2009 මැයි 31 වැනි දිනට, ඉහත කී උකස් බැඳුම්කරය මත, එකී තජුඩීන් මොහොමඩ් අන්වර් යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් එක්ලක්‍ෂ හැත්තෑහත්දහස් පනස් තුනකුත් ශත විසිදෙකක් (රු. 1,77,053.22) මුදලක් සහ 2009 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එම රුපියල් එක්ලක්‍ෂ හැත්තෑහත්දහස් පනස් තුනකුත් ශත විසිදෙකක (රු. 1,77,053.22) මුදල සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්ලක්‍ෂ හැත්තෑහත්දහස් පනස් තුනකුත් ශත විසිදෙකක (රු. 1,77,053.22) මුදල සහ 2009 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එම රුපියල් එක්ලක්‍ෂ හැත්තෑහත්දහස් පනස් තුනකුත් ශත විසිදෙකක් (රු. 1,77,053.22) වූ මුදල සඳහා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2292/1561/513 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා එහි පිහිටි සියලු දේ බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 2292/1561/513 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, කුඹල්වෙල කෝරළේ, මැදිකිඳ, නාඋල්ල ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 35 දරන "අස්වැද්දුමේ වත්ත" නමැති ඉඩම වන බෙදා වෙන්කළ ඉඩමට මායිම්, උතුරට : ගල් මායිම ද, නැගෙනහිරට : උක්කුබණ්ඩාට අයිති වරිපනම් අංක 37 දරන නිවසේ පොදු බිත්තිය සහ එම පොදු බිත්තිය දිගට තිබෙන වැට ද, දකුණට :

ප්‍රධාන පාර සහ බස්නාහිරට : එම්. බී. ඩීබල් සිල්වාට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස වෙන්වන වැට සහ වරිපනම් අංක 33 දරන නිවසේ පොදු බිත්තිය ද යන මායිම් ඇතුළත ප්‍රධාන පාර දිගට අඩි දොළහක් පළල සහ උතුරේ සිට දකුණට දිග අඩි හතළිහක් (අඩි 12 x අඩි 40) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් මෑතකදී මැන සකස් කරන ලද අංක 2728 හා 2006.12.17 දින දරන පිඹුරට අනුව ඉහත සඳහන් ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, කුඹල්වෙල කෝරළේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතුළත, ගොටුවෙල ග්‍රාමයේ (එෆ්වීපී 02), නාඋල්ලේ පිහිටි, වරිපනම් අංක 35 දරන "අස්වැද්දුමේ වත්ත" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බෙදාවෙන්කළ කොටසක් වන, උතුරට: අඩිපාර සහ එච්. එම්. අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට: එච්. එම්. අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, දකුණට : පාර (H) සහ එස්. ඛාන් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : එස්. ඛාන් හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් තුනකුත් දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, ප. 3.32) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-1073/1

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

වික්‍රමකරලු ආරච්චිගේ ඇන්ජලීනා ප්‍රනාන්දු.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ෂලී කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය) වශයෙන් හඳුන්වනු ලබන අංක 787 සහ 2007 සැප්තැම්බර් මස 21 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) අංගොඩ හිඹුටාන ජයන්ති මාවතේ 194/3 දරන ස්ථානයේ පදිංචි වික්‍රමකරලු ආච්චිගේ ඇන්ජලීනා ප්‍රනාන්දු යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2009.05.11 වැනි දිනට රුපියල් දහඅටලක්ෂ හැත්තෑඑක්දහස් දෙසිහැටනවයකුත් ශත හැටපහක (රුපියල් 1,871,269.65) මුදලක් වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින්ද,

ඉහත කී රුපියල් දහඅටලක්ෂ හැත්තෑඑක්දහස් දෙසියහැටනවයකුත් ශත හැටපහක (රුපියල් 1,871,269.65) මුදල සහ 2009.05.11 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් දහහත්ලක්ෂ විසිහයදහස් හයසියහතළිස්පහකුත් ශත දහසයක (රුපියල් 1,726,645.16) මුදල මත 2009.05.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 26.25% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක චරිත් සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ (කඩුවෙල ඒකකයේ) කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ වැලිවිට පිහිටි කනෙයියාහොරකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1120/9000 සහ 2000 අප්‍රේල් මස 30 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 6ඩී නමැති බිම් කොටසට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 1551 දරන පිඹුරේ ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් 6සී සහ 6අයි ද, දකුණට : 6අයි සහ 6බී ද, බස්නාහිරට: අංක 694 දරන පිඹුරේ ලොට් බී ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1120/9000 දරන පිඹුර අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්89/227 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී බිම් කැබැල්ලට ඉහත සඳහන් අංක 787 දරන උකස් බැඳුම්කරයේ සවිස්තරව දක්වා ඇති පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

10-1062/2

## රුහුණ සංවර්ධන බැංකුව - පිටබැද්දර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2009.08.14 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මොහාන් එල්. ජී. ගමාච්චිගේ මහතා විසින් සහතික කරන ලද 2008.09.11 දිනැති අංක 7144 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පිටබැද්දර, සියඹලාගොඩ (බටහිර) "ලීලානි" ලිපිනයේ පදිංචි හබරකඩ ලියනගේ පත්ම කුමාර මහතා/හබරකඩ ලියනගේ ජිනදාස මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්‍ෂ හැත්තෑහයදහසක (රු. 476,000) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2009.01.05 දින සිට වර්ෂයකට 31% බැගින් රුපියල් හාරලක්‍ෂ හැත්තෑහයදහසක (රු. 476,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 7144 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලයේ, සියඹලාගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සියඹලාගොඩ ගමේ පිහිටි පත්‍ර අංක 07හි අ. ග. සි. 12 හි අංක 20 එෆ් දරන කණ්නඩිමුල්ලෙහේන නම් වූ, උතුරට : ටී. පී. ටී. 2780 දරන ඉඩම වෙන්වීමට ඇති ඇල, අංක 1 - ඒ, සහ 20 ජී දරන කැබැලි ද, නැගෙනහිරට : අංක 20ඕ දරන කැබැල්ලද, දකුණට : නිල්වලා ගඟ රක්‍ෂිතය ද, බස්නාහිරට : ටී. පී. ටී. 2780 දරන ඉඩම වෙන්වීමට ඇති ඇල සහ අංක 01ඒ දරන කැබැල්ලද, මායිම් වූ මැදින් වැටී ඇති ඇල හැර, අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් විසි හතරක් (අක්. 01, රූ. 03, පර්. 24) ක් විශාල ඉඩමේ මුළු බිම, එතුළ පිහිටි සියළු ගහකොළ, පළතුරු ආදිය සමග වේ. (අංක 517 සහ 1938.09.01).

මෙම දේපල මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 18/44, වං 09/127 යටතේ 2008.09.12 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී,

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන, මාතර.
2009 අගෝස්තු මස 14 වැනි දින.

10-1032/3

## නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ජයසිංහ ආරච්චිගේ සකුන්තලා ගජවීර සහ බන්දුල සරත් ගජවීර.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ෂලී කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන) අංක 933 සහ 2008 මැයි මස 06 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු බන්ධනදායින් වශයෙන් හඳුන්වනු ලබන) ජයසිංහ ආරච්චිගේ සකුන්තලා ගජවීර සහ බන්දුල සරත් ගජවීර යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) කොළඹ 04 වජිර පාරේ අංක 50-211 දරන ස්ථානයේ පදිංචි ජයසිංහ ආරච්චිගේ සකුන්තලා ගජවීර යන අය විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත කී බන්ධනදායින් ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2009.05.11 වැනි දිනට රුපියල් පහළොස්ලක්‍ෂ අටදහස් පන්සිය හයකුත් ශත පහළොවක (රුපියල් 1,508,506.15) මුදලක් වර්තමානයේදී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් පහළොස්ලක්‍ෂ අටදහස් පන්සියහයකුත් ශත පහළොවක (රුපියල් 1,508,506.15) මුදල සහ 2009.05.11 වැනි දනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් දහහතරලක්‍ෂ එකසියහැටහතරකුත් ශත අනූහතක (රුපියල් 1,400,164.97) මුදල මත 2009.05.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 29% බැගින් තවදුරටත් පොළියද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන්ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු ඉහළගේ ක්‍රිස්ටි ඇලෙස්ටර් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වලපොල පට්ටිය පිහිටි දවටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කරුණාරත්න කොස්තා විසින් මැන සාදන ලද අංක 3559 සහ 2005 දෙසැම්බර් මස 17 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 01 නමැති බිම් කොටසට මායිම්, උතුරට : අංක 905 දරන පිඹුරේ ලොට් බී ද,

නැගෙනහිරට : අංක 2446 දරන පිඹුරේ ලොට් එච් වන වර්තමානයේ අඩි 15ක් පළල පාර සහ ලොට් 2 ද, දකුණට : ලොට් 2 සහ කහටගහවත්ත නොහොත් මෝදර ආචාරිගේවත්ත ද, බස්නාහිරට : කහටගහවත් නොහොත් මෝදර ආචාරිගේවත්ත සහ අංක 905 දරන පිඹුරේ ලොට් ඩී ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3559 දරන පිඹුර අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, ප. 10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත කී බිම් කැබැල්ලට ඉහත සඳහන් අංක 933 දරන උකස් බැඳුම්කරයේ සවිස්තරව දක්වා ඇති මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

10-1062/1

---

## මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.28 වන දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද අංක 1823 හා 2005.02.15 දින දරන උකස්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම හේමසිරි නන්දලාල් වැලිකල මහතා සහ තලගලගේ දයානි ජානකී මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 1823 දරන බැඳුම්කර මත රුපියල් පහළොස් ලක්ෂ නව දහස් දෙසිය තිස් දෙකයි ශත අනූ පහක (රු. 15,09,232.95) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් පහළොස් ලක්ෂ නවදහස් දෙසිය තිස් දෙකයි ශත අනූපහක (රු. 15,09,232.95) එකී මුදල ද 2009 පෙබරවාරි 19 වන දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත, වර්ෂයකට සියයට පහළොවයි දශම පහ (15.5%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඹ වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 1823 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, අදිකාරි පත්තුවේ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මුල්ලේරියාවේ පිහිටියා වූ ද, "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද අංක 4197 සහ 1994 මාර්තු 22 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : අඩි 15ක් පළල පාර ද, නැගෙනහිරට: මෙම ඉඩමේ ම කොටසක් ද, දකුණට : සාදිරිස්ගේ දේපල ද, බස්නාහිරට: පාර ද, මායිම්වන්නා වූ එකී අංක 4197 දරන පිඹුරට අනුව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල වූ ද, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 71/158 යටතේ ලියා පදිංචිකර ඇත්තා වූ ද, වෙන්කල මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 71/255 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප 11.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත)
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

10-1100

---

## මහජන බැංකුව - යක්කල

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.09.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.02.03 දිනැති අංක 9876 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ජයසේකර මුදලිගේ අශෝකා ස්වර්ණපාලි ජයසේකර සහ තනහීන්ගේ බන්දුල සුරවීර පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක් ලක්ෂ අසූහත් දහස් හයසිය තිස් හයයි ශත තිස් අට (රු. 187,636.38) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.06.01 දින සිට වර්ෂයකට 20.25% බැගින් රුපියල් එක් ලක්ෂ අසූහත් දහස් හයසිය තිස් හයයි ශත තිස් අට (රු. 187,636.38) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක් ලක්ෂ අසූ හත් දහස් හයසිය තිස් හයයි ශත තිස් අට (රු. 187,636.38) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර රන්ජිත එස්. මහානාම විසින් එකී අංක 9876 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපල පිලිබඳ විස්තර

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, මාරපොල ගමෙහි පිහිටි මාරපොල එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ මහතා විසින් 1996.04.26 දින මැන (1996.08.24 දින සහතික කර ඇති) සකස් කරන ලද පිඹුරු අංක 1883 හි ලොට් 140 දරන කොටසට මායිම් උතුරට : ලොට් 76 ද, නැගෙනහිරටඃ ලොට් 14 ද, දකුණට : 141 ද, බස්නාහිරට : ඒ. ඩබ්. මෛත්‍රීරත්නගේ උරුමකරුවන් හිමිකම් කියන රබර් ඉඩම ද යන මායිම් තුල පිහිටි පර්චස් දාහතයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 17.5) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේ ත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 222/22 යටතේ ලියාපදිංචි වී ඇත.

පිඹුරු අංක 1883 හි සඳහන් ලොට් 14හි (මීටර් 9.75ක් පළල) මාර්ගය සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද,

ඉහත කී පිඹුරේ මාර්ග සඳහා වෙන්කර ඇති කොටස් වල මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ, අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර, බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-1108

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1981 හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/73574/ටීඑෆ් 1/354

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.04.07 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ඩී. යූ. දේශප්‍රිය විසින් සහතික කරන ලද 2002.10.21 දින හා අංක 489 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙහිඹිවිට පදිංචි රන්හේලි ජේඩිගේ පියතිස්ස ජයකොඩි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.03.25 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් හාරලක්ෂ විසි එක් දහස් අටසිය හතයි ශත හැත්තෑ දෙක (රු. 421,807.72) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 489 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ හතරයි ශත අනූ දෙක (රු. 84.92) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර කැස්බෑව, වලව්වත්ත, ධම්මික, අංක 228/ඒ හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### ඉහත සඳහන් උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ මෙගොඩපොත උපකාර්යාල සීමාවට අයත් රුවන්පුර නොහොත් බෙරළුන්න පිහිටි දෙල්ගහවත්ත කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. විජේවර්ධන විසින් මැන සකසන ලද 2001.11.08 දින සහ අංක 152/2001 දරන පිඹුරේ ප්‍රමාණයෙන් (අක්. 0, රූ. 0, පර්. 12)ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියළු දේත් වේ.

තව ද, එකී පිඹුරු අංක 152/2001 මතින් දක්වා ඇති අඩි 12ක් පළල පාර සහ ඊට අයිති සියළු දේත් වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03.
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1004/2

---

### ඩීඑෆ්සීසී බැංකුව

#### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් ලියා සහතික කරන ලද අංක 8591 හා 2001 අගෝස්තු 02 දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම්, "හේමචන්ද්‍ර හොටෙල් ඇන්ඩ් බේකරි" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන වැල්ලවායේ, අගරු කංකානම්ගේ හේමචන්ද්‍ර කුලතිස්ස යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2009 අප්‍රියෙල් 30 වන දිනට ඉහත කී අංක 8591 හා 2001

අගෝස්තු 02 දින දරන උකස් බැඳුම්කරය මත, එකී අගරු කංකානම්ගේ හේමචන්ද්‍ර කුලතිස්ස යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හය ලක්ෂ හතලිස් දෙදහස් දෙසිය තිස් හතරකුත් ශත හතලිස් පහක (රු. 642,234.45) මුදලක් සහ 2009 මැයි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාර ලක්ෂ තිස්තුන් දහස් අටකුත් ශත අනූ හතක් (රු.433,008.97) වර්ෂයකට සියයට දහ හතරක් (14%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හය ලක්ෂ හතලිස් දෙදහස් දෙසිය තිස් හතරකුත් ශත හතලිස් පහක (රු.642,234.45) මුදලක් සහ 2009 මැයි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ තිස්තුන් දහස් අටකුත් ශත අනූ හතක් (රු.433,008.97) වර්ෂයකට සියයට දහ හතරක් (14%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 8591 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1995 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 8591 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, වැල්ලවායේ පිහිටි, "දෙයියන්නේකුඹුර" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විල්මට් සිල්වා විසින් මැන සාදන ලද අංක 130 හා 1985 ඔක්තෝබර් 19 දින දරන පිඹුරේ ලොට් අංක බී1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : මළ ආර ද, නැගෙනහිරට : දිය පාර සහ පාර ද, දකුණට : ලොට් බී2 බිම් කට්ටිය ද, බස්නාහිරට : අංක 1958ඒ දරන පිඹුරේ ලොට් ඒ දරන බිම් කට්ටිය ද, යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් තිස 'පහක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 35) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මාර්ග අයිතිය සම්බන්ධයෙන්-

මෙහි පහත විශේෂයෙන් විස්තර කර තිබෙන පාරක් සඳහා වෙන් කළ බිමෙන්, එය ඔස්සේ හෝ ඒ මතින් උකස්කරුට, ඔහුගේ ආගන්තුකයින්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහ නිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට, සහ ආරාධිතයන්ට මින් මතු සෑම විටකම ඔවුන්ගේ අභිමතය හා කැමැත්ත පරිදි කවර වූ සහ සියලු කාර්ය සඳහා පයින් හෝ අන්‍යාකාරයකින්, අශ්වයින්, ගව ආදී සතුන් ඇතිව හෝ නොමැතිව ද, මෝටර් කාර්, ලොරි රථ, සහ වෙනත් ඕනෑම වර්ගයක බර පැටවූ හෝ නොපැටවූ වාහනයකින් දිවා හෝ රාත්‍රි කාලයේ දී, ප්‍රවේශ වීමට, පිටව යාමට හෝ ප්‍රත්‍යාගමනයට පූර්ණ, බාධා විරහිත අයිතිවාසිකම, නිදහස හා අවසරය ද එම අවසරයට අයත් හෝ ආබද්ධ වූ සහ ඒ හා සමඟ භුක්ති විඳිනු ලබන, දරනු ලබන, හා සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලු හා එක් එක් එල ප්‍රයෝජන, අයිතිවාසිකම් හා ලාභ ප්‍රයෝජන ද, ඒ බිම මතින්, එය තුලින්, ඊට ඉහලින්, යටින් සහ/හෝ එය ඔස්සේ විදුලි කේබල්, සහ මුදුන් කම්බි, ජලපවහන හා ගෑස් නල, ජලනල, හා වෙනත් උවාරණ සහ කවර වූ හෝ වර්ගයක හෝ ස්වභාවයක උපක්‍රම ආදිය යෙදීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම ද මෙයට ඇතුළත් වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-1073/4

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම් සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1440 හා 2006 අගෝස්තු 11 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "මහවෙල ස්ටෝර්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන ඇටම්පිටියේ, ජයසිංහ මුදියන්සේලාගේ ජයරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි 31 වන දිනට ඉහත කී අංක 1440 දරන උකස් බැඳුම්කරය මත එකී ජයසිංහ මුදියන්සේලාගේ ජයරත්නගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හාරලක්ෂ හැත්තෑතුන්දහස් පන්සිය අසූහයකුත් ශත විසි තුනක (රු. 473,586.23) මුදලක් සහ 2009 පෙබරවාරි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ තිස්පන් දහස් අනූතුනකුත් ශත විසිහතක් (රු. 335,093.27) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හාරලක්ෂ හැත්තෑතුන්දහස් පන්සිය අසූහයකුත් හත විසි තුනක (රු.473,586.23) මුදල සහ 2009 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ තිස්පන් දහස් අනූ තුනකුත් ශත විසි හතක් (රු.335,093.27) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රියෙල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවල ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ

ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1440 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1440 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරනලද දේපල විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දෙහිවිණිපළාත කෝරළේ, ඇටම්පිටිය නගරයේ පිහිටි "දියබෝලතැන්නේ කුඹුර සහ දියවෙලතැන්නේ පතන" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, (බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සාදන ලද 1186 දරන පිඹුරේ ලොට් අංක 7 හි කොටසක් වන) බලයලත් මිනින්දෝරු ඒ. ඒ. එස්. අමරසේකර විසින් මැන සාදන ලද අංක 1879 හා 2006 අප්‍රියෙල් 25 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ඇළ ද, නැගෙනහිරට : ඇළ සහ පැළ ඉණි වැට ද, දකුණට : පාරේ (මහාමාර්ග) රිසවේසම ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඒ . ඒ. එස්. අමරසේකර විසින් මැන සාදන ලද අංක 1868 දරන පිඹුරේ ලොට් අංක 1 සහ බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සාදන ලද අංක 1186 දරන පිඹුරේ ලොට් අංක 6 ද, යන මායිම් ඇතුළත පර්චස් දහඅටකුත් දශම පහයි බිංදුවක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 18.50) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

බලයලත් මිනින්දෝරු ඒ. ඒ. එස්. අමරසේකර විසින් මැන සාදන ලද අංක 1879 හා 2006 අප්‍රියෙල් 25 දින දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉහත සඳහන් ඉඩම මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසක් වේ :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ දෙහිවිණි පළාත කෝරළේ, ඇටම්පිටිය නගරයේ පිහිටි, "දියබෝලතැන්නේ කුඹුර" "දියවෙලතැන්නේ පතන සහ දියබෝලතැන්නේ මල්වත්ත" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මායිල් විසින් මැන සාදන ලද අංක 1186 හා 1979 සැප්තැම්බර් 20 දින දරන පිඹුරේ ලොට් අංක 7 ලෙස දැක්වෙන බිම් කට්ටිය වන උතුරට : ඇළ ද, නැගෙනහිරට : ඇළ සහ පැළ ඉණි වැට ද, දකුණට : (මහාමාර්ග) පාරේ රිසවේසම ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මායිල් විසින් මැන සාදන ලද අංක 1186 දරන පිඹුරේ ලොට් අංක 6 ද, යන මායිම් ඇතුළත පර්චස් විස්නවයත් දශම අටයි බිංදුවක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 29.80) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.

10-1073/3

**ඩීඑෆ්සීසී බැංකුව**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද අංක 1384 හා 2006 ජූලි 18 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "මාධවී සැලූන් ඇන්ඩ් කමියුනිකේෂන් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස බදුල්ලේ ව්‍යාපාරය කරගෙන යන රාජකරුණා බන්දුල ප්‍රභාත් සහ රාජකරුණා ඇල්ප්‍රඩ් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජූනි 30 වන දිනට ඉහත කී අංක 1384 දරන උකස් බැඳුම්කරය මත එකී රාජකරුණා බන්දුල ප්‍රභාත් සහ රාජකරුණා ඇල්ප්‍රඩ් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තුන්ලක්ෂ හැත්තෑතුන් දහස් එකසිය අනූනවයකුත් ශත හැටක (රු.3,73,199.60) මුදලක් සහ 2009 ජූලි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ හතලිස් දහස් නවසිය හතලිස් එකක් (රු.3,40,941.00) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්ලක්ෂ හැත්තෑතුන් දහස් එකසිය අනූනවයකුත් ශත හැටක (රු.3,73,199.60) මුදල සහ 2009 ජූලි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් තුන්ලක්ෂ හතලිස් දහස් නවසිය හතලිස් එකක් (රු.3,40,941.00) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1384 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1384 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්නේ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රිදීකොටලියගම පිහිටි, සමගිපුර නිවාස යෝජනා ක්‍රමයේ, පුහුල්යාය යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, ස්ර්වේයර් ජනරාල්වරයා විසින් සහතික කරන ලද ටී.පී.පී. 57 (Sup. Plan 02) හා 1987.11.19 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2035 දරන බෙදා වෙන්

කල බිම් කට්ටියට මායිම්, උතුරට : අංක ටී.පී.පී. 57 පිඹුරේ ලොට් අංක 2032 ද, නැගෙනහිරට : අංක ටී. පී. පී. 57 පිඹුරේ ලොට් අංක 2034 ද, දකුණට : අංක ටී.පී.පී.57 පිඹුරේ ලොට් අංක 2036 ද, බස්නාහිරට: අංක ටී.පී.පී. 57 පිඹුරේ ලොට් අංක 2026 ද යන මායිම් ඇතුලත හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි අටයි හතක් (හෙ. 0.0287) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-1073/5

---

### සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. එන්. සී. ජයකොඩි විසින් ලියා සහතික කරන ලද අංක 449 හා 2007 අගෝස්තු මස 08 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් කුලියාපිටියේ, බද්දෙගම ලියනආරච්චිගේ දුලිප් අසේල බද්දේගම යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2009 ජූනි මස 30 වැනි දිනට, ඉහත කී අංක 449 දරන උකස් බැඳුම්කරය මත, ඉහත කී බද්දේගම ලියනආරච්චිගේ දුලිප් අසේල බද්දේගම යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් එකොලොස් ලක්ෂ තිස්හය දහස් හයසිය තිස් නවයකුත් ශත අසූපහක (රු. 11,36,639.85) මුදලක් සහ 2009 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් නවලක්ෂ අසූඑක්දහස් තුන්සිය හැත්තෑඑකකුත් ශත දහතුනක් (රු. 9,81,371.13) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලදී බැංකුව විසින් ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන,ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එකොලොස් ලක්ෂ තිස්හය දහස් හයසිය තිස් නවයකුත් ශත අසූපහක (රු.11,36,639.85) ක මුදල සහ 2009 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා, එයින් රුපියල් නවලක්ෂ අසූ එක් දහස් තුන්සිය හැත්තෑඑකකුත් ශත දහතුනක් (රු. 9,81,371.13) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලදී බැංකුව විසින් ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලිය ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්. පී.ආර්.) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහල අනුපාතිකයක් මත ගනන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 449 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 449 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය

01. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරලේ, මැද පළාතේ, දූන්කන්නාව ග්‍රාමයේ පිහිටි, “දූන්කන්නාව එස්ටේට් ඩිවිෂන් 01” යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් මැන සකස් කරන ලද අංක 3697 හා 2001 මාර්තු මස 06 වැනි දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 18 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන එකී ලොට් අංක 18 දරන බිම් කට්ටියට ඉහත කී අංක 3697 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : එකී අංක 3697 පිඹුරේ ලොට් අංක 10 ද, නැගෙනහිරට : එකී අංක 3697 පිඹුරේ ලොට් අංක 19 ද, දකුණට : නාත්තන්ඩියේ සිට උඩුබද්දාවට යන ප්‍රධාන පාර ද, බස්නාහිරට : එකී අංක 3697 පිඹුරේ ලොට් අංක 17 ද යන මායිම් ඇතුළත පර්චස් පහළොවක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 15) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොල, වැවිලි හා වෙනත් සියලු දේ. මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

02. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරලේ, මැද පළාතේ, දූන්කන්නාව ග්‍රාමයේ පිහිටි, “දූන්කන්නාව එස්ටේට් ඩිවිෂන් 01” යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් මැන සකස් කරන ලද අංක 3697 හා 2001 මාර්තු මස 06 වැනි දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 19 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන එකී ලොට් අංක 19 දරන බිම් කට්ටියට ඉහත කී අංක 3697 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : එකී අංක 3697 පිඹුරේ ලොට් අංක 20 ද, නැගෙනහිරට : එකී අංක 3697 පිඹුරේ ලොට් අංක 23,24,27,28,31 සහ 32 ද, දකුණට : නාත්තන්ඩිය සහ උඩුබද්දාවට යන ප්‍රධාන පාර ද, බස්නාහිරට : එකී අංක 3697 පිඹුරේ ලොට් අංක 18,10,09,07,05,03 සහ 02 ද යන මායිම් ඇතුලත පර්චස් විසිහතරකුත් දශම හතරක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 24.4) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම, සංවර්ධනය කර මාර්ගය අයිතිය ලෙස පවත්වා ගැනීම සඳහා මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-1073/ 7

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. එස්. කන්නංගර විසින් ලියා සහතික කරන ලද අංක 324 හා 2005.05.26 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ අංක 293 හා 2005.04.01 වැනි දින දරන චාතුර්ථක උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර දෙක මත ද, ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අබයවර්ධන ලියා සහතික කළ අංක 2068 හා 2003.02.21 වැනි දින දරන තෘතීයික උකස් බැඳුම්කරය මත ද අයවිය යුතු මුදල් ගෙවීම, "රත්නසිරි හාඩ්වෙයාර්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ඉංගිරියේ ව්‍යාපාරය කරගෙන යන කත්‍රී ආරච්චිගේ රත්නසිරි නන්දන යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට, ඉහත කී කත්‍රි ආරච්චිගේ රත්නසිරි නන්දන යන අයගෙන් ඉහත කී අංක 324, 293 හා 2068 දරන උකස් බැඳුම්කර මත ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දහහතර ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය තිහකුත් ශත අනූනවයක (රු.14,72,430.99) මුදලක් සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දසලක්ෂ තිස්තුන් දහස් තුන්සිය දහහතරක් (රු.10,33,314) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දින වල දී ප්‍රතිශෝධනය කරනු ලැබූ බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද රුපියල් දෙලක්ෂ හැත්තෑ දහස් අටසිය විසිහයක් (රු. 2,70,826) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දින වලදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්.) වර්ෂයකට සියයට හතරක් (4%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය සහ රුපියල් එක්ලක්ෂ අටදහස් තුන්සිය විසිහයක් (රු.108,326) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවල දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්.) වර්ෂයකට සියයට හතරක් (4%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහහතර ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසිය තිහකුත් ශත අනූනවයක (රු.14,72,430.99) මුදල සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දසලක්ෂ තිස්තුන් දහස් තුන්සිය දහහතරක් (රු.10,33,314) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්.පී.ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද, රුපියල් දෙලක්ෂ හැත්තෑ දහස් අටසිය විසිහයක් (රු.270,826) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දින වලදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්.) වර්ෂයකට සියයට හතරක් (4%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය සහ රුපියල් එක් ලක්ෂ අටදහස් තුන්සිය විසිහයක් (රු.108,326) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවල දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්.) වර්ෂයකට සියයට හතරක් (4%) ඉහල අනුපාතිකයක් මත ගනන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 324,293 හා 2068 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 324, 293 හා 2068 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ, උඩුගහ පත්තුවේ, ඌරුගල ග්‍රාමයේ දැනට ඉංගිරියේ පිහිටි පුවක්වත්ත යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. සෝමසිරි විසින් මැන සාදන ලද අංක 801 හා 2000.01.18 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරට: මෙම ඉඩමේ ලොට් එෆ් දරන කට්ටිය ද නැගෙනහිරට : ලොට් "බී" ලෙස දැක්වෙන පුවක්වත්ත ද, දකුණට : ඉහත සඳහන් අංක 801 දරන පිඹුරේ ලොට් අංක 2 ද, බස්නාහිරට : මහ පාර ද, යන මායිම් ඇතුලත පර්චස් දහයක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 10) හෝ හෙක්ටයාර් 0.02530 බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-1073/6

---

**මහජන බැංකුව - හෝමාගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2009.08.28 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කළ 1998.10.07 හා 2155 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් 2006.11.22 දින හා 2577 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම අරලිය ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2155 හා 2577 දරන බැඳුම්කර මත රුපියල් දාහත් ලක්ෂ අටදහස් හත්සිය අනූ දෙකයි සත විසි පහක (රු. 17,08,792.25) මුදලක් සහ රුපියල් විසිතුන් ලක්ෂ අනූ දෙදහස් හාරසිය අසූ පහයි සත පනස් හයක (රු. 23,92,484.56) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින්, රුපියල් දාහත් ලක්ෂ අටදහස් හත්සිය අනූ දෙකයි ශත විසිපහක (රු.17,08,792.25) එකී මුදල ද, රුපියල් විසිතුන් ලක්ෂ අනූ දෙදහස් හාරසිය අසූපහයි ශත පනස් හයක (රු. 23,92,485.56) එකී මුදල ද 2008.12.21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දාහත් ලක්ෂ අටදහස් හත්සිය අනූ දෙකයි සත විසි පහක (රු.17,08,792.25) මුදලක් මත වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් වූ තවදුරටත් පොළිය ද 2008.12.21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් විසිතුන් ලක්ෂ අනූ දෙදහස් හාරසිය අසූ පහයි සත පනස් හයක (රු. 23,92,485.56) මුදලක් මත වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු,අය කර ගැනීම සඳහා අංක 2155 සහ 2577 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, හෝමාගම උප දිසාපති කොට්ඨාසය තුළ හෝමාගම කටුවාන පාරේ පිහිටියාවූ ද, "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සහතික කළ අංක කො. 7285 හා 1992 සැප්තැම්බර් මස 27 දින දරන මුලික පිඹුරේ ලොට් 3 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : කො. 6996 මුලික පිඹුරේ ලොට් මු. අංක 53 හා 97 සහ එකී කො. 7285 පිඹුරේ ලොට් අංක 4 ද, නැගෙනහිරට : එකී කො. 7285 මු. පිඹුරේ ලොට් අංක 4 ද, දකුණට : පී. ජී. හපුදෙනිය හිමිකම් කියන හෙරලියගහ කුඹුර ද, බස්නාහිරට : 6996 වූ පිඹුරේ ලොට් 50,51 සහ 53 ද මායිම්වන්නා වූ ද එකී අංක කො. 6996 පිඹුරට අනුව හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි නවයයි හතයි එකක් විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුලු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි , ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ත් ය.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී1150/159 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන ඉඩම් කොටස් උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් පොදු අයිතිවාසිකම් ද මීට ඇතුළත් වේ.

1. ඉහත කී හෝමාගම කටුවාන පාරේ පිහිටියා වූ ද, මිල්ලගහවත්ත සහ කැකුණලන්ද යයි කියනු ලබන ඉඩම්වල සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද කො. 6996 හා 1990 මැයි මස 28 වැනි දින දරන මු. පිඹුරේ ලොට් අංක 53 (පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 131, 130, 129,128,127,126,125, 124, 123, 122, 121, 120, 119,118, 58,56,54,95,96,92,91,90 හා 89 ද, නැගෙනහිරට : ලොට් අංක 54, 56, 58, 59, 61, 62, 63, 65, 66, 68, 70, 105 සිට 120 දක්වා ද, දකුණට : ලොට් අංක 66, 68, 70, 71, 75, 77, 78, 81, 52, 51, 97, 89 සිට 109 දක්වා ද, බස්නාහිරට : ලොට් අංක 51, 38, 37, 36, 35, 149, 153, 154, 155, 131, 130, 91, 90, 89, 88, 84, 83, 82, 81, 78 හා 77 ද මායිම් වන්නා වූ ද එකී කො. 6996 වූ පිඹුරට අනුව හෙක්ටයාර් එකයි දශම හයයි හතරයි හයයි හතක් (හෙ.1.6467) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු බිම් කොටස, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී 1150/159 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී හෝමාගම කටුවාන පාරේ පිහිටියා වූ ද, මිල්ලගහවත්ත යයි කියනු ලබන ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද ඉහත කී කො. 6996 දරන පිඹුරේ ලොට් අංක 51 (පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 52 සහ 53 ද, නැගෙනහිරට : ලොට් අංක 48, 49, 50, 98 සහ 52 ද, දකුණට : ලොට් අංක 98, 50, 49, 48, 47, 46, 45 හා 43 ද, බස්නාහිරට : ලොට් අංක 45, 44, 43, 42, 41, 40, 39 හා 52 ද, මායිම් වන්නා වූ ද, එකී අංක 6996 දරන මූ. පිඹුරට අනුව හෙක්ටෙයාර් බිංදුවයි දශම දෙකයි හතයි හතරයි දෙකක් විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1169/110 යටතේ ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී කටුවාන පිහිටියා වූ ද, කැකුණලන්ද යයි කියනු ලබන ඉඩමේ ඉහත කී කො. 6996 දරන මූ. පිඹුරේ ලොට් අංක 138 (පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : බී. ඒ. ඩී. ප්‍රේමචන්ද්‍ර විසින් හිමිකම් කියන කැකුණලන්ද සහ ලොට් අංක 137, 136, 135, 134, 133 හා 132 ද, නැගෙනහිරට : ලොට් අංක 53 (පාර) ද, දකුණට : පී. පී. කො. 6706 පිඹුරේ ලොට් 2 (කොටසක්), ලොට් අංක 139, 142, 143, 146, 147. 151, 152, 154 හා 155 ද, බස්නාහිරට : කටුවාන පාර ද මායිම් වන්නා වූ එකී පී. පී. කො. 6996 පිඹුරට අනුව හෙක්ටයාර් බින්දුවයි දශම තුනයි නවයයි නවයක් (හෙ. 0.3399) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1169/111 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී හෝමාගම කටුවාන පාරේ පිහිටියා වූ ද කැකුණලන්ද යයි කියනු ලබන ඉඩමේ ඉහත කී කො. 6996 දරන මූ. පිඹුරේ ලොට් අංක 149 (පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පී. පී. කො. 6706 පිඹුරේ ලොට් 2 සහ ලොට් අංක 140, 141, 144, 145, 148, 150 සහ 153 ද, නැගෙනහිරට : ලොට් 53 (පාර) ද, දකුණට : පී. ජී. හපුදෙනිය, එස්. එස්. රාමනායක හා ඩී. පී. රාමනායක විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත යයි කියනු ලබන ඉඩම සහ ලොට් අංක 34 සහ 35 ද, බස්නාහිරට : කටුවාන පාර ද මායිම් වන්නා වූ ද එකී පී පී කො. 6996 පිඹුරට අනුව හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි එකයි හතරයි නවයක් (හෙ. 0.4149) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1130/70 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

10-1101

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඒ. අබේසූරිය සහ එම්. එම්. එම්. කුරේ.
ගිණුම් අංක : 1079 5319 4814.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2005 නොවැම්බර් 21 දාතම හා අංක 1797 හා 2007 අප්‍රේල් 03 දාතම හා අංක 2000 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුෂා අබේසූරිය සහ මන්න මරක්කලගේ මහීපාල කුරේ යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී අනුෂා අබේසූරිය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර අංක 1797 සහ 2000 ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස්හතර ලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය විසිතුනයි ශත විසි දෙකක (රු. 34,78,723.22) මුදලක් 2009 අගෝස්තු මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්හතර ලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය විසිතුනයි ශත විසිදෙකක (රු. 34,78,723.22) මුදල ද, 2009 අගෝස්තු මස 08 වැනි දින සිට අංක 1797 සහ 2000 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිහත් ලක්ෂ හයදහස් එකසිය පනස් තුනයි ශත අනූනමයක (රු. 27,06,153.99) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් හාරලක්ෂ හැත්තෑ අට දහස් හැත්තෑ නමයයි ශත අනූපහක (රු. 4,78,079.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අය කර ගැනීම සඳහා අංක 1797 සහ 2000 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණ කළුතර තොටමුණේ, බේරුවල බැද්ද තුළ බේරුවල පිහිටි "බේරුවල ඇල ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. පී. ද සිල්වා යන අය විසින් සාදන ලද 1999 මාර්තු 10 දාතම හා අංක 841 බී දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට ලොට් 7 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 12 (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම) නැගෙනහිරට : ලොට් 12 (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම) දකුණට: ලොට් 10 සහ බස්නාහිරට : ලොට් 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 841 බී ට අනුව වෙළුම/පත්‍රිරුව එච්. 294/222 හි කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 841 බී හි ලොට් 12 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග වෙළුම/පත්‍රිරුව එච් 213/280 හි කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 841 බී හි නව කංකානම්ගොඩ පාර යාබදව දක්වා ඇති එම ඉඩමේ කොටසක් මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-1074/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.